5. **ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) අම්පාර දිස්ත්‍රික්කයේ, සවලකඩේ සිට නාවිදන්වෙලි හරහා අන්නමලේ දක්වා වූ ප්‍රධාන මාර්ගය අලුත්වැඩියා කර දෙන ලෙස එම ප්‍රදේශයේ සමාජ සංවිධාන විසින් රජයෙන් ඉල්ලා ඇති බවත්;

(ii) මෙම මාර්ගයේ කල්මුනේ සිට මණ්ඩූර් දක්වා වූ බස් සේවාවක් ක්‍රියාත්මක වන අතර මෙය පඩුවන්කරේ ප්‍රදේශය දක්වා දිවෙන ප්‍රධාන මාර්ගවලින් එකක් වන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) නාවිදන්වෙලි ප්‍රාදේශීය සභාව, අන්නමලේ මහා විද්‍යාලය, ශ්‍රී ශක්ති විද්‍යාලය, ශ්‍රී ෂන්මුග විද්‍යාලය යනාදියට ප්‍රවේශ විය හැකි එම මාර්ගයේ වැදගත්කම සලකා වහාම එය පිළිසකර කර දීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

துறைமுகங்கள், நெடுஞ்சாலைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) அம்பாறை மாவட்டத்தில் சவளக்கடை தொடக்கம் நாவிதன்வெளி ஊடாக அன்னமலை வரையிலான பிரதான வீதியை திருத்தும்படி இப்பிரதேச சமூக அமைப்புகள் அரசாங்கத்தைக் கோரியுள்ளன வென்பதையும்,

(ii) இவ்வீதியில் கல்முனை தொடக்கம் மண்டூர் வரை பஸ் சேவையொன்று நடைபெறுவதுடன் இது படுவான்கரை பிரதேசம் வரை செல்லும் பிரதான வீதிகளில் ஒன்றென்பதையும்

அவர் அறிவாரா?

(ஆ) நாவிதன்வெளி பிரதேச சபை, அன்னமலை மகா வித்தியாலயம், ஸ்ரீ சக்தி வித்தியாலயம், ஸ்ரீ சண்முக வித்தியாலயம் ஆகியவற்றுக்கு பிரவேசிக்கக்கூடிய இவ் வீதியின் முக்கியத்துவம் கருதி உடனடியாக திருத்து வதற்கு அவர் நடவடிக்கை மேற்கொள்வாரா என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Ports and Highways :

(a) Is he aware that-

(i) a request has been made to the Government by social service organizations of the area for the renovation of the main road from Sawalakade to Annamale via Navinthanweli in the Ampara District; and

(ii) a bus service from Kalmunai to Mandur is operated along this road and that this is one of the main roads leading to the Panduwankare area?

(b) Will he inform this House whether action will be taken to renovate this road taking into account its importance as an access road to the Navinthaweli Pradeshiya Sabha, Annamale Maha Vidyalaya, Sri Shakthi Vidyalaya, Sri Shanmuga Vidyalaya?

(c) If not, why?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, වරාය හා මහාමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

***සභාමේසය මත තබන ලද පිළිතුර:**
*சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :
*Answer tabled:*

(අ) (i) අදාළ නොවේ.
(ii) අදාළ නොවේ.

(ආ) අදාළ නොවේ.

(ඇ) සවලකඩේ සිට නාවිදන්වෙලි හරහා අන්නමලේ දක්වා වූ ප්‍රධාන මාර්ගය ග්‍රාමීය මාර්ගයක් වන අතර එය නාවිදන්වෙලි ප්‍රාදේශීය සභාවට අයත් මාර්ගයක් වේ. එහි දිග කිලෝමීටර් 5ක් පමණ වේ.

පළමු කිලෝමීටර් 3 මැතකදී ගල් අතුරා තාර දමා තිබෙන බව පෙනෙන්නට ඇති නමුත්, අද වන විට පාදකයේ දුර්වලතා ඇති ස්ථාන බොහොමයක් වර්ධනය වී ඇත. කිලෝමීටර් 2ක් පමණ වන මාර්ගයේ ඉතිරි කොටස බොරලු සහිත මාර්ගයකි.

මෙම මාර්ගය පුනරුත්ථාපනය කිරීමට දළ ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් මිලියන 175ක් (රුපියල් මිලියන එකසිය හැත්තෑ පහක්) පමණ වේ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 6-0851/'10-(1), ගරු රවි කරුණානායක මහතා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, මම එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, සමුපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මාසයක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## වයඹ පළාතේ රජයේ රෝහල්වල සේවකයන්: අතිකාල දීමනා
## வடமேல் மாகாண அரச வைத்தியசாலை ஊழியர்கள்: மேலதிக நேரக்கொடுப்பனவு
## EMPLOYEES OF GOVERNMENT HOSPITALS IN NORTH-WESTERN PROVINCE: OVERTIME

1001/’10

7. **ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) වයඹ පළාතේ රජයේ රෝහල්වල සේවය කරන හෙද නිලධාරින් සහ ඊට පහළ තනතුරුවල ස්ථිර සේවයේ නියුතු සේවක සංඛ්‍යාව;

(ii) ඔවුන් වෙනුවෙන් මාසිකව වැටුප් ලෙස ගෙවනු ලබන මුදල;

(iii) අතිකාල දීමනා ලෙස ගෙවනු ලබන මුදල;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද ?

(ආ) (i) වර්ෂ 2010 නොවැම්බර් මාසයේ වැටුප සමඟ ඔක්තෝබර් මාසය වෙනුවෙන් ඔවුන්ට ගෙවනු ලබන අතිකාල දීමනා නොගෙවූ බවත්;

(ii) එවැනි තත්ත්වයක් යටතේ සේවකයින්ට තම වේතනය මාසිකව කළමනාකරණය කර ගැනීමේ දී ගැටලු ඇති වන බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) (i) එලෙස අතිකාල දීමනා ගෙවීම ප්‍රමාද වීමට හේතු වූ කරුණු කවරේද;

(ii) එම තත්ත්වය විසඳීම සඳහා කටයුතු කරන්නේද;

(iii) ඒ සඳහා ගත වන කාලය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

சுகாதார அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) வடமேல் மாகாண அரச வைத்தியசாலைகளில் பணி புரியும் தாதிமார்கள் மற்றும் அதற்குக் கீழுள்ள பதவிகளில் நிரந்தர சேவையில் ஈடுபட்டுள்ள ஊழியர்களின் எண்ணிக்கை யாதென்பதையும்;

(ii) இவர்களுக்கு மாதாந்தச் சம்பளமாக வழங்கப்படும் தொகை யாதென்பதையும்;

(iii) மேலதிக நேரக் கொடுப்பனவாக வழங்கப்படும் தொகை எவ்வளவென்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) 2010 நவம்பர் மாதச் சம்பளத்துடன் ஒக்ரோபர் மாதத்துக்காக அவர்களுக்கு வழங்கப்படும் மேலதிக நேரக் கொடுப்பனவு வழங்கப்படவில்லை என்பதையும்;

(ii) இவ்வாறான நிலைமையின் கீழ் ஊழியர்களுக்கு தமது வேதனத்தை மாதாந்தம் முகாமை செய்வதில் சிக்கல் ஏற்படுகின்றதென்பதையும்

அவர் அறிவாரா?

(இ) (i) இவ்வாறு மேலதிக நேரக்கொடுப்பனவு வழங்கல் தாமதமாவதற்கான காரணங்கள் யாவை என்பதையும்;

(ii) இந் நிலைமையை நிவர்த்தி செய்ய நடவடிக்கை மேற்கொள்வாரா என்பதையும்;

(iii) இதற்காகத் தேவைப்படும் காலம் எவ்வளவு என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Health :

(a) Will he inform this House of -

(i) the number of nursing officers and employees of lower posts in the permanent cadre serving in government hospitals in the North-Western Province;

[ගරු දයාසිරි ජයසේකර මහතා]

(ii) the amount of money paid to them monthly as salaries; and

(iii) the amount of money paid as overtime ?

(b ) Is he aware that -

(i) the overtime allowance for the month of October paid with the salary for the month of November has not been paid; and

(ii) under such circumstances, employees face problems in managing their wage monthly ?

(c) Will he state -

(i) the reason for such delay in the payment of the overtime allowance;

(ii) whether action will be taken to resolve the issue; and

(iii) the period of time to be taken for this purpose ?

(d) If not, why ?

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ගරු කථානායකතුමනි, සෞඛ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) (i) 5,878කි. (හෙද නිලධාරින් 1,408යි. අනෙකුත් පහළ තනතුරුවල සේවකයන් 4,470යි)

(ii) රුපියල් 106,927,901.00කි. (රුපියල් මිලියන 106.9ක් පමණ)

(iii) රුපියල් 40,812,379.00කි. (රුපියල් මිලියන 40.8ක් පමණ)

(ආ) (i) හා (ii) මාසික වේතනය නියමිත පරිදි ගෙවා ඇති බැවින් කළමනාකරණය කර ගැනීමේ ගැටලු ඇති නොවේ.

(ඇ) (i) 2010 වසර සඳහා වෙන් කළ ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම.

(ii) දැනටමත් කටයුතු කර ඇත.

(iii) 2010 වසරේ හිඟ අතිකාල දැනටමත් ගෙවා අවසන් කර ඇත.

(ඈ) පැන නොනඟී.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, මම අහලා තිබෙන්නේ 2010 ඔක්තෝබර් මාසය වෙනුවෙන් අතිකාල දීමනා නොගෙවීම ගැනයි.

මේ වනතුරු මේක ගෙවලා නැහැ. ගෙවන්න කටයුතු කරමින් ඉන්නවා කියලා තමයි හැමදාම කියන්නේ. මා අහන්නේ 2010 නොවැම්බර් මාසයේ වැටුපත්, ඒ අතිකාල දීමනාත් කවදාද ඔබතුමා ගෙවන්නේ කියලායි. මට හරියට දිනයක් කියන්න.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
2010 අතිකාල දීමනා සහ වැටුප් සියල්ල ගෙවලා තිබෙන්නේ. කිසිදු හිඟයක් නැහැ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මා කියන්නේ තවම මෙය ගෙවලා නැහැ කියලායි.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ගෙවලා තිබෙන්නේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඔබතුමාට වැරදි තොරතුරුයි දීලා තිබෙන්නේ.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
නැහැ,නැහැ. වැරදි තොරතුරු නොවෙයි. ගෙවලායි තිබෙන්නේ. පළාත් අමාත්‍යාංශයෙනුයි අප මේ තොරතුරු ගෙන්වා ගත්තේ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු නියෝජ්‍ය ඇමතිතුමා පිළිතුරක් දුන්නා නේ. බලමු.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, ගෙවලා තිබෙනවාය කිව්වාට හම්බ වෙලා නැහැ.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ගෙවලා තිබෙනවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මේක හරියට කේපීගේ රත්තරන් ටික තවම මඟ එනවා කිව්වා වගේ කථාවක්.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
අතිකාල දීමනා මෙච්චර ප්‍රමාද වුණා නම් හෙදියෝ නිකම් ඉන්නේත් නැහැ. වැඩ වර්ජනය කරනවා. ඒ සියල්ල ගෙවනවා. පළාත් සභාව යටතේ ඒ වගකීම ඉටු කරලා තිබෙනවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඇයි අර කේපීගේ රත්තරනුත් තවම බාර දෙමින් පවතිනවා කියලා කිව්වා නේ. ඒ වාගේ තමයි මේකත්.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, සමහර වෙලාවට ඔබතුමාට තොරතුරු දුන්නාට පස්සේ ගෙවලා ඇති.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. සෞඛ්‍යය සම්බන්ධවම නිසයි මම අහන්නේ. මා අර කලින් ප්‍රශ්නයෙන් ඇහුව ආකාරයට එන්නත් සම්බන්ධව අද ඇති වෙලා තිබෙන තත්ත්වය ගැන බැලුවාම බාල වර්ගයේ එන්නත්, එහෙම නැත්නම් බාල වර්ගයේ ඖෂධ අර සමාගම්වලින්ම ඒ ස්ථානවලට යවා තිබෙනවාය කියන ආරංචිය තමයි තිබෙන්නේ ගරු කථානායකතුමනි. ඔය තහනම් කරලා තිබෙන -හඳුනා ගෙන තිබෙන- සමාගම් 74 මඟින් මේ එන්නත් කිසිවක් යවලා නැහැයි කියා ඔබතුමාට ස්ථිරව කියන්න පුළුවන්ද ගරු නියෝජ්‍ය ඇමතිතුමනි?

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
එය මේ පිළිතුරෙන් පැන නඟින ප්‍රශ්නයක් නොවෙයි.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ගරු කථානායකතුමනි, අපි එය සොයා බලා ඒ සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කරන්නම්. මොකද, මේ ප්‍රශ්නයට ඒක අදාළ නැහැ. නමුත් සොයා බලා අවශ්‍ය තොරතුරු ඉදිරියේදී ලබා දෙන්නම්.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මට නිකම් දැන ගන්නයි ඕනෑ වුණේ. ආපසු රුබෙල්ලා එන්නත විදලා එක්කෙනෙක්හරි මැරුණොතින් එහෙම?

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ගරු කථානායකතුමනි, මේවා ගැන වග කීමෙන් කථා කරන්න ඕනෑ. මොකද, අද අපේ රටේ සෞඛ්‍ය අමාත්‍යාංශය, සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ප්‍රතිශක්තිකරණ කටයුතු ඉතාම ඉහළ තත්ත්වයකින් කර ගෙන යනවා. ඒ නිසා මේක හැල්ලුවට ලක් කරන්න එපා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 10-1449/'11- (1), ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, තැපැල් සේවා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මාසයක් කල් ඉල්ලනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 11-0852/'10-(1), ගරු රවි කරුණානායක මහතා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒ ප්‍රශ්නය මම අහනවා. උත්තරයක් ලැබේවිද ගරු කථානායකතුමනි.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
"ඉවසන දනා රුපු යුදයට ජය කොඩිය" පොඩ්ඩක් ඉවසන්න. උත්තරය දෙන්නේ මේ පැත්තෙන්. ඔය පැත්තෙන් නොවෙයි. උත්තරය දෙනවා. අහ ගන්න.

## 2018 පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උත්සවය: විස්තර
## 2018 பொதுநலவாய நாடுகளுக்கான விளையாட்டுப் போட்டி: விபரம்
## COMMONWEALTH GAMES IN 2018: DETAILS

0852/'10

11. **ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) ශ්‍රී ලංකාව 2018 වර්ෂයේ පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උත්සවය සඳහා සත්කාරක රට ලෙස ක්‍රියා කිරීමට උත්සාහ කරන්නේද;

(ii) එසේ නම්, එම කාර්යය සඳහා සකස් කර ඇති සැලැස්ම කවරේද;

(iii) එම ක්‍රීඩා උත්සවය සඳහා සත්කාරක රට ලෙස ක්‍රියා කිරීමට අයදුම් කිරීමේදී අනුමතිය ලැබීම සඳහා වන මූලික වියදම කොපමණද;

(iv) මෙම කාර්යය සඳහා මූලික වී කටයුතු කරන පුද්ගලයාගේ නම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම ක්‍රීඩා උත්සවය සඳහා සත්කාරක රට ලෙස ක්‍රියා කිරීමේ අවස්ථාව ශ්‍රී ලංකාවට පිරිනමනු ලැබුවහොත්, එම උත්සවය පැවැත්වීමට අපේක්ෂා කරන දිස්ත්‍රික්කයේ සහ නගරයේ නම් කවරේද;

(ii) ඒ සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම සඳහා දැරිය යුතු ආයෝජන පිරිවැය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද ?

(ඇ) (i) සත්කාරක රට තෝරා ගැනීමට නාමයෝජනා කැඳවූ විට ශ්‍රී ලංකාවේ නම යෝජනා කරන සහ ස්ථිර කරන රටවල නම් කවරේද;

(ii) ශ්‍රී ලංකාව හැරුණු විට 2018 පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උත්සවයේ සත්කාරක රට ලෙස ක්‍රියා කිරීමට තරග කරන අනෙකුත් රටවල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

[ගරු රවි කරුණානායක මහතා]

விளையாட்டுத்துறை அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2018 இல் பொதுநலவாய நாடுகளுக்கான விளை யாட்டுப் போட்டியை நடத்துவதற்கான முயற்சியில் இலங்கை ஈடுபட்டுள்ளதா என்ப தையும்;

(ii) ஆம் எனில் இந்நோக்கத்திற்காக மேற்கொள்ளப் பட்டுள்ள திட்டங்களையும்;

(iii) இவ் விளையாட்டுப் போட்டியை நடத்துவதற்கு விண்ணப்பிப்பதற்கான ஆரம்ப ஒப்புதல் செலவு எவ்வளவு என்பதையும்;

(iv) இவ் விடயம் தொடர்பில் பிரதான வகிபாகத்தை வகிப்பவர் யார் என்பதையும்

அவர் தெரிவிப்பாரா?

(ஆ) (i) இவ் விளையாட்டுப் போட்டியை நடத்துவதற்கான வாய்ப்பு இலங்கைக்கு வழங்கப்படும் பட்சத்தில் மேற்படி விளையாட்டுப் போட்டிகளை நடாத்த எதிர்பார்க்கப்படும் மாவட்டத்தையும் நகரத்தையும்;

(ii) அதற்கான உட்கட்டமைப்பு வசதிகள் தொடர்பி லான மொத்த முதலீட்டுச் செலவு எவ்வளவு என்பதையும்

அவர் தெரிவிப்பாரா?

(இ) (i) இது தொடர்பிலான வேட்பு மனுக்கள் கோரப்படும் பொழுது இலங்கையின் வேட்பு மனுவை முன்மொழிகின்ற, வழிமொழிகின்ற நாடுகள் எவை என்பதையும்;

(ii) இலங்கையைத் தவிர 2018 இல் பொதுநலவாய விளையாட்டுப் போட்டிகளை நடத்துவதற்காக போட்டியிடுகின்ற ஏனைய நாடுகள் எவை என்பதையும்

அவர் இச்சபையில் தெரிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Sports:

(a) Will he state-

(i) whether Sri Lanka is trying to host the Commonwealth Games in 2018;

(ii) if so, the plan that have been done for the purpose;

(iii) the initial approval cost of applying for hosting the games; and

(iv) the person who takes the leading role on this matter?

(b) Will he also state-

(i) the district and the city at which the aforesaid games are expected to be held, if the opportunity for hosting the game is awarded to Sri Lanka; and

(ii) the total cost of investment for infrastructure ?

(c) Will he inform this House-

(i) the countries that are going to propose and second the Sri Lankan nomination when the nominations are called; and

(ii) the competing countries trying to host the games in 2018 beside Sri Lanka?

(d) If not, why?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, ක්‍රීඩා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) ඔව්.

(ii) සත් අවුරුදු ක්‍රමෝපායන සැලැස්මක් සකස් කර ඇත.

(iii) දැනට රජයෙන් මිලියන 110ක් ලබා දී ඇත.

(iv) පුද්ගලයෙක් නැත.

(ආ) (i) හම්බන්තොට දිස්ත්‍රික්කය, හම්බන්තොට නගරය අවට.

(ii) සත්කාරකත්වයට අවස්ථාව ලැබුණොත් අදාළ පිරිවැය සැලසුම් සකස් කිරීමට කටයුතු යොදා ඇත.

(ඇ) (i) පැන නොනඟී.

(ii) ඕස්ට්‍රේලියාව.

(ඈ) පැන නොනඟී.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු ඇමතිතුමනි, ප්‍රශ්නයේ (ආ) (i) කොටසෙන් අසා තිබෙන සම්පූර්ණ වියදම කොපමණද?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ප්‍රශ්නයේ (ආ) (ii) කොටසින් අසා තිබෙන්නේ ඒ සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම සඳහා දැරිය යුතු ආයෝජන පිරිවැය කොපමණද කියායි."සත්කාරත්වයට අවස්ථාව ලැබුණොත් අදාළ පිරිවැය සැලසුම් සකස් කිරීමට කටයුතු යොදා ඇත." යන්න එයට පිළිතුරයි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

සම්පූර්ණ වියදම කොපමණද කියායි මා අසා තිබෙන්නේ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ඒක ලැබුණාම සැලසුම් කරලා කටයුතු කරනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ඒක ලැබෙන්නේ නැහැ කියන ප්‍රාර්ථනාවෙන් තමයි කටයුතු කරන්නේ කියන එකද?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ලැබෙන්නේ නැහැ නොවෙයි. ඇයි තමුන්නාන්සේලා මේ රටට මේ අවස්ථාව ලැබෙනවාට ඔච්චර අකැමැති? කල්පනා කරලා බලන්න, තමුන්නාන්සේ මේ රටේ ජාතික පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයෙක්. මච්චිමට මේක ලැබෙනවාට අකැමැතිද?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
උත්තර දුන්නායින් පසුව අපි කියන්නම්කෝ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මගේ උත්තරය ඒකයි. තමුන්නාන්සේලා මේකට අකැමැතිද? වියදමක් කොහොමත් එනවා. මොනවා කළත් වියදමක් එනවා. වියදමක් නැතිව ලෝකයේ කොහේවත් මෙවැනි රාජ්‍ය උත්සව පැවැත්වෙන්නේ නැහැ. පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙල පොදු රාජ්‍ය මණ්ඩලයට අයත් ලෝකයේ හැම රටකම තිබෙනවා. ඒ අවස්ථාව ලැබුණොත් මේ සැලසුම ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන ලබා දීමයි කෙරෙන්නේ. දැනට ඊට අවශ්‍ය ප්‍රතිපාදන නිකුත් කරලා නැහැ, ගරු කථානායකතුමනි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, මම අහපු ප්‍රශ්නයට උත්තර ලැබෙන්නේ නැහැ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
උත්තරය දුන්නා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
නමුත් අප අහන්නේ මෙයයි. ගරු කථානායකතුමනි, ඔබතුමාගේ දිස්ත්‍රික්කයේ මේ මෑතකදී Cricket World Cup එකේ එක තරගයක් තිබුණා. Sooriyawewa International Cricket Stadium එක හදන්න මිලියන-

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඒක මේකට අදාළ නැහැ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු ඇමතිතුමනි, පොඩ්ඩක් ඉන්න. මමයි ප්‍රශ්නය අහන්නේ. ඔබතුමාට කෑ ගහන්න පුළුවන් නේ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
අදාළ නැහැ. ඔබතුමා මම අහපු ප්‍රශ්නයට උත්තරය දෙන්නේ නැහැ නේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඉතින් මට උත්තර දෙනකොට කෑ ගහන්න පුළුවන්.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙල ලංකාවේ පවත්වනවාට ඔබතුමා කැමතිද, නැද්ද? කෙළින් කියන්න, ඔව්ද, නැද්ද කියලා? එක්සත් ජාතික පක්ෂයේ නායකතුමාගෙන් මම ඇහුවොත්, එතුමා කියයි "කැමැතියි" කියලා. ඔබතුමාට ඒ උත්තරය දෙන්න බැහැ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
හරි, හරි.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, බටහිර ලෝකය camp කර ගෙන ඉන්නවා නේ. එහෙම camp කර ගෙන ඉන්නවා වාගේ ඉන්න කියලා කියන්නද මේ එන අයට? ඒකද ඔබතුමා කියන්නේ?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අනේ, බලන්න මේ සිංහ පැටියාගේ උත්තරේ!

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
සත්කාරය හොඳින් හදලා දෙන්න ඕනෑ අපි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, මගේ පළමුවෙනි අතුරු ප්‍රශ්නය මේකයි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දැන් මොනවාද ඔබතුමා මෙච්චර වෙලා ඇහුවේ?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
නැහැ ඉතින් මට පළමුවෙනි අතුරු ප්‍රශ්නය අහන්න දුන්නේ නැහැ නේ ගරු කථානායකතුමනි. මේක ඔබතුමාගේ දිස්ත්‍රික්කයට මම කරන උදව්වක්.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දැන් එහෙම නම් තුන්වැනි අතුරු ප්‍රශ්නය අහන්න බලන්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
නැහැ, මේක මගේ පළමුවෙනි අතුරු ප්‍රශ්නය ගරු කථානායකතුමනි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
නැහැ මම මෙතැන-

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මට කියන්න මොකක්ද අහපු පළමුවෙනි ප්‍රශ්නය කියලා? මම පළමුවෙනි අතුරු ප්‍රශ්නය වශයෙන් ඇහුවේ-

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
තමුන්නාන්සේ ඕක අහන්නේ නැත්නම් මම මීට පස්සේ මෙතැන ඔය අනන්මනන් කථා කරන්න දෙන්නෙත් නැහැ. හරියට ප්‍රශ්නය අහන්න කෙටියෙන්. දැන් අතුරු ප්‍රශ්න තුනක් ඇහුවා. එහෙනම් අපි දෙකයි කියලා හිතා ගෙන තව එකක් අහමු.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
එහෙමත් දෙයක් තිබෙනවාද?

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දැන් කොච්චර වෙලා ඉඳලාද අහන්නේ?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
නැහැ, ඉතින් අහන්න කිව්වාට අහන්න දෙනවා යැ? අර වෙනින් එකකටයි උත්තර දුන්නේ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඔබතුමා අහන්න, උත්තර දෙනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
අතුරු ප්‍රශ්න අහන ක්‍රමයක් තිබෙනවා. ඒක ස්ථාවර නියෝගවල පැහැදිලිව තිබෙනවා. තමුන්නාන්සේට-

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, මම බොහොම බැගෑපත්ව ඉල්ලන්නේ. මම ප්‍රශ්නය අහනවා වාගේම ඇමතිවරුන්ට උත්තර දෙන්න තිබෙනවා, අහන ප්‍රශ්නයට. මෙතැන කැමතිද, නැද්ද කියන ප්‍රශ්නය නොවෙයි තිබෙන්නේ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
උත්තර දීලා තිබෙනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්නය ඇහුවාම උත්තරයක් දුන්නා. [බාධා කිරීමක්]

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මම අහන්නේ මම නියෝජනය කරන කොළඹ දිස්ත්‍රික්කය සහ සමස්ත රට වෙනුවෙන්. සූරියවැව ක්‍රිකට් ක්‍රීඩා භූමිය හදන්න මිලියන 1,200ක් කියලා දැන් ඒක 4,800ක් වෙලා අද ගෙවන්නේ නැතිව තිබෙනවා. සාමාන්‍යයෙන් Commonwealth Game එකක් ඇති කරන්න, ඉන්දියාවේ තිබුණා මීට අවුරුද්දකට ඉස්සර වෙලා. ඒකට යූඑස් ඩොලර් බිලියන 5.8ක් වියදම් කළා. රුපියල් 2,500කින් පඩි වැඩි කරන්න බැහැය කියන ආණ්ඩුව 2018 දී කොහොමද බිලියන 7,500ක් විතර වියදම් කරන්නේ? ඒකයි අප ඇහුවේ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි. ඊ ළඟ ප්‍රශ්නයට යනවා. ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒකයි අපි ඇහුවේ. මේ ගණන ඔබතුමන්ලා ගෙවනවා නම් ප්‍රශ්නයක් නැහැ. අහිංසක ජනතාවට තඹ සතයක්වත් දෙනවා නම් අපි හරි කැමැතියි.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
යන්නේ කොහේද මල්ලේ පොල්.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔව්. ඉතින් අපි මල්ලේ පොල් නේ. පොල් ටිකත් අද ගේන්නෙ පිට රටින්.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
අනිද්දාට ඡන්ද ඉවර වුණාම තේරෙයි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අපි කථා කරන්නේ මල්ලෙ පොල් ලු.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මහජනතාව දෙන තීරණය තේරෙයි අනිද්දාට.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔව්, ඔව්. අපට තේරෙයි තමයි. උත්තර දෙන්න කෝ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
රටට යමක් ලැබෙනවාට විරුද්ධ වන්න එපා ගරු මන්ත්‍රීතුමනි. මම ඔබතුමාට දෙන එකම උපදෙස-

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අනේ අහිංසක ජනතාවගේ සල්ලි ගන්න එක ගැන-

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මම මේ පාර්ලිමේන්තුවේ අවුරුදු 27ක් හිටියා. රටට යමක් ලැබෙන දේට-

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
බාල ඉන්ධන ගෙනල්ලා. ඔබතුමන්ලාගේ සාක්කුවලින් නොවෙයි යන්නේ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, නොබැඳි සමුළුව තිබුණා. මේ අය මොකක්ද එදා කළේ? විරුද්ධ වුණා; හෙළා දැක්කා; මැතිනිට බැන්නා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඊට පස්සේ 1977 දී තුනෙන් දෙකක බලයක් සහිතව එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව ආවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
නොබැඳි සමුළුවෙන් මේ ලංකාවට ලැබුණු මහා කීර්ති නාමයෙන් තමයි මේ ගොල්ලනුත් ඔක්සිජන් ගහ ගෙන ගියේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
තුනෙන් දෙකක බලයක් ආවා. [බාධා කිරීම්]

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
නැහැ, නැහැ. තමුන්නාන්සේලාගේ මනස වෙනස් කර ගන්න. තමුන්නාන්සේලාගේ ආකල්පය වෙනස් කර ගන්න. [බාධා කිරීම්] රටට විරුද්ධ වන්න එපා. පුද්ගලයන්ට විරුද්ධ වන්න. රටට විරුද්ධ වන්න එපා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
රටේ ආදායමෙන් භාගයක් මේකට වියදම් කරන එක තමයි ප්‍රශ්නය තිබෙන්නේ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි. ඒකත් ප්‍රශ්නයක්. අතුරු ප්‍රශ්න තුනම ඉවරයි. [බාධා කිරීම්]

ප්‍රශ්න අංක 12. ගරු දයාසිරි ජයසේකර මහතා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, ඒක ප්‍රශ්නයක් විධියට කියනවා නම් මම කියන්නම්. රටේ ආදායමෙන් භාගයක් -කෝටි 40,000ක්- වියදම් කරලා පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙල පවත්වන්න හදන එකයි අපට තිබෙන ප්‍රශ්නය.

## මානව හිමිකම් කඩවීම්: පැමිණිලි
### மனித உரிமை மீறல்கள்: முறைப்பாடுகள்
### VIOLATION OF HUMAN RIGHTS: COMPLAINTS

1002/'10

12. **ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) 2009 වර්ෂයේ සිට මේ දක්වා මානව හිමිකම් කඩවීම් සම්බන්ධයෙන් ලැබී ඇති පැමිණිලි සංඛ්‍යාව කොපමණද;
(ii) ඒවා අතරින් විසඳුම් ලබා දී ඇති පැමිණිලි සංඛ්‍යාව කොපමණද;
(iii) විසඳුම් ලබා දීමට ඇති පැමිණිලි සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) මානව හිමිකම් කඩ කිරීම සම්බන්ධයෙන් පැමිණිලි ලැබී ඇති ආයතන කවරේද;
(ii) එම එක් එක් ආයතනය සම්බන්ධයෙන් ලැබී ඇති පැමිණිලි සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;
(iii) ඒ අනුව වැඩිම චෝදනා සංඛ්‍යාවක් එල්ල වී ඇති ආයතනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் பௌத்த சாசன, மத அலுவல்கள் அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) 2009 ஆம் ஆண்டு முதல் இற்றை வரை மனித உரிமை மீறல்கள் சம்பந்தமாகக் கிடைக்கப் பெற்றுள்ள முறைப்பாடுகளின் எண்ணிக்கை யாதென்பதையும்;
(ii) இவற்றில் தீர்வுகள் வழங்கப்பட்டுள்ள முறைப்பாடுகளின் எண்ணிக்கை யாதென்பதையும்;
(iii) தீர்வுகள் வழங்கப்படவுள்ள முறைப்பாடுகளின் எண்ணிக்கை யாதென்பதையும்;

அவர் இச்சபைக்கு சமர்ப்பிப்பாரா?

(ஆ) (i) மனித உரிமை மீறல்கள் சம்பந்தமாக முறைப்பாடுகள் கிடைத்துள்ள நிறுவனங்கள் யாவையென்பதையும்;
(ii) மேற்படி ஒவ்வொரு நிறுவனம் சம்பந்தமாகவும் கிடைக்கப்பெற்றுள்ள முறைப்பாடுகளின் எண்ணிக்கை தனித் தனியாக எவ்வளவென்பதையும்;
(iii) அதன் பிரகாரம் ஆகக் கூடிய குற்றச்சாட்டுகள் சுமத்தப்பட்டுள்ள நிறுவனம் யாதென்பதையும்

அவர்குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

[ගරු දයාසිරි ජයසේකර මහතා]

asked the Prime Minister and Minister of Buddha Sasana and Religious Affairs:

(a) Will he submit to this House-

(i) the number of complaints received with regard to human rights violations from the year 2009 up to now ;

(ii) the number of complaints for which solutions have been provided, out of those complaints ; and

(iii) the number of complaints for which solutions are to be provided ?

(b) Will he state -

(i) the institutions against which complaints regarding human rights violations have been received ;

(ii) separately, the number of complaints received against each of those institutions ; and

(iii) accordingly, the institution against which the highest number of complaints have been lodged?

(c) If not, why ?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා. ගරු කථානායකතුමනි, එහි දීර්ඝ විස්තරයක් තිබෙනවා. එම නිසා මම එම ප්‍රශ්නයට අදාළ පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i)

| **වර්ෂය** | **පැමිණිලි සංඛ්‍යාව** |
|---|---|
| 2009 | 5,454 |
| 2010 | 4,205 |
| 2011 ජුනි දක්වා | 2,073 |
| **එකතුව** | 11,732 |

(ii) 2,329

අනෙකුත් පැමිණිලි අවසන් වී ඇති ආකාරය

| | | | |
|---|---|---|---|
| 1. | වෙනත් ආයතනවලට යොමු කිරීම | - | 995 |
| 2. | මූලික අයිතිවාසිකම් කඩවීමක් ආවරණය නොවීම මත | - | 3,319 |
| 3. | පැමිණිලිකරුගේ උනන්දු වීමක් නොවීම මත | - | 2,600 |
| 4. | පැමිණිල්ල ඉල්ලා අස් කර ගැනීම මත | - | 417 |
| 5. | උසාවියේ නඩුවක් විභාග වීම මත | - | 557 |
| 6. | මානව හිමිකම් කොමිෂන් සභා විෂය පථයට අයත් නොවීම මත | - | 1,441 |
| 7. | කාලය ඉකුත් ව ඉදිරිපත් වීම මත | - | 301 |

(iii) ඔව්, 2,038

(ආ) (i) 1. පොලිස් දෙපාර්තමේන්තුව

2. අධ්‍යාපන දෙපාර්තමේන්තුව

3. ත්‍රිවිධ හමුදාව (යුධ/ නාවුක/ ගුවන්)

4. විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව

5. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ විශ්වවිද්‍යාලය

6. රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය

(වැඩිම පැමිණිලි සංඛ්‍යාවක් ලැබී ඇති ආයතන පමණක් සඳහන් කර ඇත.)

(ii)

| | | | |
|---|---|---|---|
| 1. | පොලිස් දෙපාර්තමේන්තුව | - | 2,691 |
| 2. | අධ්‍යාපන දෙපාර්තමේන්තුව | - | 253 |
| 3. | හමුදාව (යුධ/නාවුක/ගුවන්) | - | 176 |
| 4. | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව | - | 90 |
| 5. | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ විශ්වවිද්‍යාල | - | 83 |
| 6. | රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය | - | 65 |

(iii) ඔව්,
පොලිස් දෙපාර්තමේන්තුව

(ඇ) අදාළ නොවේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගොඩක් තිබෙනවා. කියවා ගෙන යන්න අමාරුයි.?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
පිටු හතරක විතර විස්තරයක් තිබෙනවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
පැමිණිලි සංඛ්‍යාව. අන්න එහෙම නිකම් කියන්න. ගොඩක් විස්තර නැතිව කියවන්නට පුළුවන් නම්, කරදරයක් නැත්නම් ඔබතුමාට. 2009 වර්ෂයේ පැමිණිලි සංඛ්‍යාව කොපමණ ද? ඕනෑ කරන්නේ ගණන.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
5,454යි.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
හරි ෂෝක්. හරි. විසඳුම් ලබා දී ඇති සංඛ්‍යාව? එහෙම කිව්වොත්.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
2,329යි.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
වැඩිම චෝදනා සංඛ්‍යාවක් එල්ල වී ඇති ආයතනය කවරේද කියා ඔබට පොඩ්ඩක් උත්තරයක් දෙන්න පුළුවන් ද?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
එහෙම අහලා නැහැනේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
අහලා තියෙනවා නේ. ඒක පොඩ්ඩක් හොරට දෙන්නේ උත්තර. කරදරයි උත්තර දුන්නාම. මාට්ටු වෙනවා නේ වැඩය.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මානව හිමිකම් කඩකිරීම් සම්බන්ධයෙන් පැමිණිලි ලැබී ඇති ආයතන-

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ආයතන ඕනෑ නැහැ. ප්‍රශ්නයේ (ආ) (iii) ට පිළිතුර? වැඩිම චෝදනා සංඛ්‍යාවක්-

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
එක් එක් ආයතන සම්බන්ධයෙන් ලැබී ඇති පැමිණිලි සංඛ්‍යාව.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
නැහැ. එහෙම නොවෙයි. (ආ) (iii) ප්‍රශ්නය. වැඩිම චෝදනා සංඛ්‍යාවක් එල්ල වී ඇති ආයතනය කවරේද? ඔන්න එතකොට තමයි උත්තරය දෙන්නේ නැතිව හැංගෙන්න හදන්නේ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඔව්. පොලිස් දෙපාර්තමේන්තුව?

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
කොච්චර ද දන්නේ නැහැ නේද ගරු ඇමතිතුමා?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඒක කියන්න හදනකොට එපාය කිව්වා නේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
නැහැ ඒක මට ඕනෑ. පොලිස්-

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
2,691යි. අධ්‍යාපන දෙපාර්තමේතුව.. කියවන්න ද ඔක්කොම?

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
නැහැ. එපා. වැඩිම සංඛ්‍යාවක් ඇති ආයතනයයි මට ඕනෑ වුණේ. මොකද එතකොට ගොඩක් වටිනවා. [බාධා කිරීමක්]

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
විශ්වවිද්‍යාලත් තිබෙනවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
නැහැ. විශ්වවිද්‍යාල නැති කරන්නනේ හදන්නේ ඔබතුමන්ලා. ගරු කථානායකතුමනි, ලංකාවේ 2009 වර්ෂයේ 5,454ක් ලැබී තිබෙන පැමිණිලිවලින් 2,691ක් ඇත්තටම පොලිසිය සම්බන්ධයෙන් ඇවිත් තිබෙන්නේ.

රටේ නීතිය ක්‍රියාත්මක කරන, රටේ මිනිස්සුන්ට නිදහසේ ජීවත් වෙන්න අවශ්‍ය මූලික නීතිය නැත්නම් rule of law ක්‍රියාත්මක කරන ආයතනයට විරුද්ධව තමයි මේ පැමිණිලි සංඛ්‍යාව ඇවිල්ලා තිබෙන්නේ. රටේ මානව හිමිකම්වලට, ප්‍රජාතන්ත්‍රවාදයට අත් වෙලා තිබෙන ඉරණම ඒකෙන් පැහැදිලි වෙනවා. පොලිසිය විසින් පෙළපාළියට වෙඩි තබලා රොෂෙන් චානක කියන අර තරුණ සහෝදරයා ඝාතනය කළා. ගරු කථානායකතුමනි, මේකට මානව හිමිකම් කොමිසමට පැමිණිල්ලක් ආවා. මේ පැමිණිල්ල විසඳනවා වෙනුවට සාකච්ඡා මාර්ගයෙන් මෙය විසඳා ගැනීම සම්බන්ධව මේ වන කොට තීන්දුවක් දීලා තිබෙනවා. ගරු කථානායකතුමනි, මේ රටේ මානව හිමිකම් කොමිෂන් සභාව මේ වාගේ ඉතාම බරපතළ ප්‍රශ්නයක්, මිනී මැරුමක් සම්බන්ධව සාකච්ඡා කරලා විසඳුමකට -සමථයකට- එන්න කියලා තීන්දුවක් දෙන්නේ කොහොමද කියන එක මම අහන්න කැමැතියි. මෙවැනි තීන්දුවක් දෙන්න මානව හිමිකම් කොමිෂන් සභාවට තිබෙන අයිතිය මොකක්ද?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, අධිකරණයට භාජනය වී තිබෙන මේ ප්‍රශ්නය -

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මානව හිමිකම් කොමිසම අධිකරණයක් නොවෙයි.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මම දෙන උත්තරය අහගන්න කෝ. අධිකරණයට භාජනය වී තිබෙන මෙම කාරණය ගැන ඔබතුමා අර්ථ නිරූපණය කරන ආකාරයෙන් පිළිතුරක් ලබා දීම මා හිතන්නේ මේ අවස්ථාවේ සුදුසු නැහැ. ඒ වාගේම ඔබතුමාට කියන්න ඕනෑ, මානව හිමිකම් කොමිෂන් සභාවේ විෂය පථයට අයත් නොවන ලිපි 1,500ක් ඇවිල්ලා තිබෙන බව. ඉතින් ඒ විධියට මේ එන පැමිණිලි අතර කොමිෂන් සභාවේ විෂය පථයට අයිති නැති ඒවාත් තිබෙනවා. එවැනි පැමිණිලි 450ක් ඉල්ලා අස් කර ගෙනත් තිබෙනවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
නැහැ, ගරු කථානායකතුමනි -

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඒවා ඒ ආකාරයෙන් සිදු වෙනවා. තමුන්නාන්සේ අහන ඔය මරණයට අදාළ සිද්ධිය අධිකරණයට භාජනය වෙලා තිබෙන දෙයක්.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි. මම අහන්නේ මානව හිමිකම් කොමිසම සම්බන්ධව. මම අධිකරණයට අදාළ කාරණයක් - [බාධා කිරීමක්] අධිකරණයට ගෙනිච්ච කාරණයක් ගැන මම කථා කළේ නැහැ. මම කථා කළේ -

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
කෙළින් හෝ වක්‍රාකාරයෙන් හෝ අධිකරණයට භාජනය වන කාරණාවක් සම්බන්ධව සාකච්ඡා කළ නොහැකියි කියලා ගරු කථානායකතුමා ඊයේ තීන්දුවක් දුන්නා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඔබතුමන්ලා හැම දාම බේරෙන්නේ ඕකෙන් නේ. ඊයේ හෙජින් එකෙන් බේරුණෙත් ඔහොම තමයි.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඊයේ ගරු කථානායකතුමා තීන්දුවක් දුන්නා. ඔබතුමාට අද ඒක වෙනස් කරන්න බැහැ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු ඇමතිතුමා, පොඩ්ඩක් ඉන්න කෝ තරහා ගන්නේ නැතිව.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඔබතුමා අහන දේ මම දන්නවා. ඒ අහන දේ මේ සභාවේ සාකච්ඡා කරන්න බැහැ. ඒකයි කියන්නේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මම කියන්නේ මේකයි. ගරු කථානායකතුමනි, මේ රොෂෙන් චානක සහෝදරයා මරලා දාලා ඔහුට රුපියල් ලක්ෂ දහයක - Rupees one million.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු මන්ත්‍රීතුමා, මේ ප්‍රශ්න අහන වේලාවේ තමන්ගේ අදහස් දක්වන්නට ඉඩ දෙන්නට බැහැ. ක්‍රමයක් තිබෙනවා. ඒ විධියට කටයුතු කරන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, තේරෙන විධියට ප්‍රශ්නය අහන්න එපායැ. නිකම් එක පාරට -

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
වැඩි විස්තර කියන කොට පිළිතුර පනිනවා. ඒ නිසා කෙටියෙන් අහන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
අඹ ගෙඩි කොපමණ සංඛ්‍යාවක් නැති වී තිබේද කියලා අහන්න බැහැ නේ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්නය කෙටියෙන්, කෙළින් අහන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, මිහිඳු මහ රහතන් වහන්සේ අහපු විධියට ප්‍රශ්න අහන්න බැහැ, මේ ගස් හැර තව අඹ ගස් තිබේද කියලා. ඒවාටත් උත්තර දෙන්නේ නැහැ නේ මේ ගොල්ලෝ. මම අහන්නේ මේකයි. රොෂෙන් චානකව මරලා දාලා ඔහුට රුපියල් ලක්ෂ දහයක වන්දියක් ගෙව්වා. ඒකට හිලවු වෙන්නද මේ මානව හිමිකම් කොමිෂන් සභාව කියන්නේ සමථකරණයට මේක භාජනය කරන්න කියලා. ඒකයි මට තිබෙන ප්‍රශ්නය. තවත් එක් කෙනෙක් මරලා දාලා රුපියල් ලක්ෂ දහයක් දීලා කියයි මේකත් සමථකරණයට ලක් කර ගන්න කියලා. ඒකයි මම අහන්නේ. මේක ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳව බරපතළ ප්‍රශ්නයක්.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඒකට වෙනම ප්‍රශ්නයක් අහන්න. ගරු කථානායකතුමනි, මම හිතනවා අධිකරණයට භාජනය වෙලා තිබෙන කාරණාවකට -

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඒක නේ, කියලාත් උත්තර දෙන්නේ නැහැ නේ. මම අහන්නේ මානව හිමිකම් කොමිසම ගැන නේ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
කොමිසම ගැන අහන්න. අතිරේක ප්‍රශ්නයක් නේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, රොෂෙන් චානක මැරුණු ගමන්ම, මහානාම තිලකරත්න මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් කමිටුවක් පත් කළා වාර්තාවක් ලබා දෙන්නය කියා. මේ කමිටුවේ වාර්තාවට දැනට මොකක්ද සිද්ධ වෙලා තිබෙන්නේ කියා ඔබතුමා කරුණාකර මට කියන්න. අඩුම තරමේ කවදාද භාර දෙන්නේ කියලා කියන්න. භාර දීලාද තිබෙන්නේ?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්නයට අදාළ දෙයක් නොවෙයි, ගරු මන්ත්‍රීතුමා අහන්නේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මානව හිමිකම්.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මානව හිමිකම් කියා රටේ ලෝකේ හැම එකම අහන්න බැහැ. ඔබතුමා අහන ප්‍රශ්නයට පිළිතුරු දෙන්න ඕනෑ නේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඒක තමයි.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ප්‍රශ්නය අහන්න. පිළිතුර දෙන්නම්.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, මෙතුමාට පිළිතුරු දෙන්න බැරි නම් මොනවා කරන්නද? මානව හිමිකම් පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා. බැන්කි මූන්ලා අපට ඇඟිල්ල දික් කරන්නේ -

## අවිධිමත් අධ්‍යාපන වැඩසටහන: ගොඩනැඟිල්ල
### முறைசாரா கல்வி நிகழ்ச்சித்திட்டம்: கட்டிடம்
### NON-FORMAL EDUCATION PROGRAMME: BUILDING

1450/'11

**15. ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මන්නාරම, මුත්තමිල් නාගරික ප්‍රදේශයේ, මන්නාරම අධ්‍යාපන කලාපයේ සහයෝගයෙන් ක්‍රියාත්මක කරනු ලබන කාන්තාවන් සඳහා වූ අවිධිමත් අධ්‍යාපන වැඩසටහන් යටතේ ආරම්භ කර ඇති ගොවිපළ කටයුතු පුහුණු කිරීමේ පාඨමාලාව පැවැත්වීම සඳහා ප්‍රදේශයේ පොදු අවශ්‍යතා සඳහා ඉදි කර දී ඇති ගොඩනැඟිල්ල ලබා නොදී එය එක් පුද්ගලයෙකුගේ පාලනය යටතේ තබා ඇති බවත්;

(ii) එබැවින් එම ප්‍රදේශයේ කාන්තාවන් එම ගොඩනැඟිල්ලේ පිටත බිම වාඩි වී හෝ එකී පාඨමාලාව හැදෑරීමේ අනිවාර්ය තත්ත්වයට පත් වී ඇති බවත්;

(iii) කාන්තාවන් සඳහා වූ අවිධිමත් අධ්‍යාපන වැඩසටහන ක්‍රියාත්මක කිරීමට එල්ල වී ඇති ඉහත බාධාකාරී තත්ත්වය මන්නාරම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ අවධානයට ද ලක් කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ඉහත පාඨමාලාව පැවැත්වීමට හැකි වන පරිදි පොදු අවශ්‍යතා සඳහා ඉදි කර ඇති ඉහත සඳහන් ගොඩනැඟිල්ල වහාම විවෘත කර දීමට පියවර ගන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பொது நிர்வாக, உள்நாட்டலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மன்னார், முத்தமிழ் நகர்ப் பகுதியில் மன்னார் கல்வி வலயத்தின் ஒத்துழைப்புடன் அமுல்படுத்தப்படு கின்ற பெண்களுக்கான முறைசாரா கல்வி நிகழ்ச்சித்திட்டத்தின்கீழ் முன்னெடுக்கப்பட்டுள்ள பண்ணை வேலைப் பயிற்சிப் பாடநெறியை நடத்தும் பொருட்டு பிரதேசத்தில் பொதுத் தேவை களுக்காக அமைக்கப்பட்டுள்ள கட்டிடத்தை வழங்காது தனி ஒருவரின் கட்டுப்பாட்டின் கீழ் வைத்திருப்பதையும்;

(ii) இதன் காரணமாக குறித்த பிரதேச பெண்கள் மேற்படி கட்டிடத்தின் வெளியே நிலத்தில் அமர்ந்தவாறேனும் அப்பாடநெறியைக் கற்க வேண்டிய கட்டாய நிலை உருவாகியுள்ளது என்பதையும்;

(iii) பெண்களுக்கான முறைசாரா கல்வி நிகழ்ச்சித் திட்டத்தை அமுல்படுத்துவதில் எழுந்துள்ள மேற்படி தடையேற்படுத்தும் நிலைமை சம்பந்தமாக மன்னார் பிரதேச செயலகத்தின் கவனத்திற்கு கொண்டு வரப்பட்டுள்ளது என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) மேற்படி பாடநெறியை நடத்தக் கூடியவாறு பொதுத் தேவைகளுக்காக அமைக்கப்பட்டுள்ள மேற்படி கட்டி டத்தை உடனடியாக திறந்து வைக்க நடவடிக்கை எடுப்பாரா என்பதை அவர் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Public Administration and Home Affairs :

(a) Is he aware that-

(i) the building constructed for public purposes in the area is kept under the custody of one person without allowing it to be used for the farming activity training programme for women launched under the non-formal education programme implemented in the Mutthamil Urban Area in Mannar in collaboration with the Mannar Education Zone;

(ii) the women have been compelled to sit outside the aforesaid building to follow the course as a result; and

(iii) the attention of the Divisional Secretary of Mannar too has been drawn to the above obstacle for the implementation of the non-formal education programme for women?

(b) Will he state whether immediate action will be taken to open the above building constructed for public purposes enabling the conduct of the aforesaid course?

(c) If not, why?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා

[ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) මන්නාරම දිස්ත්‍රික්කයේ මුස්තමිල් නමින් නාගරික ප්‍රදේශයක් නොමැත.
(ii) පැන නොනඟී.
(iii) පැන නොනඟී.

(ආ) පැන නොනඟී.

(ඇ) පැන නොනඟී.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

දෙවන වටය. ප්‍රශ්න අංක 3-1047/'10- (3), ගරු මොහමඩ් අස්ලම් මහතා.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

ගරු කථානායකතුමනි, ගරු මොහමඩ් අස්ලම් මහතා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, ගරු අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## 2011 දැයට කිරුළ ප්‍රදර්ශනය වෙනුවෙන් වැය කළ මුදල: ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍යාංශය
## 2011 "தயட்ட கிருல" கண்காட்சிச் செலவினம்: வினைத்திறன் மேம்பாட்டு அமைச்சு
## MONEY SPENT ON "DEYATA KIRULA" EXHIBITION 2011: MINISTRY OF PRODUCTIVITY PROMOTION

1223/'11

4. **ගරු අනුර දිසානායක මහතා (ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා වෙනුවට)**
(மாண்புமிகு அநுர திஸாநாயக்க- மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி சார்பாக )
(The Hon. Anura Dissanayake on behalf of the Hon. Sunil Handunnetti)

ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) 2011 දැයට කිරුළ ප්‍රදර්ශනය වෙනුවෙන් ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍යාංශය වැය කළ මුළු මුදල කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අමාත්‍යාංශයේ එක් එක් ආයතනය හා දෙපාර්තමේන්තුව මඟින් එම ප්‍රදර්ශනය සඳහා කළ වියදම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම දෙපාර්තමේන්තු හා ආයතන විසින් ඉටු කරන ලද කර්තව්‍යයන් කවරේද;

(iii) එම එක් එක් කාර්ය වෙනුවෙන් වැය කරන ලද මුදල කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) පසුගිය අය - වැයෙන් ඉහත වියදම් සඳහා මුදල් වෙන් කරන ලද අමාත්‍යාංශ වැය ශීර්ෂය කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

வினைத்திறன் மேம்பாட்டு அமைச்சரைக் கேட்ட வினா:

(அ) 2011 `தயட்ட கிருல' கண்காட்சிக்காக வினைத் திறன் மேம்பாட்டு அமைச்சு செலவிட்டுள்ள மொத்தப் பணத் தொகை எவ்வளவு என்பதை அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) அமைச்சின் ஒவ்வொரு நிறுவனம் மற்றும் திணைக் களத்தினால் மேற்படி கண்காட்சிக்காக மேற் கொள்ளப்பட்ட செலவு தனித்தனியே எவ்வளவு என்பதையும்;

(ii) மேற்படி திணைக்களங்கள் மற்றும் நிறுவனங்க ளினால் ஆற்றப்பட்ட பணிகள் யாவை என்பதையும்;

(iii) மேற்படி ஒவ்வொரு பணிக்காகவும் செலவிடப்பட்ட பணத் தொகை எவ்வளவு என்பதையும்

அவர் தனித்தனியாக குறிப்பிடுவாரா?

(இ) கடந்த வரவு செலவுத் திட்டத்தில் மேற்படி செலவினத் துக்காக அமைச்சின் எந்தச் செலவுத் தலைப்பின் கீழ் நிதி ஒதுக்கப்பட்டிருந்தது என்பதை அவர் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Productivity Promotion :

(a) Will he state the total amount of money spent by the Ministry of Productivity Promotion on the "Deyata Kirula" exhibition in 2011?

(b) Will he state-

(i) separately, the expenditure borne by each institution and department of the Ministry on that exhibition;

(ii) the functions carried out by those institutions and departments; and

(iii) separately, the amount of money spent on each of those functions?

(c) Will he state the Head of Expenditure of the Ministry out of which funds were allocated from the last Budget for the above mentioned expenses?

(d) If not, why?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) 2011 දැයට කිරුළ ප්‍රදර්ශනය වෙනුවෙන් ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍යාංශය වැය කළ මුළු මුදල රු. 1,342,373.21

(ආ) (i) අමාත්‍යාංශයේ එක් එක් ආයතනය හා දෙපාර්තමේන්තුව මඟින් එම ප්‍රදර්ශනය සඳහා කළ වියදම,

* එලදායිතා ලේකම් කාර්යාලය වැය කළ මුදල රු. 611,283.21

* මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව රු. 731,090.00

(ii) එම දෙපාර්තමේන්තු හා ආයතන විසින් ඉටු කරන ලද කර්තව්‍යයන්,

ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය.

- දැයට කිරුළ ජාතික ප්‍රදර්ශනයට සමගාමීව මාස 4ක පමණ පූර්ව කාල සීමාවක් තුළ මොණරාගල දිස්ත්‍රික්කය තුළ ආයතන 21ක් තෝරා ගෙන ඵලදායිතාවය හා එස් 5 සංකල්පය පිළිබඳව දේශන පැවැත්වීම. (ඇමුණුම 1)
- නවතම ඵලදායිතා සංකල්පයක් ලෙස ගෘහස්ථ ඵලදායිතාව ඉහළ නැංවීමේ අරමුණින් ප්‍රජා කණ්ඩායම් දැනුවත් කිරීම සඳහා දැයට කිරුළ ප්‍රදර්ශනයට සම්බන්ධව වැඩසටහන් පැවැත්වීම.
- ඵලදායි ගෘහයක ආකෘතියක් මඟින් සක්‍රියව ජනතාවට තම නිවසෙහි ඵලදායිතාවය වැඩි කර ගන්නා ආකාරය ප්‍රායෝගික ක්‍රියාකාරකම් තුළින් පැහැදිලි කිරීම.
- මේ සඳහා විවිධ ක්‍රියාකාරකම් ඔස්සේ ඵලදායිතාව ගෘහයක් තුළ ක්‍රියාත්මක කරන ආකාරය පිළිබඳ වීඩියෝ දර්ශන, සජීවී ඉදිරිපත් කිරීම, අත්පත්‍රිකා ආදිය බෙදා හැරීම මඟින් ප්‍රජාව දැනුවත් කිරීම.

මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව

- මොණරාගල දිස්ත්‍රික් කඩිනම් සංවර්ධන වැඩසටහන යටතේ රැකියා නිර්මාණ, ප්‍රවර්ධන වැඩසටහන් පැවැත්වීම. (ඇමුණුම 2)
- වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන් පැවැත්වීම.
- දැයට කිරුළ ප්‍රදර්ශන භූමියේ දෙපාර්තමේන්තු ප්‍රදර්ශන කුටියේ කාර්යයන්.

ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍යාංශය විසින් සංකල්පික, උපදේශාත්මක සහ අධීක්ෂණ මට්ටමේ මහ පෙන්වීම් කරන ලදී.

(iii) එම එක් එක් කාර්යය වෙනුවෙන් වැය කරන ලද මුදල

ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය

ඉහත අංක (ආ) ii යටතේ ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය විසින් ඉටු කරන ලද කාර්යයන් වෙනුවෙන් රු. 611,283.21

මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව

- රැකියා නිර්මාණ, ප්‍රවර්ධන වැඩසටහන් රු. 256,320.00
- වෘත්තීය මාර්ගෝපදේශන වැඩටසහන රු. 94,140.00
- දැයට කිරුළ ප්‍රදර්ශන කුටියේ කාර්යයන් රු. 380,630.00

(ඇ) පසුගිය අය වැයෙන් ඉහත වියදම් සඳහා මුදල් වෙන් කරන ලද අමාත්‍යාංශ වැය ශීර්ෂය.

181-1-3-2401

127-2-6-2401

127-2-6-2502

328-1-1-2401

(ඈ) අදාළ නොවේ.

ඇමුණුම් අංක 01

දැයට කිරුළ ජාතික සංවර්ධන ප්‍රදර්ශනය .

දැයට කිරුළ ජාතික දංවර්ධන ප්‍රදර්ශන වැඩසටහන යටතේ ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලයෙන් පහත සඳහන් වැඩසටහන් සිදු කරන ලදී.

| අංකය | සංවර්ධන වැඩසටහන/ ව්‍යාපෘතිය | ක්‍රියාත්මක කළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | දිනය | ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 1 | මඩුල්ල ග්‍රාම නිලධාරීන් සඳහා)ඵලදායිතා සහ එස් 5) | මඩුල්ල | 2010.09.06 | 29 |
| 2 | ශිෂ්‍ය නායක කණ්ඩායම් (ඵලදායිතා සහ එස් 5) | මඩුල්ල | 2010.09.09. | 36 |
| 3 | කාන්තා බල මණ්ඩලය ඵලදායිතා සහ එස් 5) | මඩුල්ල | 2010.09.09 | 20 |
| 4 | පෙර පාසල් පාලිකාවන් සඳහා ප්‍රා.ලේ.කා.- ඵලදායිතා ප්‍රවර්ධන / එස් 5 | වැල්ලවාය | 2010.09.20 | 26 |
| 5 | ව්‍යාපාරික ප්‍රජාව -වැල්ලවාය ප්‍රා.ලේ.කා.- ඵලදායිතා ප්‍රවර්ධන / එස් 5 | වැල්ලවාය | 2010.09.20 | 40 |
| 6 | වනිතා කමිටු නිලධාරීන් වැල්ලවාය - ප්‍රා.ලේ.කා.- ඵලදායිතා ප්‍රවර්ධන / එස් 5 | වැල්ලවාය | 2010.09.22 | 38 |
| 7 | වෙහෙරයාය ම.වි. ගුරුවරුන් සඳහා - වෙහෙරයාය ම.වි. | වැල්ලවාය | 2010.09.19 | 25 |
| 8 | MOH වැල්ලවාය - හරිත ඵලදායිතාවය/ කයිසෙන් | වැල්ලවාය | 2010.09.21 | 20 |
| 9 | කුඹුක්කන දෙමළ කනිටු විදුහලේ ගුරුවරුන් සඳහා (ඵලදායිතා එස් 5) | බඩල්කුඹුර | 2010.10.15 | 08 |
| 10 | පෙර පාසල් පාලිකාවන් සඳහා ප්‍රා.ලේ.කා.-වැල්ලවාය ඵලදායිතා ප්‍රවර්ධන / එස් 5 | බඩල්කුඹුර | 2010.10.13 | 20 |
| 11 | පෙර පාසල් බලමණ්ඩලය | මොණරාගල | 2010.08.28 | 28 |
| 12 | ප්‍රාදේශීය සෞඛ්‍යසේවා අධ්‍යක්ෂ කාර්යාලය | මොණරාගල | 2010.10.06 | 41 |
| 13 | පාසල් නියෝජිතයන් සඳහා | කතරගම | 2010.11.25 | 17 |
| 14 | දෙමළ කණිටු විදුහල | බඩල්කුඹුර | 2010.10.15 | 08 |
| 15 | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | සෙවනගල | 2010.12.13 | 37 |
| 16 | කලාප අධ්‍යාපන කාර්යාලය | මොණරාගල | 2010.12.03 | 36 |
| 17 | දැව සංස්ථා මණ්ඩලය | මොණරාගල | 2010.11.25 | 64 |
| 18 | පෙර පාසල් ගුරුපුහුණුව | බුත්තල | 2010.12.16 | 91 |
| 19 | ග්‍රාම සංවර්ධන පුහුණු ආයතනය | වැල්ලවාය | 2010.12.16 | 43 |
| 20 | ආයුර්වේද රෝහල | මැදගම | 2010.12.21 | 19 |
| 21 | මහා විද්‍යාලය | සියඹලාණ්ඩුව | 2010.12.06 | 41 |

ඇමුණුම් අංක 02

මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුවේ කඩිනම් සංවර්ධන වැඩසටහන (2010.07.31- 2011.01.31) සමස්ථ ප්‍රගතිය.

| වැඩසටහන | වැඩසටහන් සංඛ්‍යාව | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | වියදම |
|---|---|---|---|
| රැකියා නිර්මාණ ප්‍රවර්ධන වැඩසටහන් | | | |
| දිස්ත්‍රික් රැකියා පොළ | 01 | 750 | 56550.00 |
| ප්‍රාදේශීය රැකියා පොළ | 03 | 549 | 19500.00 |
| නිදහස් රැකියා සඳහා පෙළඹවීමේ වැඩසටහන | 02 | 86 | 24160.00 |
| ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු වැඩසටහන | 05 | 194 | 90000.00 |
| රැකියා සමාජ වැඩසටහන | 01 | 43 | 23120.00 |
| පෞද්ගලික අංශයේ රැකියාගත කිරීමේ වැඩසටහන | 01 | 125 | 18000.00 |
| අවශ්‍යතා මත පුහුණු වැඩසටහන | 03 | 130 | 24900.00 |
| එකතුව | | | 256230.00 |
| වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන් | | | |
| වෘත්තීය අභියෝග ජය ගැනීමේ වැඩසටහන | 04 | 162 | 26250.00 |
| ස්වයං රැකියා සඳහා පෙළඹවීමේ වැඩසටහන | 06 | 298 | 12380.00 |
| රැකියා ගවේෂණ ශිල්ප ක්‍රම වැඩසටහන | 02 | 98 | 31900.00 |
| ගුරුවරුන් දැනුවත් කිරීමේ වැඩසටන | 01 | 33 | 1400.00 |
| බාහිර උපාධි වැඩසටහන | 01 | 44 | 20080.00 |
| දිවියට සවියක් වැඩසටහන | 02 | 21 | 2130.00 |
| එකතුව | | | 94140.00 |
| වැඩසටහන් සඳහා සම්පූර්ණ වියදම | | | 350370.00 |

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 8-1048/'10-(3), ගරු මොහොමඩ් අස්ලම් මහතා.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
ගරු කථානායකතුමනි, ගරු මොහොමඩ් අස්ලම් මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## 2011 දැයට කිරුළ ප්‍රදර්ශනය වෙනුවෙන් වැය කළ මුදල : ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශය
## 2011 `தயட்ட கிருல' கண்காட்சி செலவினம் : தேசிய மரபுரிமைகள் அமைச்சு
## MONEY SPENT ON DEYATA KIRULA EXHIBITION 2011: MINISTRY OF NATIONAL HERITAGE

1224/'11

9. **ගරු අනුර දිසානායක මහතා (ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා වෙනුවට)**
(மாண்புமிகு அநுர திஸாநாயக்க - மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி சார்பாக,)
(The Hon. Anura Dissanayake on behalf of the Hon. Sunil Handunnetti)
ජාතික උරුමයන් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) 2011 දැයට කිරුළ ප්‍රදර්ශනය වෙනුවෙන් ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශය වැය කළ මුළු මුදල කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අමාත්‍යාංශයේ එක් එක් ආයතනය හා දෙපාර්තමේන්තුව මඟින් එම ප්‍රදර්ශනය සඳහා කළ වියදම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම දෙපාර්තමේන්තු හා ආයතන විසින් ඉටු කරන ලද කර්තව්‍යයන් කවරේද;

(iii) එම එක් එක් කාර්ය වෙනුවෙන් වැය කරන ලද මුදල කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) පසු ගිය අය වැයෙන් ඉහත වියදම් සඳහා මුදල් වෙන් කරන ලද අමාත්‍යාංශ වැය ශීර්ෂය කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

தேசிய மரபுரிமைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) 2011 `தயட்ட கிருல' கண்காட்சிக்காக தேசிய மர புரிமைகள் அமைச்சு செலவிட்டுள்ள மொத்தப் பணத் தொகை எவ்வளவு என்பதை அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) அமைச்சின் ஒவ்வொரு நிறுவனம் மற்றும் திணைக்களத்தினால் மேற்படி கண்காட்சிக்காக மேற்கொள்ளப்பட்ட செலவு தனித் தனியே எவ்வளவு என்பதையும்;

(ii) மேற்படி திணைக்களங்கள் மற்றும் நிறுவனங் களினால் ஆற்றப்பட்ட பணிகள் யாவை என்பதையும்;

(iii) மேற்படி ஒவ்வொரு பணிக்காகவும் செலவிடப்பட்ட பணத் தொகை எவ்வளவு என்பதையும்

அவர் தனித்தனியாக குறிப்பிடுவாரா?

(இ) கடந்த வரவு செலவுத் திட்டத்தில் மேற்படி செலவினத் துக்காக அமைச்சின் எந்த செலவுத் தலைப்பின் கீழ் நிதி ஒதுக்கப்பட்டிருந்தது என்பதை அவர் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of National Heritage :

(a) Will he state the total amount of money spent by the Ministry of National Heritage on the "Deyata Kirula" exhibition in 2011?

(b) Will he state-

(i) separately, the expenditure borne by each institution and department of the Ministry on that exhibition;

(ii) the functions carried out by those institutions and departments; and

(iii) separately, the amount of money spent on each of those functions?

(c) Will he state the Head of Expenditure of the Ministry out of which funds were allocated from the last Budget for the above mentioned expenses?

(d) If not, why?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) ඔව්.

2011 දැයට කිරුළ ප්‍රදර්ශනය වෙනුවෙන් ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශය වැය කළ මුදල රු. 2,588,197.52 කි. (රුපියල් දෙමිලියන පන්ලක්ෂ අසූඅටදහස් එකසිය අනූහතකුත් ශත පනස්දෙකකි.)

(අමාත්‍යාංශයේ ඍජු වියදම රු. 519,886.56 - රුපියල් පන්ලක්ෂ දහනවදහස් අටසිය අසූහයකුත් ශත පනස්හය + අමාත්‍යාංශය යටතේ ඇති ආයතන දැරූ වියදම රු. 2,068,310.96 - රුපියල් දෙමිලියන හැටඅට දහස් තුන්සිය දහයකුත් ශත අනූහයක් වේ.)

(ආ) (i)

| එම අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු ආයතන | වැය කළ මුදල (රු.) |
|---|---|
| 1. ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව | 265,655.56 |
| 2. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව | 895,126.00 |
| 3. ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව | 530,750.10 |
| 4. ගාලු උරුමය පදනම | 197,996.00 |
| 5. ජනකලා කේන්ද්‍රය | 178,783.30 |
| **මුළු එකතුව** | **2,068,310.96** |

(ii) (01) <u>ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව</u>

ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ කාර්ය භාරය විදහා දැක්වෙන ප්‍රදර්ශනයක් පැවැත් වීම, එම ආයතනය පිළිබඳව දැනුවත් කිරීමේ අරමුණින් ප්‍රදර්ශනය නැරඹීමට පැමිණෙන ජනතාව අතරේ පොත් පිටපත් නොමිලේ බෙදා හැරීම, ප්‍රකාශන අළෙවි කිරීම සහ පැරණි පුවත් පත්වල ඡායා පිටපතක් මහ ජනතාවට ලබා දීම. සූක්ෂම චිත්‍රපට කියවන යන්ත්‍රයක ආධාරයෙන් පැරණි පුවත් පත් කියවීමට අවස්ථාව ලබා දීම මෙන්ම දෙපාර්තමේන්තුව පිළිබඳව පැමිණෙන මහ ජනතාව වාචිකව දැනුවත් කිරීම.

(02) <u>පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව</u>

ප්‍රාග් ඓතිහාසික මානව රූප 06ක් සහිත ප්‍රාග් ඓතිහාසික යුගය පිළිබිඹු වන කෘතිම ලෙනක් සකස් කොට ප්‍රදර්ශනය කිරීම.

(03) <u>ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව</u>

ශ්‍රී ලංකාවේ කෝලම් සම්ප්‍රදාය මැයෙන් ප්‍රදර්ශනයක් පැවැත් වීම සහ කෞතුකාගාර ප්‍රකාශන අළෙවි සැලක් පැවැත් වීම.

(04) <u>ගාලු උරුමය පදනම</u>

ගාලු කොටුවේ ඉතිහාසය (පෘතුගීසි, ලන්දේසි, ඉංග්‍රීසි යුගත්‍රයන්) ප්‍රදර්ශනය කිරීම හා ඒ පිළිබඳ දැනුවත් කිරීම සහ ගාලු කොටුවේ ආකෘතියක් ප්‍රදර්ශනය කිරීම.

(05) <u>ජන කලා කේන්ද්‍රය</u>

මැටි, බිරළු රේන්ද, සම්භාණ්ඩ හා මැණික් කැපීම යන කර්මාන්තයන්හි අමුද්‍රව්‍ය උපයෝගී කර ගෙන පාරම්පරික ශිල්ප ක්‍රම නිරූපණය කරමින් නිමි භාණ්ඩ සකස් කිරීම විදහා දැක්වෙන ප්‍රදර්ශනයක් පැවැත්වීම. (Demonstration)

(iii)

| කාර්යයන් | පරිපාලන වියදම්ද අතුළුව මුළු වියදම් (රු.) |
|---|---|
| <u>ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව</u><br>ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ කාර්ය භාරය විදහා දැක්වෙන ප්‍රදර්ශනයක් පැවැත් වීම, එම ආයතනය පිළිබඳව දැනුවත් කිරීමේ අරමුණින් ප්‍රදර්ශනය නැරඹීමට පැමිණෙන ජනතාව අතරේ පොත් පිටපත් නොමිලේ බෙදා හැරීම, ප්‍රකාශන අළෙවි කිරීම සහ පැරණි පුවත් පත්වල ඡායා පිටපතක් මහ ජනතාවට ලබා දීම. සූක්ෂම චිත්‍රපට කියවන යන්ත්‍රයක ආධාරයෙන් පැරණි පුවත් පත් කියවීමට අවස්ථාව ලබා දීම මෙන්ම දෙපාර්තමේන්තුව පිළිබඳව පැමිණෙන මහ ජනතාව වාචිකව දැනුවත් කිරීම. | 530,750.10 |
| <u>පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව</u><br>ප්‍රාග් ඓතිහාසික මානව රූප 06ක් සහිත ප්‍රාග් ඓතිහාසික යුගය පිළිබිඹු වන කෘතිම ලෙනක් සකස් කොට ප්‍රදර්ශනය කිරීම. | 895,126.00 |
| <u>ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව</u><br>ශ්‍රී ලංකාවේ කෝලම් සම්ප්‍රදාය මැයෙන් ප්‍රදර්ශනයක් පැවැත් වීම සහ කෞතුකාගාර ප්‍රකාශන අළෙවි සැලක් පැවැත් වීම. | 265,655.56 |
| <u>ගාලු උරුමය පදනම</u><br>ගාලු කොටුවේ ඉතිහාසය (පෘතුගීසි, ලන්දේසි, ඉංග්‍රීසි යුගත්‍රයන්) ප්‍රදර්ශනය කිරීම හා ඒ පිළිබඳ දැනුවත් කිරීම සහ ගාලු කොටුවේ ආකෘතියක් ප්‍රදර්ශනය කිරීම. | 197,996.00 |
| <u>ජන කලා කේන්ද්‍රය</u><br>මැටි, බිරළු රේන්ද, සම්භාණ්ඩ හා මැණික් කැපීම යන කර්මාන්තයන්හි අමුද්‍රව්‍ය උපයෝගී කර ගෙන පාරම්පරික ශිල්ප ක්‍රම නිරූපණය කරමින් නිමි භාණ්ඩ සකස් කිරීම විදහා දැක්වෙන ප්‍රදර්ශනයක් පැවැත්වීම. (Demonstration) | 178,783.30 |

(ඇ) 2011 වර්ෂයට ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශයට හා සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශයට ප්‍රතිපාදන සලසා තිබුණේ වැය ශීර්ෂ අංක 142 යටතේ එක් අමාත්‍යාංශයක් වශයෙනි.

(ඈ) අදාළ නොවේ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 13-1049/'10-(3), ගරු මොහොමඩ් අස්ලම් මහතා.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
கௌரவ சபாநாயகர் அவர்களே, அந்தக் கேள்வியையும் நான் கேட்கின்றேன்.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා இரண்டு සති කාලයක් ඉල්ලා සිටිනවා.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
உங்களுக்கு மிகவும் நன்றி. தமிழிலே நீங்கள் பேசுவது மிகவும் நன்று.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මොනවා කියනවාද මා දන්නේ නැහැ. මෙතුමා කියන ඒවා හරියට බලන්න ඕනෑ.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 14-1225/'11-(1), ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ස්ථාවර නියෝග 23(2) යටතේ ප්‍රශ්නය ඉදිරිපත් කිරීම - ගරු රනිල් වික්‍රමසිංහ මහතා,

## පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

### I
### උතුරේ නිදහස් හා සාධාරණ මැතිවරණයක් පැවැත්වීම
### வடக்கில் சுதந்திரமானதும் நேர்மையானதுமான தேர்தலை நடத்துதல்
### HOLDING OF FREE AND FAIR ELECTION IN NORTH

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Ranil Wickremasinghe - Leader of the Opposition)

Hon. Speaker, the second round of the Local Government Elections, which includes the elections for local authorities in the Jaffna Peninsula and Vanni is scheduled to be held on the 23rd of July, 2011. In 2009, in the immediate aftermath of the defeat of the LTTE, when conditions of security had not yet reached normalcy, elections were held for some of the local bodies in the North. The conduct of these elections was far from satisfactory. Armed groups operated openly. The police did not take action on the complaints made by the candidates of the Opposition parties. The administration became a part of the election campaign. Only the armed forces stayed out of that election campaign. Hon. Speaker, I think we must thank our Colleague, Mr. Sarath Fonseka, for having upheld that honourable tradition at that time.

Anyway, now this election is to be conducted under conditions of normalcy. Therefore, the duty of conducting elections rests on the Commissioner of Elections, his officers and the police. The maintenance of peace and enforcement of election laws is the sole responsibility of the police. Nevertheless, the events of the last few weeks have shown the inability of the police to inquire into complaints of election law violations. The election laws are observed in the breach. There are daily complaints regarding intimidation, violence and abuse of Government machinery.

Complaints have been received that officials, not only from the North, but also from other areas of the country have become a part of the election campaign of several Ministers. These are reported in electronic and print media. There are daily news items of tractors, water pumps, agricultural apparatus, sewing machines and fishing nets being freely distributed by the Ministers and their officials.

**ගරු කරු ජයසූරිය මහතා**
(மாண்புமிகு கரு ஜயசூரிய)
(The Hon. Karu Jayasuriya)
Chicken and goats also.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)

Chicken and goats are also being distributed, according to our Deputy Leader. This is a serious breach of law. The officials are also interfering with the Opposition party candidates. Recently, one of our candidates was threatened by a Government official. A complaint has been made to the police. The JVP has complained that the army is interfering with their election campaign. Yesterday, I had a complaint that a security force personnel had torn down the posters of the Opposition parties and pasted the posters of the UPFA. As I mentioned at the beginning, never before had the army got involved in political campaigns. I must say, none of the previous commanders allowed it. What is happening now is a dangerous trend. For the first time, elements of the security forces are also involved in the election campaign. This is in addition to the armed groups that are acting with impunity. There are a number of complaints daily of Opposition candidates being intimidated, stoned, threatened and assaulted. A wreath was placed at the doorstep of one of the candidates. The complaint made by the Hon. Suresh Premachandran, TNA Member of Parliament, which was also raised in this House has so far not been investigated.

The incident of a beheaded carcass of a dog being placed in the house of one of the candidates has shocked Jaffna. The vehicle of Hindu God Vairavar is a dog and therefore, it is most unlikely that this despicable act would have been done by a Tamil. The finger points at an obvious different direction.

There is also an incident which occurred on the 18th of July in Chunnakam, where the army had forcibly jumped on to an election propaganda stage and removed the microphones on the basis that it was past 10.00 p.m., which was the time prescribed in the permit. If that was so, it should have been the function of the police and not the army. I am sure, Hon. Speaker, you and I have experienced this. When we had run up against the time limit, the police gave us extra ten minutes and then got us to conclude the election campaign rally. Why was the police not used in this case?

Hon. Speaker, these elections are taking place at a critical time. The TNA is currently engaged in talks with the Government aimed at achieving a political solution. The Joint Communiqué between the Government of Sri Lanka and the Government of India emphasized on a political solution built on the Thirteenth Amendment to the Constitution. We have stated that the UNP will support the outcome of these talks. The Government is also discussing with the TNA the possibility of

appointing a Parliamentary Select Committee. The future of this will, to a large extent, depend on what happens at the local authority elections in the North. Therefore, it is not merely an election limited to selecting members to the local authorities. The success or failure of the ongoing political process depends, to a large extent, on the manner in which this election is conducted. It is an election which will have an impact on the country. This is why it is important to hold free and fair elections in the North.

Therefore, I would like to ask the Prime Minister, what action the Government is proposing to prevent these acts of intimidation in the last few days of election and what measures will be taken to ensure that the polling on 23rd July is free and fair.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**

(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா - நீர்ப்பாசன, நீர்வள முகாமைத்துவ அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)

(The Hon. Nimal Siripala de Silva - Minister of Irrigation and Water Resources Management and Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, ගරු විපක්ෂනායකතුමා විසින් මතු කරන ලද ප්‍රශ්නය පිළිබඳව රජයේ ස්ථාවරය පැහැදිලි කිරීම අපේ යුතුකමක් වනවා. එතුමාගේ මෙම ප්‍රකාශයේ පළමුවැනි ඡේදයේ සඳහන් වන්නේ, මීට පෙර පවත්වන ලද මැතිවරණ පිළිබඳව ඔවුන්ගේ තිබෙන පැමිණිලි ගැනයි. මා කියන්නට සතුටුයි, මීට පෙර පවත්වන ලද මැතිවරණවලදී ඒ ප්‍රදේශවල ජනතාව ඡන්දය පාවිච්චි කරලා ඔවුන්ගේ නියෝජිතයින් ඒ පළාත් පාලන ආයතන සඳහා පත් කර ගත් බව. ඒ පළාත් පාලන ආයතන සඳහා නියෝජිතයින් පත් කර ගන්නා ලද එම ඡන්ද විමසීම පිළිබඳව කිසිම ආකාරයක අභියෝගයක් පරාජිත පක්ෂවලින් කරලා නැහැ. එහෙම නම් මීට පෙර පවත්වන ලද මැතිවරණය දූෂිත නම්, ඒ මැතිවරණයේ අඩු පාඩු තිබුණා නම්, ඒ වාගේම එම මැතිවරණයේ දී තමන්ගේ අපේක්ෂකයින්ට කරදර හිරිහැර කළා නම්, අපේ මැතිවරණ නීතිය අනුව ඒවා අවලංගු කිරීම සඳහා නීතිමය ප්‍රතිපාදන තිබෙනවා. ඒ කිසිවක් පාවිච්චි කරන්නේ නැතිව පාර්ලිමේන්තුවේ තිබෙන මේ වරප්‍රසාද අවස්ථාව තෝරා ගෙන ඒ පිළිබඳව පැමිණිලි කිරීම යුක්ති සහගත නොවන බව මා විපක්ෂ නායකතුමාට ප්‍රකාශ කරන්නට කැමැතියි.

ගරු කථානායකතුමනි, ත්‍රස්තවාදයෙන් උතුර සහ නැඟෙනහිර බේරා ගැනීමෙන් අනතුරුව විශේෂයෙන් අප නැඟෙනහිර පළාතේ මැතිවරණයක් පැවැත්වූවා. නැඟෙනහිර පළාතේ ඒ මැතිවරණයේ දී එල්ටීටීඊ සංවිධානයේ ළමා සොල්දාදුවකු වශයෙන් හිටපු කෙනෙකුව නැඟෙනහිර පළාතේ ප්‍රධාන අමාත්‍යවරයා බවට පත් කර ගන්නට අපට පුළුවන් වුණා. ඒක ප්‍රජාතන්ත්‍රවාදයේ ජයග්‍රහණයක්; ද්‍රවිඩ ජනතාවගේ ජයග්‍රහණයක්. මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ රජය ඒ වැඩ කටයුතු කළේ අපට දේශපාලන වාසියක් ලබා ගැනීමේ පරමාර්ථයෙන් නොවෙයි. යුද්ධයෙන් පසුව අපට අවශ්‍ය වුණා, උතුරු නැඟෙනහිර ප්‍රදේශවල ජනතාවටත් ඔවුන්ට රිසි පරිදි තමන්ගේ දේශපාලන අයිතිය බිම් මට්ටමෙන් ක්‍රියාත්මක වන ව්‍යුහයන් සකස් කරලා දෙන්න. නමුත් ඒක එතරම් ලෙහෙසි වන්නේ නැහැ. දකුණේ වාගේ ලෙහෙසි වන්නේ නැහැ. මොකද, ඔබතුමාත් දන්නා විධියට අවුරුදු තිහක යුද්ධයෙන් පස්සේ, ඒ ප්‍රදේශවල අවිආයුධ සඟවලා තිබුණා.එල්ටීටීඊ සංවිධානයේ කණ්ඩායම් සිටියා. අනෙකුත් කණ්ඩායම් සිටියා. ඒ විධියට විවිධ කණ්ඩායම් සිටියා. ඒ නිසා එක දවසකින් සියයට සියයක පූර්ණ ප්‍රජාතන්ත්‍රවාදයක් දායාද කිරීම කථා කරනවා වාගේ ලෙහෙසි නැහැ. ඒ සඳහා විවිධ වූ ප්‍රායෝගික ප්‍රශ්න හා ගැටලු රාශියකට මුහුණ පාන්න සිදු වනවා. නමුත් එවැනි තත්ත්වයක් තිබියදීත් මැතිවරණය කල් දමන්නේ නැතිව පැවැත්වීමයි අපේ ජයග්‍රහණය. මේ ප්‍රදේශවල තත්ත්වය තවමත් හොඳ නැහැ; මේ ප්‍රදේශවල අවිආයුධ ගත්ත කණ්ඩායම් ඉන්නවා; එහෙම නැත්නම් මේ සඳහා ඒ ප්‍රදේශයේ ජනතාවගේ මනස තවම සවිමත් වෙලා නැහැ කියලා අපට මේ මැතිවරණය කල් දමන්න තිබුණා. නමුත් අපේ රජය එහෙම කළේ නැහැ. අපට අවශ්‍යකම තිබෙනවා, ඒ ප්‍රදේශවල ජනතාවට ඒ පාලන බලය ලබා දීමට. ඒ නිසා තමයි අපි තීන්දු කළේ අර නැඟෙනහිර මැතිවරණය තිබ්බා වාගේම සමහර ප්‍රදේශවල පළාත් පාලන මැතිවරණය තිබ්බා වාගේම විශේෂයෙන් මේ මැතිවරණයත් තියන්නට. ඒකට අපට ඉඩකඩ තිබුණා. නමුත් උසාවි මඟින් දෙන ලද තීන්දු නිසා අපට සිද්ධ වුණා, මේ මැතිවරණය කල් තියන්න. නැත්නම් අපි පසුගිය වර ඒ තිබුණු මැතිවරණත් සමඟම මේ මැතිවරණයත් තැබීමට කටයුතු කරනවා. උසාවියේ තීන්දු ලැබුණා. උසාවියේ ඒ තීන්දු ලැබුණායින් පස්සේ මැතිවරණ කොමසාරිස්වරයා විසින් මේ මැතිවරණය පැවැත්වීම සඳහා අවශ්‍ය කටයුතු කර තිබෙනවා. ඒ නිසා මේ මැතිවරණය පැවැත්වීමත් විශාල ජයග්‍රහණයක්, අපේ රජයේත් ඒ වාගේම ඒ පළාත්වල ඉන්න ජනතාවගේත්. ඉස්සර ඒ පළාත්වල ජනතාව සමහර මැතිවරණවලදී හැතැප්ම 15-20 ඈත ඉඳන් ඇවිල්ලායි ඡන්දය දුන්නේ. නිදහසේ ඡන්දය දීමේ අයිතිය තිබුණේ නැහැ. නමුත් අද වන කොට ඒ ප්‍රදේශවල ජනතාවට නිදහසේ ඡන්දය දීමේ අයිතිය අපි තහවුරු කර තිබෙනවා. ඒක අපට මේ 23 වනදා පැවැත්වෙන මැතිවරණයෙන් බලා ගන්න පුළුවන් වෙයි. ජනතාවට ඡන්ද පොළට පැමිණීමට ඇති අයිතිය තහවුරු කර දෙමින්, ජනතාවගේ පරමාධිපත්‍ය ගම් මට්ටමින් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය පසුබිම රජය තහවුරු කර දෙන බවට මා මේ සභාවට පොරොන්දු වෙනවා ගරු කථානායකතුමනි. ඒ ගැන අපට ප්‍රශ්නයක් නැහැ. අපට අවශ්‍ය වන්නේ, අපේ රජයට අවශ්‍ය වන්නේ ඒකයි. මෙන්න මේ කියන ක්‍රියාවලිය තුළින් මේ මැතිවරණයේදී අපි අනිවාර්යයෙන්ම රජයේ සද්භාවය ප්‍රදර්ශනය කරනවා.

ඒ වාගේම විපක්ෂ නායකතුමා විපක්ෂයේ සමහර අපේක්ෂකයන්ට වෙච්ච හානි පිළිබඳව, යම් යම් ප්‍රශ්න පිළිබඳව, ජනතා විමුක්ති පෙරමුණ ගුටි කාපු ඒවා පිළිබඳව, ඒවා මේවා ගැන ප්‍රශ්න කරනවා.

ගරු කථානායකතුමනි, මැතිවරණයකදී විවිධ පක්ෂ හා පාර්ශ්වයන් අතර ගැටීම් ඇති වනවා. සියයට සියයක් ගැටීම්වලින් තොර වූ මැතිවරණයක් නැහැ. සමහර විට පක්ෂ-පක්ෂ අතර ගැටීම් ඇති වනවා. සජිත් ප්‍රේමදාස මහත්මයාටත් මැතිවරණ සටන්වලදී ගුටි කන්න සිද්ධ වුණා. යම් යම් අමාරුකම්වලට මුහුණ පාන්න සිද්ධ වුණා. ප්‍රහාරවලට මුහුණ දෙන්න සිද්ධ වුණා. ඒවා එහෙම තමයි. මේ මැතිවරණ ක්‍රමය යටතේ සමහර විට පක්ෂ-පක්ෂ අය අතර තිබෙන සටන්, පක්ෂ-විපක්ෂ අය එක්ක තිබෙන සටන්වලට වඩා වැඩියි. ඒ නිසා අපි ඒකත් කල්පනා කරන්නට ඕනෑ. සම්පූර්ණයෙන්ම සියයට සියයක් ගැටීම්වලින් තොර වූ දේශපාලනයක් තිබෙනවා නම් ඉතාම හොඳයි. අපි ප්‍රාර්ථනා කරමු එවැනි දේශපාලන ප්‍රවාහයක් අපට හදා ගන්න හැකි වේවා කියලා. නමුත් මේ තිබෙන සුළු සුළු සිද්ධීන් ඔක්කොම එකට ලඝු කරලා මේ මැතිවරණය නිදහස් හා සාධාරණ නොවන මැතිවරණයක් කියලා පෙන්වන එක ගැන අපේ රජය එකඟ වන්නේ නැහැ.

ගරු කථානායකතුමනි, ඒ වාගේම විපක්ෂ නායකතුමා කියනවා දැන් මැති ඇමතිවරු ඒ ප්‍රදේශවලට ගිහිල්ලා විවිධ ක්‍රියාවන්හි යෙදෙනවාය, විවිධ දේවල් බෙදනවාය කියලා. ගරු කථානායකතුමනි, නැඟෙනහිර ජනතාව මෙන්ම -ඊටත් වඩා- සුවිශේෂ වශයෙන් විශාල හානිවලට ලක් වුණු ජනතාවක් තමයි උතුරේ ජනතාව. මැතිවරණයක් තිබෙනවාය කියලා ඔවුන්ගේ ආර්ථිකය නඟා සිටුවීම කල් දමන්න අපට පුළුවන්කමක් නැහැ. උතුරේ ජනතාවට පානීය ජල සැපයුම දෙන්න අවශ්‍ය නම්

[ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා]

මැතිවරණය ඉවර වන තෙක් ඉන්න බැහැ. ඒවා රජය එදිනෙදා ගෙන යන සංවර්ධන වැඩ කටයුතු. අනිවාර්යයෙන්ම ඒවා ඉෂ්ට කරන්න ඕනෑ. මැතිවරණයක් තිබෙනවාය කියලා සංවර්ධනය නතර කරන්න බැහැ. අපි ගොවි ජනතාවට ලබා දෙන ප්‍රතිලාභ ලබා දෙන්නට ඕනෑ. ඒ වාගේම නාගරික සංවර්ධනය ඇති කරන්නට ඕනෑ. මාර්ග සංවර්ධනය ඇති කරන්නට ඕනෑ. ජලය දෙන්න ඕනෑ. අපි මේවා දෙන්න පටන් ගත්තේ මැතිවරණ කාලයේ නොවෙයි. මැතිවරණයට බොහොම කාලයකට ඉස්සර වෙලා තමයි අපි ඒ-9 මාර්ගය හැදුවේ; උතුරේ කාපට් පාරවල් හැදුවේ; උතුරේ ජල යෝජනා ක්‍රම ආරම්භ කළේ; නිවාස ව්‍යාපෘති ආරම්භ කළේ. මේවා මැතිවරණයක් නිසා කරපු දේවල් නොවෙයි. අප විසින් මේ මැතිවරණයට බොහෝ කාලයකට පෙර සිටම "උතුරු වසන්තය", "නැඟෙනහිර නවෝදය" වැනි වැඩ කටයුතු සඳහා දකුණට වඩා වැඩි විශාල මුදලක් ආයෝජනය කළා.

මැතිවරණයක් ආවා කියලා අපට ඒ කර ගෙන යන සංවර්ධන වැඩ කටයුතු නතර කිරීමට කිසිම හැකියාවක් නැහැ. ඒ කර ගෙන යන වැඩ කටයුතු තුළින් රජයට ප්‍රසාදයක් එනවා නම් ඒක වළක්වන්නට පුළුවන්කමක් නැහැ. අපේ රජය වෙනත් මැතිවරණ ජයග්‍රහණය කළේ එක්සත් ජාතික පක්ෂ රජය විසින් අමතක කරන ලද ග්‍රාමීය ජනතාවගේ ග්‍රාමීය ආර්ථිකය නඟා සිටුවීමට, ඔවුන් සවිබල ගැන්වීමට කටයුතු කළ නිසායි. ඒ නිසා තමයි එක්සත් ජාතික පක්ෂයත්, ජනතා විමුක්ති පෙරමුණත් හේදිලා ගියේ. අපි කරන ලද සංවර්ධනයේ ප්‍රතිඵල ජනතාව අත් වින්දා. ඒ නිසා ජනතාව අපට ඡන්දය දුන්නා. ඒ වාගේම තමයි උතුරේත්. අපි උතුරේ කරන සංවර්ධනයට කොහොම හරි break එකක් දමන්න තමයි ඔබතුමන්ලා බලන්නේ. එහෙම නැත්නම් අපට විදේශ ආධාරයක් ලැබෙනවා නම් ඒක නවත්වලා අපව අසීරුවට පත් කරන්නයි බලන්නේ.

ගරු කථානායකතුමනි, මම තව එක් කාරණයක් කියන්නට ඕනෑ. TNA සංවිධානය සමඟ අපේ රජය පවත්වා ගෙන යන සාකච්ඡා පිළිබඳව විපක්ෂ නායකතුමා ඉතාම සුබදායි ස්ථාවරයක් දක්වලා තිබුණා. ඒ ගැන අපි එතුමාට ස්තුතිවන්ත වෙනවා. සමහර අන්තවාදී පක්ෂ මෙන් නොව එක්සත් ජාතික පක්ෂය මේ සාකච්ඡා සාර්ථක වේවායි කියලා ප්‍රාර්ථනා කර තිබෙනවා. ඒ ගැන අපි එතුමාට ස්තුතිවන්ත වෙනවා. මොකද, මේ ප්‍රශ්නය විසඳීම සඳහා විපක්ෂයේ සහයෝගය අපට අවශ්‍යයි. ඒක අපි කවදාවත් බැහැර කරන්නේ නැහැ. ඒ නිසා මේ මැතිවරණයේ තිබෙන වැදගත්කම අපි දන්නවා. එතුමා කියනවා වාගේම මෙය හුදෙක්ම ඒ ඒ පක්ෂවලින් අපේක්ෂකයන් ගණනාවක් ජයග්‍රහණය කරවීමේ මැතිවරණයක් පමණක් නොවෙයි, රජයේ සද්භාවය පෙන්වා දෙන මැතිවරණයක්. රජයේ සද්භාවය තුළින් ඒ ප්‍රදේශවල සිටින ජනතා නියෝජිතයන්ට නිසි ලෙස පත්වීමට අපි ඉඩකඩ සලස්වන්නට ඕනෑ. ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රවාහය පිළිබඳව සැකයක් ඒ ප්‍රදේශවල ජනතාවට ඇති වුණොත් ඇත්ත වශයෙන්ම එය අපේ දීර්ඝ කාලීන ජාතික ඒකාබද්ධතාවට බලපාන බව අපි දන්නවා. ඒ නිසා මෙතෙක් කල් රජය වැඩ කරලා තිබෙන්නේ අන්න ඒ කියන ප්‍රතිඵලය ලබා ගැනීමේ අභිප්‍රායෙන් බව මම ප්‍රකාශ කරන්නට කැමැතියි. ඒ ගැන රජය සහතික වෙනවා. අපි ඒ සාකච්ඡාවල තිබෙන අගය, වටිනාකම තේරුම් අරගෙන තිබෙනවා. අපි සාකච්ඡා වාර අටක් පවත්වලා තිබෙන අතර, තවදුරටත් එකී සාකච්ඡා පවත්වා ගෙන යෑම සඳහා අවශ්‍ය සියලුම වැඩ කටයුතු කරන්නේ ඒ කියන කාරණය හිතේ ඇතිවයි.

ගරු කථානායකතුමනි, අපි තව කාරණයක් කියන්නට ඕනෑ. අපි දන්නවා, 1982 දී දිස්ත්‍රික් සංවර්ධන සභා මැතිවරණය පැවතුණ බව. ජනතා විමුක්ති පෙරමුණට විශේෂයෙන් ඒක මතක ඇති. ඒ අය තමයි ඒ මැතිවරණය පිළිබඳව හුඟක් කථා කළේ. යාපනයේ පුස්තකාලය ගිනි තැබුවා, එක්සත් ජාතික පක්ෂයේ නියෝජිතයන් ගිහිල්ලා.

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)

Sir, I rise to a point of Order. [බාධා කිරීම්] ඒ ගැන පොලීසිය කියපු ඒවායි, අමීර්තලිංගම් මැතිතුමා කියපු ඒවායි මා සභාගත කර තිබෙනවා. එම නිසා අසත්‍ය ප්‍රකාශ කරන්න එපා. [බාධා කිරීම්]

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

හරි. මා කිව්වේ නැහැ නේ, ඔබතුමා ගිහින් ගිනි තිබ්බා කියලා. නමුත් මේක සමස්ත ලෝකවාසී ජනතාව දන්නා ප්‍රසිද්ධ රහසක්. ඒ නිසා භය වන්නට එපා. භය වන්නට එපා. මේ මැතිවරණයේදී එවැනි සිද්ධි කිසි දෙයක් වන්න අපි ඉඩ දෙන්නේ නැහැ. එවැනි කිසිම සිද්ධියක් වන්න අපි ඉඩ දෙන්නේ නැහැ.

ඒ වාගේම අපට මතකයි, එදා එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව යටතේ ජනමත විචාරණය පවත්වපු ආකාරය. කොබ්බෑකඩුව මහත්මයාගේ ඡන්දයත් හොරෙන් දමලා ජනමත විචාරණය පවත්වපු ආකාරය මතකයි. ඒ නිසා එක්සත් ජාතික පක්ෂය ඒ මැතිවරණ පැවැත්වූ ආකාරයට අපි උතුරේ මැතිවරණය පවත්වන්නේ නැහැයි කියලා විපක්ෂ නායකතුමාට සහතිකයක් ලබා දීමට අපි කැමැතියි. අපි එවැනි දේවල් කරන්නේ නැහැ. ඔබතුමන්ලා ගිනි තැබූ යාපනයේ පුස්තකාලය දැන් අපි සම්පූර්ණ වශයෙන් ප්‍රතිසංස්කරණය කරලා, යාපනයේ ජනතාවට පෙන්වා දීලා තිබෙනවා, අපි එවැනි ජාතිවාදී ස්වරූපයකින් කටයුතු කරන පක්ෂයක් නොවෙයි කියලා. යාපනයේ ජනතාවගේ ශුභ සිද්ධිය සඳහා වැඩිම සංවර්ධනයක් කළ රජයක් හැටියට අපේ රජය හඳුන්වන්න පුළුවන්.

යාපනයේ ජනතාව අපේ ජනාධිපතිතුමාව ඉතා හරසරින් පිළිගත්තා. ඒවා බලෙන් කරවා ගත්ත දේවල් නොවෙයි. ඒ ජනතාව තුළ තිබුණු ඒ සිනහව, ඒ ශක්තිය දැක්කාම අපේ රජය ගෙන යන සංවර්ධන වැඩ පිළිවෙළ උතුරේ ජනතාව තුළ ඉතාම ගැඹුරින් කිඳා බැස තිබෙන බව මා හිතනවා. එම නිසා උතුරේ ජන මතය පිළිබඳව අපට ප්‍රශ්නයක් නැහැ.

ගරු කථානායකතුමනි, මම කියන්නට කැමැතියි අපි උතුරේ මේ ඡන්දය පැවැත්වීමට තීරණය කළේ රජයට ඡන්දය දිනන්න ඕනෑය කියන පරමාර්ථයකින් නොවෙයි කියලා. ඒ පරමාර්ථය ඉෂ්ට වෙයි. ඉෂ්ට වුණත් නැතත් අපට අවශ්‍ය නිදහස් හා සාධාරණ මැතිවරණයක් උතුරේ පවත්වන්නයි.ඒ ගෞරවය අනිවාර්යයෙන්ම අපේ රජය ලබා ගන්නවා.

විශේෂයෙන්ම මම කියන්න කැමැතියි, මැතිවරණ කොමසාරිස්තුමා සහතික කරලා තිබෙනවා නිදහස් හා සාධාරණ මැතිවරණයක් සඳහා වූ අවශ්‍ය සියලුම පියවර එතුමා ගන්නවා කියලා. එතුමාට ඒ සඳහා අවශ්‍ය සම්පූර්ණ ශක්තිය අපේ රජය මඟින් ලබා දෙනවා. ඒ නිසා කිසිම ප්‍රශ්නයක් නැහැ. "කම්පියුටර් ජිල්මාර්ට්" කිව්වා. අන්තිමට election පෙත්සමේ කිසිම "ජිල්මාර්ට්" එකක් ගැන ඇතුළත් කළේත් නැහැ. පෙත්සමත් විසි කරලා දැම්මා. ඒකයි වුණේ. වෙලාවට හදා ගන්නා කථා මිසක් හරයක් ඇති කථා නොවෙයි විපක්ෂයෙන් ඉදිරිපත් කරන්නේ. ඒ නිසා ගරු කථානායකතුමනි, මම විපක්ෂ නායකතුමාට කියන්න කැමැතියි, "ඔබතුමා භය වෙන්න එපා. යන්න මැතිවරණයට, නිදහස් හා සාධාරණ මැතිවරණයක් පවත්වනවා. ඒ සඳහා රජයට ගන්නට පුළුවන් කටයුතු සියල්ල උපරිම අයුරින් අපි ඉෂ්ට කරනවා" කියලා. ඒ බව ප්‍රකාශ කරමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
ඔබතුමාටත්, මටත් බැහැ. අප දෙදෙනාම London යනවා.

මම කියන්න කැමැතියි ආණ්ඩු පක්ෂයට, කෙසේ හෝ හෙට අපිට වාර්තාවක් අරගෙන දෙන්න පුළුවන් නම් හොඳයි කියලා. මට වාර්තාවක් ආවා. අපේ විදේශ විනිමය සංචිතයෙන් ඩොලර් මිලියන 700ක් විකුණලා තිබෙනවා කියලා. අනෙක් අතට මහ බැංකුවෙන් ඩොලර් මිලියන 1000ක බැඳුම්කරයක් ඉල්ලා තිබෙනවා අධික ණය එක්ක. ඉතින් අපිට මේ මුදල් ඕනෑ නම් තිබෙන මුදල් විකුණන්නේ ඇයි කියන එක මට තේරෙන්නේ නැහැ. ඒ නිසා- [බාධා කිරීමක්] නියෝජ්‍ය ඇමතිතුමා හොයා ගෙන හෙට අපිට වාර්තාවක් දෙනවා නම් හොඳයි. මම හිතන්නේ මුදල් අමාත්‍යාංශයෙන් ඒක අරගන්න පුළුවන්. මුදල් අමාත්‍යාංශයේ අනුමැතිය නැතුව මේක කරන්නත් බැහැ. [*Interruption.*]Yes, I know. But, you can make a statement. We are only making a request. It is an urgent matter. If you can tell us tomorrow as to what the amounts involved are and the dates - අපි දැන ගන්න කැමැතියි. ඉස්සර වෙලා මේක ගැන මොකක් හෝ ප්‍රකාශයක් කරන්න. US Dollars seven hundred million has been sold by the Central Bank while you have also asked for a billion dollars in bonds. It does not make sense. If you want money, you should not sell any money. So, I would like to know the reasons for selling money.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ස්ථාවර නියෝග 23(2) යටතේ ප්‍රශ්නය - ගරු අනුර දිසානායක මහතා. සංශෝධනය කළ පරිදි ඉදිරිපත් කරන්න.

## හෙජින් ගිවිසුම සහ ගෙවීමට සිදු වී තිබෙන වන්දි මුදල
## 'ஹெட்ஜின்' உடன்படிக்கையும் செலுத்தவுள்ள நட்டஈடும்
## HEDGING AGREEMENT AND COMPENSATION TO BE PAID

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, ඔබතුමාට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා මේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන්ට අදහස් දැක්වීමට තිබෙන අයිතියත්, ඒ වාගේම පාර්ලිමේන්තුවට තිබෙන මූල්‍ය පාලනය පිළිබඳ වග කීමත් ආරක්ෂා කර ගැනීම වෙනුවෙන් ඔබතුමා විසින් ඊයේ ලබා දෙන ලද නියෝගය සම්බන්ධයෙන්. මා හිතන්නේ විශේෂයෙන්ම මේ පාර්ලිමේන්තුවේ අප කාටත් සම්ප්‍රදායයක් ලෙස භාවිත කළ හැකි තීරණයක් ඔබතුමා ලබා දීලා තිබෙනවා. ඒ තීරණය පිළිබඳව ඔබතුමාට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා. ඒ අනුව 23(2) යටතේ මේ ප්‍රශ්නය මම අද ඉදිරිපත් කරනවා.

ගරු කථානායකතුමනි, මෑත කාලයේ ලංකාවේ සිදු වූ විශාලතම මූල්‍ය පාඩුව හා වංචාව ලෙස ආන්දෝලනයට තුඩු දුන් හෙජින් ගිවිසුමත්, ගෙවීමට සිදු වී තිබෙන වන්දි මුදලත් පිළිබඳව මෙම ගරු සභාවේ අවධානය යොමු කරවමි.

මෙම හෙජින් ගිවිසුමට වග කිව යුත්තේ කවුරුන්ද මෙම ගෙවීමට සිදු වී තිබෙන වන්දි මුදල් කවුරුන් විසින් ගෙවීමට සිදු වන්නේද යන්න පිළිබඳව මේ වන විට සමාජයේ සංවාදයක් පවතී. එහෙයින් හෙජින් ගිවිසුම්වල ඇරඹුමත් මේ දක්වා සිදු වූ ක්‍රියා දාමය පිළිබඳවත් විමර්ශනාත්මකව කරුණු ඉදිරිපත් කළ යුතුව තිබේ. ගරු කථානායකතුමනි, ඒ අනුව මෙම හෙජින් පිළිබඳව අමාත්‍ය මණ්ඩලය වෙත කරුණු ඉදිරිපත් කරනු ලැබුවේ 2006 සැප්තැම්බර් මස 06 වැනි දින පැවැත් වූ අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී ජනාධිපතිතුමාගේ විශේෂ ආරාධනය මත එහි පැමිණි මහ බැංකුවේ අධිපති අජිත් නිවාඩ් කබ්රාල් මැතිතුමා විසිනි. එතුමා සහ එතුමාගේ සහාය නිලධාරින් දෙදෙනෙකු මඟින් "ලෝක වෙළඳ පොළේ ඉහළ යන තෙල් මිල හමුවේ ස්ථායිතාවය පවත්වා ගැනීම" යන මැයෙන් දෘශ්‍යාධාර සහිතව ඉදිරිපත් කිරීමක් සිදු කෙරිණි.

අනතුරුව එදින කැබිනට් මණ්ඩලය විසින් මහ බැංකු අධිපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද විකල්පයන් සම්බන්ධයෙන් තීරණයක් ගත හැකි වීම පිණිස මහ බැංකුව, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය, ඛනිජ තෙල් හා ඛනිජ තෙල් සංවර්ධන අමාත්‍යාංශය, විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය සහ අදාළ වෙනත් ආයතනවලින් සැදුම් ලත් නිලධාරි කණ්ඩායමක් විසින් තවදුරටත් අධ්‍යයනය කර වාර්තාවක් ලබා දීමට තීරණය විය.

ගරු කථානායකතුමනි, මම ඒ කැබිනට් තීරණය හැන්සාඩ්ගත කිරීම සඳහා **සභාගත*** කරනවා.

ඒ අනුව ආචාර්ය පී.බී. ජයසුන්දර මහතා 2006.10.19 වෙනි දින ශ්‍රී ලංකා මහ බැංකුවේ නියෝජ්‍ය අධිපති වයි.එම්.ඩබ්ලිව්.බී. වීරසේකර මහතා, ශ්‍රී ලංකා මහ බැංකුවේ සහකාර අධිපති ආචාර්ය එච්.එන්. තේනුවර මහතා, මහජන බැංකුවේ ප්‍රධාන මූල්‍ය නිලධාරි කපිල ආරියරත්න මහතා, ඛනිජ තෙල් හා ඛනිජ තෙල් සංවර්ධන අමාත්‍යාංශයේ කාන්ති විජේතුංග මහත්මිය, ශ්‍රී ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ලලිත් කරුණාරත්න මහතා හා මුදල් අමාත්‍යාංශයේ වී.කනගසබාපති යන අයගෙන් සමන්විත අධ්‍යයන කමිටුවක් පත් කරන ලදී. එම කමිටුවේ වාර්තාව 2006 නොවැම්බර් මස 16 වන දින ප්‍රධාන නිර්දේශයන් 05කින් සමන්විතව මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත ලබා දී තිබුණි.

ඒ නිර්දේශය මත පදනම්ව 2007.01.13 වන දින කැබිනට් මණ්ඩලය වෙත ඛනිජ තෙල් හා ඛනිජ තෙල් සංවර්ධන අමාත්‍යවරයා විසින් කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කරන ලදී. එම කැබිනට් පත්‍රිකාව එදින සම්මත නොකොට මුදල් අමාත්‍යවරයා ලෙස ජනාධිපතිවරයාගේ නිර්දේශයන් ලබා ගැනීමට කල් තබන ලදී. ඒ අනුව 2007.01.31 වන දින මුදල් අමාත්‍යවරයා ලෙස ජනාධිපතිවරයා විසින් පහත සඳහන් නිර්දේශ ඉදිරිපත් කරන ලදුව, එම නිර්දේශයන්ට යටත්ව 2007.01.31 වන දින පැවැති කැබිනට් මණ්ඩලයේදී මෙම හෙජින් ගිවිසුම සඳහා අවසර ලබා දෙන ලදී. ජනාධිපතිතුමාගේ නිර්දේශයන් වනුයේ:

01. ජාත්‍යන්තර වෙළෙඳ පොළෙන් බොර තෙල් හා පිරිපහදු කළ තෙල් ලබා ගැනීමේදී ලංකා ඛනිජ තෙල් සංස්ථාව හෙජින් ගිවිසුම්වලට යා යුතුය.
02. හෙජින් මෙවලම ලෙස ඉහළ සීමා සහිතව සීරෝ කොස්ට් කොලර් මැතඩ් භාවිතා කිරීමට.
03. ආරම්භයේදී සුළු ප්‍රමාණ සඳහා කෙටි කාලීන ගිවිසුම්වලට ගොස් ක්‍රමයෙන් ප්‍රමාණය හා කාලය වැඩි කිරීමට කටයුතු කිරීම.
04. අනාගත මිල තීරණය කිරීමටත් හෙජින් මෙවලම සඳහා පිළිගත් බැංකුවලින් මිල ගණන් කැඳවීමටත් තෙල් සංස්ථාවට පූර්ණ බලය පැවරීමට.

---

*** *ලියවිල්ල ඉදිරිපත් නොකරන ලදී.***
*ஆவணம் சமர்ப்பிக்கப்படவில்லை.*
*Document not tendered.*

[ගරු අනුර දිසානායක මහතා]

05. කල් යල් බලා හෙජින් ක්‍රමවේද වෙනස් කිරීමේ බලය තෙල් සංස්ථාවට පැවරීමටද නිර්දේශ කරන ලදී.

ඒ අනුව ස්ටැන්ඩර්ඩ් චාර්ටඩ් බැංකුව සමඟ හෙජින් ගිවිසුම් දෙකක්ද, සිටි බැංකුව සමඟ ගිවිසුම් දෙකක්ද, ඩොයිෂ් බැංකුව සමඟ ගිවිසුම් එකක්ද, මහජන බැංකුව සමඟ ගිවිසුම් දෙකක්ද, කොමර්ෂල් බැංකුව සමඟ ගිවිසුම් එකක්ද යනාදී ලෙස 2008.06.01 දින සිට 2008.11.01 දින දක්වා බැංකු පහක් සමඟ ගිවිසුම් අටකට ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් එළඹිනි.

ලෝක වෙළෙඳ පොළේ තෙල් මිල ඉතා ශීඝ්‍ර ලෙස පහත වැටීමෙන් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට අතිවිශාල පාඩුවක් දැරීමට සිදු විය. ඊට ප්‍රධාන ලෙස හේතු වූයේ කැබිනට් මණ්ඩලය විසින් මුදල් අමාත්‍යවරයා ලෙස ජනාධිපතිවරයාගේ නිර්දේශයට යටත්ව හෙජින් මෙවලම් ලෙස "ඉහළ සීමා සහිතව සීරෝ කොස්ට් කොලර් ක්‍රමය" භාවිතා කිරීම හේතුකොටගෙනය. අනතුරුව මෙම අතිවිශාල පාඩුව හේතුකොටගෙන ශ්‍රේෂ්ඨාධිකරණය වෙත මූලික අයිතිවාසිකම් පෙත්සමක් ඉදිරිත් කරන ලද අතර එහිදී ශ්‍රේෂ්ඨාධිකරණය වෙතින් ලබා දෙන ලද තීරණයන් වූයේ හෙජින් ගිවිසුම් අත් හිටුවන ලෙසත්, එහි වාසිය ලෙස පෙට්‍රල් ලීටරයක් රුපියල් 100 බැගින් ජනතාවට ලබා දෙන ලෙසත්ය. එහෙත් එම තීරණය කැබිනට් මණ්ඩලය ප්‍රතික්ෂේප කිරීම හේතුකොටගෙන ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ලබා දෙන තීරණ විධායකය විසින් ක්‍රියාවට නගන්නේ නැතිනම් එවැනි තීරණ ලබා දීමෙන් ප්‍රතිඵලයක් නැතැයි යන තීරණයේ පිහිටා එම මූලික අයිතිවාසිකම් පෙත්සම් ඉවත ලන ලදී.

අනතුරුව සිදු වූයේ එම ගිවිසුම් අත් හිටුවන ලෙස අජිත් නිවාඩ් කබ්රාල් මහතා විසින් නියෝග ලබා දීමයි. එම ගිවිසුම් අත් හිටුවීමට එරෙහිව ස්ටැන්ඩර්ඩ් චාර්ටඩ් බැංකුව විසින් ලන්ඩනයේ වාණිජ අධිකරණය වෙත ඩොලර් මිලියන 162ක් හා අදාළ පොලිය ඉල්ලා නඩුවක්ද, සිටි බැංකුව ඩොලර් මිලියන 200ක්ද, අදාළ පොලිය ඉල්ලා සිංගප්පූරුවේ බේරුම්කාරක මණ්ඩලයක් වෙතද, ඩොයිෂ් බැංකුව ඩොලර් මිලියන 60 හා අදාළ පොලිය ඉල්ලා නඩුවක්ද පවරා ඇත.

පසු ගිය දා ලන්ඩන් වාණිජ අධිකරණයෙන් ඩොලර් මිලියන 162ක් හා අදාළ පොලිය ලබා දෙන ලෙස ඛනිජ තෙල් නීතිගත සංස්ථාව වෙත නියෝගයක් ලබා දී ඇත. ගරු කථානායකතුමනි, මෙම මුදල් මේ රටේ ජනතාවගෙන් අය කරනු ලබන බදු මුදල් මඟින් ගෙවිය යුතුද? කිසිසේත්ම නැත. ඉහත කී මුළු ක්‍රියාවලියම කැබිනට් මණ්ඩලය හා නිලධාරීන් කිහිප දෙනකුගේ මුළුමනින්ම අවබෝධය හා මැදිහත්වීම මත සිදු වූ අවාසිසහගත ගනුදෙනුවකි. එයට කිසි සේත්ම මේ රටේ ජනතාව හවුල් නැත. එහෙයින් එම වන්දි මුදල් එයට හවුල් වූ නිලධාරින්ගෙන් හා දේශපාලනඥයන්ගෙන් අය කර ගත යුතුය. අපේ රටේ පවුල් ලක්ෂ 18කට සමෘද්ධිය ගෙවීම සඳහා ගරු කථානායකතුමනි, වර්ෂයකට වැය වන්නේකෝටි 900යි. රජයේ සියලුම රෝහල් සඳහා බෙහෙත් හා අනිකුත් උපකරණ ලබා දීම වෙනුවෙන් වැය වන්නේ කෝටි 1,100කි. කඩිනම් මහවැලි ව්‍යාපාරය වෙනුවෙන් වැය කොට ඇත්තේ රුපියල් කෝටි 5,000කි. ඒ නිසා ගරු කථානායකතුමනි, ගරු ඇමතිතුමාගෙන් මේ පිළිබඳ පහත ප්‍රශ්න පිළිබඳව අවධානය යොමු කරවනවා.

01. ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට වාසි සහගත ලෙස ශ්‍රේෂ්ඨාධිකරණය විසින් දෙන ලද තීරණය ක්‍රියාත්මක නොකළේ කුමන කරුණ නිසාද?

02. මෙම බැංකු විසින් අධිකරණය වෙත පවරා තිබෙන නඩු වෙනුවෙන් ඛනිජ තෙල් නීතිගත සංස්ථාව වෙනුවෙන් පෙනී සිටීම සඳහා මෙතෙක් වැය කොට ඇති මුළු මුදල කවරේද?

03. මෙම මුදල් ගෙවීම සඳහා කවර ක්‍රියාමාර්ගයක් අනුගමනය කරන්නේද?

උක්ත ප්‍රශ්න පිළිබඳව රජය විසින් මෙම ගරු සභාව දැනුවත් කරනු ඇතැයි බලාපොරොත්තු වන අතර මෙම ගැටලු විසඳීම කෙරෙහි මෙම ගරු සභාවේ දැඩි අවධානය යොමු කරන ලෙසත් ඉල්ලා සිටිනවා.

ගරු කථානායකතුමනි, 23(2) යටතේ මෙම ප්‍රශ්නය ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව නැවත වතාවක් ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මා නතර වනවා. ස්තුතියි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මේ සංශෝධනයට යටත් නොවෙච්ච යම් දෙයක් තිබුණා නම් ඒක හැන්සාඩ් වාර්තාවේ සඳහන් වන්නේ නැහැ. ඒ වාගේම හැන්සාඩ් ගත කිරීම සඳහා ඉදිරිපත් කරපු වාර්තා-

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
සභාගත කරනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
සභාගත කරන්න. හැන්සාඩ් එකේ වාර්තා වන්නේ නැහැ.

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා (ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த - பெற்றோலியக் கைத்தொழில்கள் அமைச்சர்)
(The Hon. A.D. Susil Premajayantha - Minister of Petroleum Industries)
ගරු කථානායකතුමනි, ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා විසින් අද දින පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 23(2) යටතේ කරනු ලැබූ ප්‍රකාශයට සහ අසනු ලැබූ ප්‍රශ්නවලට පිළිතුරු ප්‍රකාශය මේ අවස්ථාවේදී මම ඉදිරිපත් කරමි.

ගරු කථානායකතුමනි, 1960 දශකය ආරම්භ වන විට විදේශ තෙල් සමාගම් කිහිපයක් සතුව තිබූ ලංකාවේ ඛනිජ තෙල් ආනයනය හා බෙදා හැරීම 1961 අංක 28 දරන පනත මඟින් එවකට අග්‍රාමාත්‍ය ගරු සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ සෘජු තීරණය මත ස්ථාපනය කරන ලද ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට පවරා ගෙන රාජ්‍ය ව්‍යවසායක් ලෙස පවත්වා ගෙන යන ලදී. 1965 අවසාන භාගයේදී සපුගස්කන්ද තෙල් පිරිපහදුව ආරම්භ කරන ලද අතර, බොර තෙල් පිරිපහදු කිරීමද ආරම්භ කරන ලදී. 1970 දශකය මුලදී ලෝක තෙල් මිල කෙටි කලකදී ඉහළ ගිය අතර, වරින්වර තෙල් මිල උච්චාවචනය විය.

2001 වර්ෂයේ බලයට පැමිණි රජය එම රජයේ ප්‍රතිපත්තිය මත ඛනිජ තෙල් නීතිගත සංස්ථාව කොටස් තුනකට වෙන් කර තුනෙන් එක් කොටසක් විකිණීම සඳහා භාණ්ඩාගාරයට පැවරූ අතර, තුනෙන් එක් කොටසක් සංස්ථාවට ඉතිරි කරමින්, ඉතිරි තුනෙන් එක ලංකා ඉන්දියානු තෙල් සමාගමට කිසිදු ටෙන්ඩර් කැඳවීමකින් තොරව අමාත්‍ය මණ්ඩල සංදේශ 94/2002/පීර් 2002.08.21 වැනි දින අමාත්‍ය මණ්ඩල සංදේශ තීරණය අනුව ඇමෙරිකන් ඩොලර් මිලියන 75කට විකුණා දමන ලදී. මෙයින් කිසිදු මුදලක් ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට නොලැබුණු අතර ඒ ඩොලර් මිලියන 75න් 45ක් ලංකා ඉන්දියානු තෙල් සමාගමේ කොලොන්නාව ගබඩා සමාගමේ කොටස් සඳහාත්, ඉතිරි ඩොලර් මිලියන 30 තෙල් පිරවුම්හල් 100 සඳහාත් වෙන් කර තිබුණා. ඒ

සමඟ කොලොන්නාව තෙල් ගබඩා පර්යන්ත සමාගම පිහිටුවා ඛනිජ තෙල් බෙදා හැරීම එම සමාගමට පවරන ලද අතර, එම සමාගමේ තුනෙන් එකේ කොටස් ද ඉන්දියන් තෙල් සමාගමට පවරන ලදී. ඒ සමඟ බ්‍රිතාන්‍ය රාජකීය නාවික හමුදාවෙන් ශ්‍රී ලංකා රජය සතු වූ ත්‍රිකුණාමලයේ අක්කර 800ක භූමි ප්‍රදේශයක පිහිටි තෙල් ගබඩා ටැංකි 102ක් ද ලංකා ඉන්දියානු තෙල් සමාගමට පවරා දෙන ලදී.

එකී අමාත්‍ය මණ්ඩල සන්දේශය හා ඉන් පසු 2003.07.03 දිනැති අමාත්‍ය මණ්ඩල සන්දේශවල තීරණ ක්‍රියාත්මක කළේ නම් අද ඛනිජ තෙල් නීතිගත සංස්ථාව නමින් ආයතනයක් නොපවතිනු ඇත. එම අමාත්‍ය මණ්ඩල සන්දේශය මා ළඟ තිබෙනවා. එහි සඳහන් අනෙක් කරුණු ගැන අදාළ අවස්ථාවකදී විස්තර ඉදිරිපත් කරන්නට පුළුවන්. මේ අවස්ථාවේදී මා සැකෙවින් පමණක් කරුණු ඉදිරිපත් කරනවා.

විකිණීම සඳහා භාණ්ඩාගාරයට පවරා තිබූ 1/3 කොටස සඳහා ටෙන්ඩර් කැඳවා තිබුණි. 2004 බලයට පැමිණි රජය එය අත්හිටුවන ලදී. පසුව වත්මන් රජය 2009 දී එම 1/3 කොටස ද ඛනිජ තෙල් සංස්ථාවට පවරා දෙන ලදී. තෙල් සංස්ථාව ආරම්භයේ සිට සතුව තිබූ අතුරු නිෂ්පාදන ව්‍යාපාර එකිනෙක පෞද්ගලීකරණය කර තිබූ අතර, 2004 වන විට ඛනිජ තෙල් සංස්ථාව සතු වුණේ ඛනිජ තෙල් ආනයනය හා අළෙවිය පමණි. ඛනිජ තෙල් බෙදා හැරීම කොළොන්නාව පර්යන්ත ගබඩා සමාගම සතුව පවතී. 1988 දී දහම් විමලසේන මහතා සභාපතිව සිටියදී "Coastal Bermuda" සිද්ධිය අනුව තෙල් ටොන් 1,23,000ක් සම්බන්ධව විශ්‍රාම ලත් ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාර සෝසා මහතාගේ වාර්තාවේ නිදේශ අනුව වග කිව යුත්තනට එරෙහිව කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

වර්ෂ 2006 වන විට ලෝක වෙළඳ පොළේ ඛනිජ තෙල් මිල ශීඝ්‍රයෙන් ඉහළ යාමේ ප්‍රවණතාවක් දක්නට විය. ඇමෙරිකන් ඩොලර් 45ක් පමණ වූ තෙල් බැරලයක සමාන්‍ය මිල ඇමරිකන් ඩොලර් 147.50 දක්වා 2007 අවසන් වන විට ඉහළ ගිය අතර, එය ඇමරිකන් ඩොලර් 200 දක්වා ඉහළ යනු ඇතැයි පුරෝකථනය කර තිබිණි. ශ්‍රී ලංකා රජය නැගෙනහිර මානුෂික මෙහෙයුම අවසන් කර වන්නි මෙහෙයුම ආරම්භ කර තිබුණි. මානුෂික මෙහෙයුම සඳහා විශාල මුදලක් ආරක්ෂක අංශ වෙත වෙන් කරන අතර, අත්‍යවශ්‍ය භාණ්ඩ මිල පාලනය ද ශීඝ්‍රයෙන් ඉහළ යන ලෝක වෙළඳ පොළේ තෙල් මිල අනුව මෙරට තෙල් මිල පාලනය ද අත්‍යවශ්‍ය විය.

මේ අනුව ඉහත කී තත්ත්වයන් දැඩි අවධානයකට ලක් කළ රජය තෙල් මිල ඉහළ යාමේ අවදානම පාලනය කිරීම සඳහා ලෝකයේ පිළිගත් වෙළඳ සම්ප්‍රදායයන් මත හෙජින් ගිවිසුම්වලට යාමේ අවශ්‍යතාව ගැන ප්‍රතිපත්තිමය තීරණයක් ගන්නා ලදී. මේ සම්බන්ධව 2006 ඔක්තෝබර් මස කමිටුවක් පත් කරන ලද අතර, එම කමිටුවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම ප්‍රතිපත්තිමය තීරණයක් වූ අතර, ඉතා සුළු ප්‍රමාණයක් සඳහා ගිවිසුම්වලට එළඹීමේ හැකියාවක් තෙල් සංස්ථාවට පැවරිණි. ඒ අනුව විදේශ වාණිජ බැංකු 3ක් හා දේශීය වාණිජ බැංකු 2ක් සමඟ ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ගිවිසුම්වලට එළඹ තිබිණි. මෙම ගිවිසුම්වලට 2007/2008 වර්ෂවලදී එළඹ ඇත.

2008 වර්ෂයේ මැද භාගය වන විට ලෝක ආර්ථික අවපාතයකට ලෝකයේ බොහෝ රටවල් ගොදුරු විය. වෙළඳ පොළ ආර්ථික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වූ බොහෝ බටහිර රටවල් දැඩි ආර්ථික අවපාතයකට ගොදුරු වූ අතර, ආර්ථික වර්ධන වේගය ඍණ මට්ටමට වැටිණි. ඇමෙරිකාව, එංගලන්තය වැනි රටවල පවා ප්‍රධාන පෙළේ වාණිජ බැංකු කඩා වැටිණි. නිවාස උකස් බැංකු බංකොලොත් විය.

එම රටවල මිලියන ගණනාවක් ජනතාවට උකස් කර ලබා ගත් නිවාස අහිමි විය. නිවාස වෙළෙඳ පොළ මිල සියයට 50 දක්වා පහළ වැටිණි. මෙම ලෝක ආර්ථික අවපාතයෙන් තවමත් ලෝකයේ බොහෝ රටවල් මිදී නැත.

එල්ටීටීඊ ත්‍රස්තවාදයෙන් රට මුදවා ගැනීමේ මානුෂික මෙහෙයුමක යෙදී සිටි ශ්‍රී ලංකා රජයට, අද මෙන්ම එදාත් විපක්ෂයේ විවේචන හා සාවද්‍ය චෝදනා මත හා මානුෂික මෙහෙයුමේ ජයග්‍රහණය නුරුස්සන ඇනුම් පදවලටද ලක් වෙමින් මානුෂික මෙහෙයුම අවසන් කිරීමටත්, එම වකවානුව තුළදීම ලෝක ආර්ථික අවපාතයේ බියකරු ප්‍රතිඵල ශ්‍රී ලංකා ආර්ථිකයට බලපෑමේ ප්‍රවණතාවෙන් රට ගලවා ගැනීමේ දැවැන්ත අභියෝගයටත් මුහුණ දීමට සිදු විය.

ලෝක ආර්ථික අවපාතය හමුවේ ලෝකයේ තෙල් මිල කෙටි කාල පරාසයක් තුළදී ශීඝ්‍රයෙන් පහළ ගිය අතර, 2008 අවසන් භාගය වන විට තෙල් බැරලයක සාමාන්‍ය මිල US Dollars 45 දක්වා පහත වැටිණි. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මුදල් පනතේ ප්‍රතිපාදන මත හෙජින් ගිවිසුමට අදාළ බැංකු සඳහා නියෝග නිකුත් කළේ ඛනිජ තෙල් සංස්ථාවට විය හැකි අගතිය වළක්වා ගැනීම සඳහායි. මේ අතර හෙජින් ගිවිසුමට සම්බන්ධ මූලික අයිතිවාසිකම් පෙත්සම් ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනු කරන ලදී. ඒ සම්බන්ධ නියෝග නිකුත් වූ අතර, පෙට්‍රල් මිල සම්බන්ධ නියෝගයක්ද නිකුත් විය. මේ අතර 2008 දෙසැම්බර් මස 30 දින ඉදිරිපත් වූ "ලෝක අර්ථික පසු බෑම හමුවේ ශ්‍රී ලංකාවේ ආර්ථිකය ශක්තිමත් කිරීම" මැයෙන් වූ අමාත්‍ය මණ්ඩල සන්දේශය මඟින් දේශීය ව්‍යාපාර, අපනයන කර්මාන්ත, සමස්ත ආර්ථිකයට ලෝක ආර්ථික අවපාතයේ බලපෑම යන කරුණු සලකා බලා තීරණ කිහිපයක් ගන්නා ලදී. මේ සඳහා රජයට රුපියල් බිලියන 16ක් වැය වෙතැයි ඇස්තමේන්තු කරන ලද අතර, යම් හෙයකින් එවකට පෙට්‍රල් මිල රුපියල් 100 දක්වා අඩු කළේ නම් අතිරේක වැයක් දැරීමටද සිදු විය හැකිව තිබුණි.

ඒ අනුව ඛනිජ තෙල් මත බදු අනුපාත එලෙසම පවත්වා ගෙන යාම, නිෂ්පාදන හා අපනයන ක්ෂේත්‍ර දිරි ගැන්වීම සඳහා ඩීසල්, භූමිතෙල් හා දැව් තෙල් මිල පහත දැමීම මෙම ක්ෂේත්‍රයට අදාළ විය. ඒ අනුව පෙට්‍රල් ලීටරයක මිල රුපියල් 2කින්ද, ඩීසල්, භූමිතෙල් හා දැව් තෙල් ලීටරයක මිල රුපියල් 10කින්ද පහත දැමීමට යෝජනා විය.

මීට පෙර 2008 නොවැම්බර්, දෙසැම්බර් මාසවලදී ඩීසල් ලීටරයක් රුපියල් 40කින්, භූමිතෙල් ලීටරයක් රුපියල් 40කින්, පෙට්‍රල් ලීටරයක් රුපියල් 37කින්, දැව් තෙල් ලීටරයක් රුපියල් 35 සහ රුපියල් 40 අතර ප්‍රමාණයකින් පහත දමා තිබුණි. එම නිසා පෙට්‍රල් මිල සම්බන්ධව ශ්‍රේෂ්ඨාධිකරණ නියෝගය ක්‍රියාත්මක නොවූ අතර, එවිට ශ්‍රේෂ්ඨාධිකරණය මඟින් හෙජින් ගිවිසුමට සම්බන්ධව එතෙක් නිකුත්ව තිබූ නියෝග අහෝසි කර ගොනු කර තිබූ පෙත්සම් තීරණයකින් තොරව අවසන් කර නිමා කරන ලදී.

රජය මඟින් ලෝක ආර්ථික අර්බුදය, මානුෂික මෙහෙයුම වැනි යෝධ අභියෝගවලට මුහුණ දෙමින් ශ්‍රී ලංකා ආර්ථිකය කඩා නොවැටී පවත්වා ගෙන යාමට ප්‍රතිපත්තිමය තීන්දු ගන්නා ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස මානුෂික මෙහෙයුම 2009 මැයි 19 වන දින නිමා කළ අතර, ආර්ථික වර්ධනය සියයට 8 දක්වා ගෙන ඒමට කටයුතු කර ඇත.

2009 අප්‍රේල් වන විට ඇමෙරිකන් ඩොලර් බිලියන 1.2ක පහත මට්ටමක තිබූ විදේශීය සංචිතය මේ වන විට ඇමෙරිකන් ඩොලර් බිලියන 6.5 ඉක්මවා ඇත. මේ වන විට ශ්‍රී ලංකාව සම්බන්ධව මූල්‍ය විශ්වසනීයත්වය කිහිප ගුණයකින් වැඩි වී ඇත. මෙයින් පැහැදිලි වන්නේ රජය ගත් ප්‍රතිපත්තිමය තීන්දු සෑම විටම රටේ යහපත වෙනුවෙන් ගන්නා ලද බවයි; ඒවා සද්භාවයෙන් ගන්නා ලද තීරණ බවයි. මෙහි ප්‍රතිඵල අද ලැබී ඇත. ඕනෑම

[ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා]

වාර්ගිකයෙකුට දිවයිනේ ඕනෑම තැනක බියෙන් සැකෙන් තොරව යෑම්, ඊම් කළ හැක. රට විශාල සංවර්ධන මාවතකට යොමු වී ඇති බව ජාත්‍යන්තර මූල්‍ය ආයතන පවා පිළිගෙන ඇත.

ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමාගේ ප්‍රකාශයෙන් නඟා ඇති ප්‍රශ්න සම්බන්ධයෙන් අවධානය යොමු කර පිළිතුරු ඉදිරිපත් කරමි. ප්‍රථමයෙන්ම කිව යුත්තේ එම ප්‍රකාශයේ ජනාධිපතිවරයාගේ නිර්දේශ ලෙස දක්වා ඇති කරුණු 05 නිර්දේශ කර ඇත්තේ කමිටුව මඟින් බවයි. මුදල් අමාත්‍යාංශය මඟින් කරනු ලබන්නේ ඒ සඳහා නිරීක්ෂණ -observations - ඉදිරිපත් කිරීමයි. ඒ නිසා ජනාධිපතිවරයා විසින් නිර්දේශ ඉදිරිපත් කර එම කරුණු පහ ඉදිරිපත් කිරීම යනුවෙන් දැක්වීම සාවද්‍ය බව සඳහන් කරමි.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ෆවුසි ඇමතිතුමා කැබිනට් පත්‍රයක් ඉදිරිපත් කරනවා. ජනාධිපතිතුමා නිරීක්ෂණ ලෙස තිබෙන ඒ සියල්ල අනුමත කර තිබෙනවා.

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
ඔබතුමා කියපු කරුණු පිළිබඳව ගැටලුවක් නොවෙයි තිබෙන්නේ. මෙකේ ක්‍රියා පිළිවෙත තමයි කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කළාම ඇමතිවරයෙක් මුදල් අමාත්‍යාංශයේ නිර්දේශ ඉල්ලීම. ෆවුසි ඇමතිතුමා විසින් ඒ කැබිනට් පත්‍රිකාව ඉදිරිපත් කළේ අර කමිටුවේ නිර්දේශ පදනම් කර ගෙනයි. එතකොට ඒ කමිටුවේ නිර්දේශ තමයි තිබුණේ. එහෙම නැතුව ජනාධිපතිතුමා නිර්දේශ ඉදිරිපත් කළේ නැහැ ඔය කරුණු පහ - [බාධා කිරීමක්] ඒ observations. [බාධා කිරීමක්]ඒක සම්ප්‍රදායික -[බාධා කිරීමක්] නැහැ, හරි. ඒ විෂය භාර අමාත්‍යවරයා තමයි නිර්දේශ ඉදිරිපත් කරන්නේ. මුදල් අමාත්‍යාංශයේ නිරීක්ෂණ. ඒක නිරීක්ෂණයක් මිසක් නිර්දේශයක් නොවෙයි. නිර්දේශ ඉදිරිපත් කළේ කමිටුව විසින්. ඒ කමිටුව විසින් ඉදිරිපත් කරපු නිර්දේශ තමයි එවකට හිටපු විෂය භාර අමාත්‍යවරයා විසින් කැබිනට් පත්‍රිකාවෙන් ඉදිරිපත් කර තිබෙන්නේ. ඒ නිසා ඔබතුමාගේ ප්‍රකාශයේ සඳහන් කරුණු සාවද්‍ය බවයි මම මෙහිදී පෙන්වා දුන්නේ.

ඊ ළඟට ඔබතුමා නඟා තිබෙන ප්‍රශ්නවලින් දෙවැනි ප්‍රශ්නයට අදාළ පිළිතුර මෙයයි. රජයේ ප්‍රතිපත්ති තීරණ මත සමස්ත ආර්ථිකය ගැන සලකා මුලින් සඳහන් කළ පරිදි රජය විසින් තීරණ ගන්නා ලද අතර, එවකට පැවති බදු ප්‍රතිපත්තිය මත පිහිටා කටයුතු කිරීම නිසා පෙට්‍රල් මිල රුපියල් 100 දක්වා අඩු කිරීමට නොහැකි විය. මෙම තීරණය ක්‍රියාත්මක නොවූ නිසා ශ්‍රේෂ්ඨාධිකරණය විසින් මුල් නියෝග අහෝසි කර ඇත. බදු තීරණ කිරීම රජයේ කාර්යයක් වන අතර, බදු පැනවීම අනුමත කරන්නේ පාර්ලිමේන්තුව මඟිනි.

අනික් ප්‍රශ්නයට පිළිතුර මෙයයි. නීති කටයුතු සඳහා වැය කරනු ලබන මුදල් මෙතෙක් නිශ්චිතව දන්වා නැති අතර ඕනෑම නීති කටයුත්තකදී මුදල් වැය කළ යුතුව ඇත.

නමුත් ඉදිරි දිනකදී මේ සියලු සංඛ්‍යා ලේඛන ඉදිරිපත් කළ හැකි බව දැනුම් දෙමි. අවසන් ප්‍රශ්නයට පිළිතුර මෙයයි. ලන්ඩන් වාණිජ මහාධිකරණයේ නඩු තීන්දුවට එරෙහිව අභියාචනයක් ගොනු කර ඇති අතර, අවසන් තීන්දුවක් ලැබෙන තෙක් අදාළ වන මුදල නිශ්චය කළ නොහැක. නඩුවල ස්වභාවය එයයි. එම නිසා දැනට දක්වා ඇති මුදල් ගෙවීමේ අවශ්‍යතාව පැන නොනඟී.

රජය සෑම විටම මහජන යහපත වෙනුවෙන් කටයුතු කරන අතර, ඛනිජ තෙල් සංස්ථාවට හෝ රටට අගතිදායක නොවන ලෙස කටයුතු කිරීම රජයේ අභිලාෂයයි. ඒ සඳහා අවශ්‍ය සියලු ක්‍රියා මාර්ග නීති උපදෙස් මත ගැනීමට කටයුතු කරනු ලැබේ. ඉදිරියේදී විනිශ්චයට භාජනය වීමට නියමිත නීති කෘත්‍යයන් ඇති බැවින් නීති උපදෙස් සැලකිල්ලට ගෙන මෙම කරුණු මෙම ගරු සභාවට ඉදිරිපත් කරමි.

ගරු කථානායකතුමනි, රටට බලපාන කරුණු පිළිබඳව අවධානය යොමු කිරීම විපක්ෂයේ මෙන්ම රජයේ කාර්ය බව පෙන්වා දෙන අතරම වසර 30ක් තිස්සේ විසඳා ගැනීමට නොහැකි වූ ත්‍රස්තවාදී ගැටලුව සාර්ථකව නිම කළ රජය වග කීමකින් යුතුව රට සංවර්ධනය කරන අවස්ථාවක ජාත්‍යන්තරව හා දේශීයව ඉදිරිපත් වන ඕනෑම අභියෝගයකට වග කීමෙන් හා සෘජුව මුහුණ දෙමින් ආර්ථිකය ශක්තිමත් කර ශ්‍රී ලාංකීය ජනතාව රජයට ලබා දී ඇති වරම අනුව වගකීම් ඉටු කරන බව ප්‍රකාශ කිරීමට කැමැත්තෙමි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ශෝක ප්‍රකාශ යෝජනා, හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී අභාවප්‍රාප්ත ගරු ටිරෝන් ප්‍රනාන්දු මහතා.

## ශෝක ප්‍රකාශය: ගරු ටිරෝන් ප්‍රනාන්දු මහතා
## அனுதாபத் தீர்மானம்: மாண்புமிகு ரிறோன் பெர்னாண்டோ
## VOTE OF CONDOLENCE: HON. TYRONNE FERNANDO

[අ. භා. 2.20]

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா - நீர்ப்பாசன, நீர்வள முகாமைத்துவ அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Nimal Siripala de Silva - Minister of Irrigation and Water Resources Management and Leader of the House of Parliament)
ගරු කථානායකතුමනි, කොළඹ දිස්ත්‍රික්කයේ ජනතාව නියෝජනය කරමින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හා අමාත්‍යවරයකු වශයෙන් මෙම උත්තරීතර සභාව ශෝභාවත් කරන ලද ප්‍රවීණ දේශපාලනඥයකු වූ උතුරු නැගෙනහිර හිටපු ආණ්ඩුකාර ජනාධිපති නීතිඥ ටිරෝන් ලයිල් ඩිලානෝ ප්‍රනාන්දු මැතිතුමාගේ අභාවය පිළිබඳ ශෝකය පළ කිරීමේ යෝජනාව මම මේ අවස්ථාවේදී ගරු සභාවට ඉදිරිපත් කරන්නෙමි.

ශ්‍රී ලංකා ඉතිහාසයේ සුවිශේෂ සන්ධිස්ථානයක් සනිටුහන් කළ වීර පුරන්අප්පුගේ පරපුරින් පැවත ආ සිවිල් සේවකයකු වූ සී. ෂෙල්ටන් ප්‍රනාන්දු මහතාගේත් එඩ්ගා ප්‍රනාන්දු මහත්මියගේත් දයාබර පුත්‍ර රත්නයක් ලෙස 1941 අගෝස්තු මස 08 වන දින මහනුවරදී මෙලොව එළිය දුටු ටිරෝන් ප්‍රනාන්දු මහතා කොළඹ රාජකීය විද්‍යාලයේ දීප්තිමත් ආදී ශිෂ්‍යයෙකි. පාසල් අධ්‍යාපනයෙන් පසු එංගලන්තයේ ඔක්ස්ෆර්ඩ් සරසවියට ඇතුළත්ව වැඩිදුර අධ්‍යාපනය හදාරද්දී එම විශ්වවිද්‍යාලයේ අප්‍රිකානු හා ආසියානු සංගමයේ සභාපතිවරයා ලෙස එතුමා කටයුතු කළ අතර, එහි කම්කරු සංගමයේ සභාපති ධුරයටද පත් වූයේ එම තනතුරට පත් ප්‍රථම ආසියාතිකයා ලෙස වාර්තාවක්ද පිහිටුවමිනි.

ඔක්ස්ෆර්ඩ් සරසවියෙන් ශාස්ත්‍රපති උපාධිය හා නීති උපාධිය ලත් එතුමා ලන්ඩනයේ පුවත් පත් කලා විදුහලෙන් ඩිප්ලෝමා උපාධියක්ද හිමි කර ගෙන පෙරළා සිය රට පැමිණ අපරාධ නීතිය පිළිබඳව හදාළේය. එම ක්ෂේත්‍රයේ ප්‍රවීණයෙකු බවට පත් වෙමින් සුප්‍රසිද්ධ පෝලින් කෲස් නඩු විභාගයේදී පැමිණිල්ල මෙහෙයවමින් සිය දස්කම් රටට විදහා පෑවේය. මිනී මැරුමක් සඳහා බස් රථයක් යොදා ගත් බව ඔප්පු කළ රජයේ නීතිඥයෙකු ලෙස නීති අංශය තුළ ප්‍රකට වූ ටිරෝන් ප්‍රනාන්දු මහතා පසු කලෙක ජනාධිපති නීතිඥවරයෙකු වශයෙන්ද දිවුරුම් දුන්නේය.

පසු කාලීනව දේශපාලනයට සම්බන්ධ වූ ප්‍රනාන්දු මහතා 1974 දී එක්සත් ජාතික පක්ෂ තරුණ වෘත්තීය කණ්ඩායමේ ලේකම් වශයෙන් ක්‍රියාකාරී දේශපාලනයට පිවිසි අතර, එවකට පක්ෂ නායකත්වය දැරූ ජේ.ආර්. ජයවර්ධන මහතා විසින් මොරටුව එක්සත් ජාතික පක්ෂ ප්‍රධාන සංවිධායක ලෙස පත් කරන ලදී. 1977 වසරේදී වැඩි ඡන්ද 15,000ක් පමණ ලබා ගනිමින් මොරටුව මහජන මන්ත්‍රීවරයා වශයෙන් පළමු වරට මෙම උත්තරීතර සභාවට පිවිසි එතුමා 1979 දී විදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍යවරයා ලෙසත්, 1989 දී අධිකරණ නියෝජ්‍ය අමාත්‍යවරයා ලෙසත් ජනතා සේවාවේ නියැලිණ. බන්ධනාගාර නීති ප්‍රතිසංස්කරණ අමාත්‍ය ධුරයද එතුමා වෙත ඉන් අනතුරුව පැවරිණ.

1993 දී ජනමාධ්‍ය අමාත්‍යවරයා වශයෙන් තවත් ජනතා මෙහෙවරක යෙදුණ එතුමා ජාතික චිත්‍රපටි සංස්ථාව අනුබද්ධිතව ජාතික චිත්‍රපටි සංවර්ධන අරමුදල ඇති කිරීමෙහිලා මූලිකව කටයුතු කළේය. පෞද්ගලික ගුවන් විදුලි සහ රූපවාහිනී නාලිකා රාශියක් ඇති කරමින් හා ජනමාධ්‍ය ක්ෂේත්‍රයේ ස්වාධීනත්වය තහවුරු කිරීමේ කාර්ය සඳහා දායක වෙමින් විද්‍යුත් මාධ්‍යය ඉහළ තලයකට ගෙන ඒමට පුරෝගාමීව කටයුතු කළ ප්‍රනාන්දු මහතා 2001 වසරේ දෙසැම්බර් මාසයේදී විදේශ කටයුතු ඇමතිවරයා ලෙස තවත් වගකීමක් බාර ගත්තේය. එම කාලය තුළදී ජාත්‍යන්තරය හා කලාපීය සමුළුවලදී ශ්‍රී ලංකාව නියෝජනය කරමින් ගැටුම්වලින් තොර අනාගතයක් පිළිබඳව ශ්‍රී ලංකාවේ දැක්ම පැහැදිලිවම කියා පෑමට සමත් විණ.

පක්ෂ, විපක්ෂ කවර දේශපාලකයෙකු සමඟ වුවද සුහදශීලීව කටයුතු කිරීමේ දක්ෂතාවකින් පිරිපුන්ව සිටි මෙම මානව හිතවාදියා ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය ජාත්‍යන්තරය තුළ සාර්ථක ලෙස ප්‍රචලිත කිරීමට කැප වූ අතර, එතුමා තුළ පැවති දක්ෂතාව මනාව තේරුම් ගත් ලෝක ප්‍රජාව එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහ ලේකම් ධුරය සඳහා ලෝකයේ රටවල් රැසක සහාය ලබා දීමට සැදී පැහැදී සිටියත් අවසන් මොහොතේදී එය අප රටට අහිමි විණ.

මොරටුව හා පානදුර යා කෙරෙන නව ගාලු පාර කිලෝමීටර් අටක දිගකින් යුතුව නිම කොට ගාලු පාරේ වාහන තදබදය අවම කරමින් මොරටුව නගරය නව නගරයක් බවට පත් කිරීමට එතුමා දැක් වූ දායකත්වය ප්‍රශංසනීයයි. 1991 සිට ශ්‍රී ලංකා ක්‍රිකට් පාලක මණ්ඩලයේ සභාපති වශයෙන් කටයුතු කරමින් 1996 දී ලෝක කුසලානය ජයග්‍රහණය කිරීම සඳහා අවශ්‍ය පසුබිම සකස් කර දුන් අතර, වල් බිහිව පැවැති සොයිසා ක්‍රීඩාංගණය නවීකරණය කර ටිරෝන් ප්‍රනාන්දු ක්‍රීඩාංගණය යනුවෙන් නම් කර ලොව 67වැනි ජාත්‍යන්තර ටෙස්ට් ක්‍රිකට් ක්‍රීඩාංගණය ලෙස බිහි කිරීමට දැක් වූ දායකත්වය අති උදාරය.

මොරටුවේ පන්දාහකට අධික පැල්පත්වාසීන් පිරිසකට "හිසට සෙවනක්, හිතට නිවනක්" වැඩසටහන යටතේ නිවාස යෝජනා ක්‍රම ගණනාවක් ඉදි කර ජනතා අයිතියට පවරා දුන් ප්‍රනාන්දු මහතා මොරටුව වෙරළ ඛාදනය වැළැක්වීම සඳහා විදේශ ආධාර ලබා ගනිමින් කිලෝමීටර් 12ක් දුරට ආරක්ෂිත ගල් බැම්මක් ඉදි කරවීමට කටයුතු කළේය. නව පාසල් තුනක් ඉදි කර සිසු අයිතියට පැවරීම, අධිකරණ සංකීර්ණ හා කාර්මික විද්‍යාල ඉදි කරවීම, ප්‍රජා ශාලා සංකල්ප හඳුන්වා දෙමින් සෑම ගමකටම ප්‍රජා ශාලා ඉදි කර දීම වැනි උත්තරීතර සේවාවන් රැසක්ද එතුමාගේ කැපවීම මත මොරටුව පුරවරයට ලැබිණි.

එතුමාගේ ජීවිතය විවිධ මං පෙත් ඔස්සේ ගලා ගිය අතර, "100 Days in Sri Lanka", "Kings of Cricket", "Action in Opposition" "Trial of Pauline de Croos" සහ "ගිනි දැල් මැදින්" වැනි සිංහල හා ඉංග්‍රීසි බසින් මුද්‍රිත අගනා පොත් රැසක් සාහිත්‍යකරුවකු වශයෙන් පාඨකයා වෙත ලබා දුන්නේය. කලාකාමියකු වශයෙන් "වීර පුරන්අප්පු" සහ "කොළඹ සන්නිය" නමැති සිංහල චිත්‍රපට දෙකක් ද නිෂ්පාදනය කරමින් තවත් ක්ෂේත්‍රයකින් ජනතා සිත්සතන් තුළට සතුටක් ලබා දුන්නේය.

2004 වසර තෙක් පැවැති සියලු මැතිවරණවලින් ජයග්‍රහණය කරන ලද එතුමා එම වසරේ පැවැති මහ මැතිවරණයෙන් පසු එක්සත් ජාතික පක්ෂයෙන් ඉවත්ව රජය හා සම්බන්ධ විය. එම අවස්ථාවේ දී චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග ජනාධිපතිතුමිය විසින් එතුමා තුළ පැවැති දක්ෂතාවන් මැනවින් වටහා ගනිමින් උතුරු නැඟෙනහිර ආණ්ඩුකාර ධුරය පිරිනමන ලදී. උතුරේ යුද ගිනිදැල් නිවා දැමීමේ ඉමහත් බලාපොරොත්තුවකින් කටයුතු කළ ටිරෝන් ප්‍රනාන්දු මහතාට මහින්ද රාජපක්ෂ මැතිතුමා ජනාධිපති ධුරයට පත් වීමෙන් පසුව එතුමාගේ ජාත්‍යන්තර කටයුතු පිළිබඳ උපදේශක තනතුර භාර ගැනීමට සිදු විය.

ප්‍රංශයේ ශ්‍රී ලංකා තානාපතිවරයා වශයෙන් පත්ව යෑමට සියලු කටයුතු සූදානම්ව තිබියදී කිසිවකුත් බලාපොරොත්තු නොවූ මොහොතක රටටත්, ජාතියටත් ඉමහත් මෙහෙවරක නියැලුණු, මානව හිතවාදී ගුණයෙන් යුතු වූ කීර්තිමත් දේශපාලනඥයකු වූ ටිරෝන් ප්‍රනාන්දු මහතා මොරටුව ප්‍රදේශවාසීන්ට පමණක් නොව, මහත්මා දේශපාලනය අගයන සැමටම වේදනාවක් ගෙන දෙමින් 2008 පෙබරවාරි 26 වැනි දින සදහටම දෙනෙත් පියා ගත්තේය. එවැනි සුවිශේෂී ගුණාංග සමුදායකින් පිරිපුන් උදාර පුද්ගලයකුගේ අභාවයෙන් ඇති වූ පාඩුව පිරිමසා ගැනීම පහසු කාර්යයක් නොවේ.

ගරු කථානායකතුමනි, අමාත්‍ය ධුර ගණනාවක් හොබවමින් හා විවිධ ක්ෂේත්‍ර ගණනාවක් නියෝජනය කරමින් රටේ අභිවෘද්ධිය වෙනුවෙන්ද, මොරටුව ප්‍රදේශයේ ජනතාවගේ අවශ්‍යතා ඉටු කරමින් එම ප්‍රදේශයේ උන්නතිය වෙනුවෙන්ද අනුපමේය සේවාවක් ඉටු කළ කොළඹ දිස්ත්‍රික්කයේ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී සහ හිටපු අමාත්‍ය, උතුරු නැඟෙනහිර ආණ්ඩුකාර, ජනාධිපති නීතිඥ ටිරෝන් ලයිල් ඩිලානෝ ප්‍රනාන්දු මැතිතුමාට මොක් සුව ප්‍රාර්ථනා කරන අතර, මෙම පාර්ලිමේන්තුවේ ශෝකය එතුමාණන්ගේ දයාබර දියණිය ටෙහානි මැතිව් ප්‍රනාන්දු මහත්මිය ඇතුළු පවුලේ ඥාතීන් වෙත දන්වා යවන ලෙස යෝජනා කර සිටිමි.

[අ. භා. 2.29 ]

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**

(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க - எதிர்க்கட்சி முதல்வர்)

(The Hon. Ranil Wickremasinghe - Leader of the Opposition)

Hon. Speaker, I wish to associate myself with the sentiments expressed by the Hon. Leader of the House. Tyronne and I both, came to Parliament in 1977. I had taken oaths as a lawyer and joined the party in 1972. At that time, Tyronne had just left the Official Bar. He had worked in the Attorney-General's Department. He was well-known for leading the prosecution in the Pauline de

[ගරු රනිල් වික්‍රමසිංහ මහතා]

Croos case. Thereafter, he practised in the Private Bar and then joined us in 1974. He became the organizer for the Moratuwa Electorate after the death of Ruskin Fernando.

Tyronne was always interested in politics from the days he was in the Oxford University itself. I got to know him only after he joined the UNP and was organizing the Moratuwa Electorate. In 1977, both of us got elected as Members of Parliament to the Second National State Assembly. I became the Deputy Minister of Foreign Affairs. He was a back-bencher. After I gave up the portfolio of Deputy Minister of Foreign Affairs upon being appointed a Minister, Tyronne succeeded me and worked under the Hon. A.C.S. Hameed, who was then the Minister of Foreign Affairs. Tyronne always had an interest in foreign affairs; I would even call it his a hobby. He followed what was happening. That interest was there. That was the reason why I made him the Minister of Foreign Affairs in 2001 when I became the Prime Minister. During that period, Tyronne was responsible for the development of the Moratuwa Electorate. The Leader of the House mentioned about the new bridge which connects Panadura and Moratuwa. I know the opposition he had to build that. Then, of course, we have the cricket stadium.

He was also instrumental in getting many housing schemes there. He intervened with the then Prime Minister, the Hon. Ranasinghe Premadasa and ensured that flats and the housing schemes were put up there. I remember working with him to ensure the development of the schools in the Moratuwa Electorate and finally with his help, we located the Apprenticeship Training Institute in Moratuwa, within the boundaries of the Ratmalana and Moratuwa Electorates. He took a personal interest in the development of the Moratuwa Electorate. What it is today is due to the late Hon. Tyronne Fernando. Tyronne was also the Minister of Legal and Prison Reform. He was also responsible for information and broadcasting. Then, he had a stint in the Opposition where he sat in the Front benches. He was always a good debater and finally he was in this House as the Minister of Foreign Affairs. He left our party and joined the SLFP subsequently.

Tyronne was very interested in cricket. That is why he became the President of the Board of Control for Cricket. Those days, Hon. Speaker, the position of the President of the Board of Control for Cricket was an honorary one. People like Tyronne had to spend out of their pockets. They did not make any money. Even from the Tyronne Fernando Stadium that was built, I can assure you, that he did not make a cent. Unfortunately, cricket has come to such depths that we wish that there were gentlemen like him. Certainly, Tyronne played his part in ensuring that the Sri Lankan Cricket Team was prepared for the World Cup 1996. He wrote a book on it. Arts and literature was also another strong point with him. We know him as a film producer and the books he wrote ranged from political issues to sports and he even wrote a novel. Of course, as usual his books were based on international affairs and the UN.

Tyronne led a good life. Outside politics, he had varied interests and there were many discussions that we had on all topics. We must at this stage remember Tyronne, for the contribution he made in developing the Moratuwa Electorate as well as the contribution he made to Sri Lanka politics, specially international affairs. I would like our sentiments to be conveyed to the members of his family.

Thank you.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
Order, please! මේ අවස්ථාවේදී ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මන්ත්‍රීතුමාගේ නම මූලාසනය සඳහා යෝජනා කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, "ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා මූලාසනාරූඪ විය.***
*அதன் பிறகு, சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர் அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* MR. SPEAKER *left the Chair, and* THE HON. ALHAJ A.H.M. AZWER *took the Chair.*

[අ. භා. 2.34 ]

**ගරු කරු ජයසූරිය මහතා**
(மாண்புமிகு கரு ஜயசூரிய)
(The Hon. Karu Jayasuriya)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දිවංගත පාර්ලිමේන්තු මන්ත්‍රී, හිටපු අමාත්‍ය අපේ මිත්‍ර ගරු ටිරෝන් ප්‍රනාන්දු මැතිතුමාගේ විශිෂ්ට ජීවන චරිතාපදානය සම්බන්ධයෙන් ගරු සභානායකතුමාත්, ගරු විපක්ෂ නායකතුමාත් දීර්ඝ ලෙස කරුණු දැක්වූ නිසා මා ඒ කරුණු නැවතත් සඳහන් කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ.

1941 සැප්තැම්බර් 08 වන දින උපත ලැබූ ටිරෝන් ප්‍රනාන්දු මැතිතුමා ජාතික වීරවරයකු වූ වීර පුරන්අප්පු පරපුරරේ ප්‍රභූ පවුලකින් පැවැත එන ප්‍රතාපවත් පුද්ගලයකු වශයෙන් හඳුන්වන්න පුළුවන්. එතුමාගේ පියා එදා අමාත්‍යාංශයක ස්ථිර ලේකම්වරයකු වූ ෂෙල්ටන් සී. ප්‍රනාන්දු මහත්මායි. දශක තුනකට ආසන්න කාලයක් පූර්ණ කාලීනව දේශපාලනයේ නිරතව කටයුතු කළ ටිරෝන් ප්‍රනාන්දු හිටපු ඇමතිතුමා ගල්කිස්ස ශාන්ත තෝමස් විද්‍යාලයෙන් සහ කොළඹ රාජකීය විද්‍යාලයෙන් අධ්‍යාපනය ලැබුවා. එංගලන්තයේ ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාලයෙන් වැඩිදුර

අධ්‍යාපනය ලැබූ එතුමා දේශපාලන විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිධරයෙක්ද වුණා. ලන්ඩනයේ ග්‍රේස් ඉන්හි බැරිස්ටර්වරයකු ලෙස දිවුරුම් දුන් ටිරෝන් ප්‍රනාන්දු මැතිතුමා ලන්ඩන් පුවත් පත් කලා විද්‍යාලයේ ඩිප්ලෝමාවක් හිමි ජනාධිපති නීතිඥවරයෙක්. එපමණක් නොවෙයි. ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාලයේදී බ්‍රිතාන්‍ය කම්කරු පක්ෂයට සම්බන්ධ වී ඒ සංගමයේ නිලතල දැරූ එතුමා පසුව ආසියා අප්‍රිකා සංගමයේ සභාපතිවරයාද වුණා.

නීතිපති දෙපාර්තමේන්තුවේ රජයේ නීතිඥවරයකු ලෙස සිය වෘත්තීය ජීවිතය ආරම්භ කළ එතුමා එක්සත් ජාතික පක්ෂයට දැක්වූ ආදරය සහ ගෞරවය නිසා නීතිපති දෙපාර්තමේන්තුවෙන් ඉවත් වී පූර්ණ කාලීන දේශපාලනය සඳහා එක්සත් ජාතික පක්ෂයට සම්බන්ධ වුණා. 1977 පැවති මහ මැතිවරණයේදී මොරටුවේ මන්ත්‍රීවරයා වශයෙන් මුලින්ම පාර්ලිමේන්තුවට තේරී පත් වුණු එතුමාට ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිවරයාගේ ආණ්ඩුවේ විදේශ කටයුතු පිළිබඳ නියෝජ්‍ය අමාත්‍ය ධුරය හිමි වුණා. 1989 පැවති මහ මැතිවරණයේදී කොළඹ දිස්ත්‍රික්කය නියෝජනය කරමින් යළි පාර්ලිමේන්තුවට තේරී පත්වූ ටිරෝන් ප්‍රනාන්දු මැතිතුමා රණසිංහ ප්‍රේමදාස ජනාධිපතිතුමාගේ රජය යටතේ නීති හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා වශයෙන් කටයුතු කළා. ඊට පසුව ඩී.බී. විජේතුංග ජනාධිපතිතුමාගේ පාලන සමයේදී එම රජය යටතේ ප්‍රවෘත්ති හා ගුවන්විදුලි අමාත්‍යවරයා ලෙසත් කටයුතු කළා.

විශේෂයෙන්ම නීති හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා වශයෙන් එදා සිරකරුවන්ගේ සුබසිද්ධිය සඳහා, ඒ අයට පහසුකම් සැලසීම සඳහා එතුමා විශාල උනන්දුවක් දක්වමින් ක්‍රියා කළ ආකාරය මේ අවස්ථාවේදී මා මතක් කරන්නට කැමැතියි. විශේෂයෙන්ම ජනමාධ්‍ය තුළින් මධ්‍යස්ථ මත බෙදා හැරීමටත් ඒ වාගේම ජනමාධ්‍ය ක්ෂේත්‍රය නිර්දේශපාලනය කරන්නටත් එතුමා එදා ප්‍රවෘත්ති හා ගුවන්විදුලි අමාත්‍යවරයා වශයෙන් කටයුතු කළ ආකාරය අපට මෙතැනදී සිහිපත් වෙනවා. ඒ වාගේම 1991-94 කාලය තුළදී ශ්‍රී ලංකා ක්‍රිකට් පාලක මණ්ඩලයේ සභාපතිවරයා වශයෙන්ද එතුමා කටයුතු කළා.

2002-2004 එක්සත් ජාතික පෙරමුණු රජයේ විදේශ කටයුතු අමාත්‍යවරයා වශයෙන්ද කටයුතු කරනු ලැබුවේ ටිරෝන් ප්‍රනාන්දු මැතිතුමායි. ඒ කාලය තුළ එතුමා විදේශ සේවයට විශාල සේවාවක් කරපු බවත් මම සඳහන් කරන්නට කැමැතියි. 2004 මහ මැතිවරණයෙන් පසුව එක්සත් ජාතික පක්ෂයෙන් ඉවත් වූ ටිරෝන් ප්‍රනාන්දු මැතිතුමා චන්ද්‍රිකා කුමාරතුංග ජනාධිපතිනියගේ පාලන සමයේදී උතුරු නැඟෙනහිර ආණ්ඩුකාර ධුරයට පත් වුණා. ඉන් පසුව 2005 වර්ෂයේදී ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ විදේශ කටයුතු පිළිබඳ ජනාධිපති උපදේශක වශයෙන් කටයුතු කළා.

මෙරට අධිකරණ ක්ෂේත්‍රයේ විශාල ප්‍රසිද්ධියක් ඉසිලූ "පෝලින් ද කෲස්" නඩුවේ පැමිණිල්ල මෙහෙයවා ප්‍රසිද්ධියට පත් ටිරෝන් ප්‍රනාන්දු මැතිතුමා ඒ නඩුව පිළිබඳ ග්‍රන්ථයක්ද ප්‍රකාශයට පත් කළා. තවත් පොත් කිහිපයක කර්තෘ ලෙස කටයුතු කළ එතුමා කලා ක්ෂේත්‍රයට තිබූ දැඩි ආදරය සහ ගෞරවය නිසාම "වීර පුරන්අප්පු" සහ "කොළඹ සන්නිය" යන චිත්‍රපට දෙක නිෂ්පාදනය කිරීමටද දායක වුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සරලව පැවසුවොත් ටිරෝන් ප්‍රනාන්දු මැතිතුමා වෘත්තියෙන් නීතිඥයෙක්. ඒ අතර දේශපාලනඥයකු, ක්‍රීඩකයකු, ග්‍රන්ථ කර්තෘවරයකු, චිත්‍රපට නිෂ්පාදකවරයකු වශයෙන් විවිධ ක්ෂේත්‍රවල නියැලෙමින් අනභිභවනීය සේවයක් ඉටු කරනු ලැබුවා. එතුමා දේශපාලන ක්ෂේත්‍රයේ සිටි විද්වතකු හා ප්‍රභූවරයකු වශයෙන් හඳුන්වන්න පුළුවන්. මිය යන තුරුම එතුමා තුළ ප්‍රතාපවත් බව ගැබ්ව තිබුණා. මෙරට අධ්‍යාපනය ලැබූ කාලය තුළදීත්, ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාලයේ අධ්‍යාපනය ලැබූ කාලය තුළදීත්, නීතිඥ වෘත්තියේ යෙදී දේශපාලනය කළ කාලය තුළදීත් විවිධ සමිති සමාගම්වල, විවිධ තනතුරු හෙබවූ ටිරෝන් ප්‍රනාන්දු මැතිතුමා විශේෂයෙන්ම මෙරට දේශපාලන ක්ෂේත්‍රය තුළ නොමැකෙන නමක් තැබූ කීර්තිමත් දේශපාලනඥයෙක්. මෙරට පැවැති රජයයන් තුනක ඇමතිවරයකු ලෙස කටයුතු කළ ටිරෝන් ප්‍රනාන්දු මැතිතුමා මිය යන විට 67 වැනි වියේ පසු වුණා. එතුමා දශක තුනක කාලයක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වශයෙන් කටයුතු කළා.

ඒ වාගේම අපි ටිරෝන් ප්‍රනාන්දු මැතිතුමා ගැන කථා කරන කොට මහත්මා දේශපාලනයක් කළ, වැදගත් දේශපාලනයක් කළ, ගුණවත් හා චරිතවත් දේශපාලනයක් කළ, දැත පිරිසිදු දේශපාලනඥයකු වශයෙන් අපට එතුමාව සඳහන් කරන්නට පුළුවන්. එවන් බුද්ධිමත් ප්‍රභූවරයකු වූ ටිරෝන් ප්‍රනාන්දු මැතිතුමා අපෙන් වෙන් වී ගියත් එතුමා මේ මාතෘ භූමිය වෙනුවෙන්, රටේ ජනතාව වෙනුවෙන් රාජ්‍ය තාන්ත්‍රික මට්ටමින් කරන ලද සේවයද, මොරටු ජනතාව වෙනුවෙන් කරන ලද සේවයද අපට කවදාවත් අමතක කරන්න බැහැ. එමෙන්ම එතුමා එක්සත් ජාතික පක්ෂයේ හිටපු ප්‍රබල අමාත්‍යවරයෙක්. එමෙන්ම සාමාජිකයකු ලෙස අපේ පක්ෂයට කරන ලද සේවය සම්බන්ධයෙන් මේ අවස්ථාවේදී එතුමාගේ නමට අපේ උපහාරය පුද කරනවා.

එතුමාගේ රාජ්‍ය තාන්ත්‍රික සේවය මේ රටට අවශ්‍ය යුගයක එතුමා අපෙන් වෙන් වීම පිළිබඳ බලවත් ශෝකය ටෙහානි දුව, බෑණා ඇතුළු එම පවුලේ සියලුම සාමාජිකයන්ට මේ අවස්ථාවේ දී මා පිරිනමනවා. ඒ වාගේම අප පක්ෂයේ කෘත්‍යාධිකාරී මණ්ඩලය ඇතුළු පක්ෂයේ සියලු දෙනාගේම ශෝකයත් ඒ සියලු දෙනාටම පුද කරමින්, අප අදහන ආගම අනුව එතුමාට නිවන් සුව ප්‍රාර්ථනා කරනවා. එතුමාගේ ආගම අනුව මොක් සුව ප්‍රාර්ථනා කරනවා.

[අ. භා. 2.42]

**ගරු නවින් දිසානායක මහතා(රාජ්‍ය කළමනාකරණ ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා)**

(மாண்புமிகு நவீன் திஸாநாயக்க - அரசாங்க முகாமைத்துவ மறுசீரமைப்பு அமைச்சர் )

(The Hon. Navin Dissanayake - Minister of Public Management Reforms)

Hon. Presiding Member, I would like to associate myself with the Vote of Condolence on the late Hon. Tyronne Fernando, who I personally knew very well. He was a man of integrity and honour and also he was a very close friend of my father, the late Hon. Gamini Dissanayake. I remember him coming to my house at No. 20, Fifth Lane, in the early 1970s. I was a small boy then, but I remember him coming and talking for endless hours with my father because at that time they were a part of a young group of MPs who were instrumental in reviving the fortunes of the United National Party. He was a Member of the co-intellectual group of the United National Party that effected the policies of the 1977 victory.

Unfortunately, this is something that I cannot understand. When I look upon the life of the late Hon. Tyronne Fernando, I felt that he was undone by the 1977 formation of the Cabinet because I feel that he was one person who should have got a Cabinet slot. He had to wait till 1989, that is a period of almost 11 - 12 years, to get into the Cabinet.

[ගරු නවීන් දිසානායක මහතා]

So, when you look upon the abilities of the late Hon. Tyronne Fernando, given the fact that he was a barrister; given the fact that he was an Oxford graduate, certainly I felt that he should have come into the Cabinet at a much earlier time. Therefore, his contributions could have been much more towards the country and the United National Party, if this break was given to him.

Also, the Hon. Tyronne Fernando that I knew, was a man of principle; integrity; the honest politician who always spoke the truth within and outside the party. His letter to the Hon. Ranil Wickremasinghe, after he was rebuked by the United National Party by not being given a slot in the National List, stated the facts as they were, about the affairs of the United National Party. Henceforth he joined the Government of President Mahinda Rajapaksa and gave immense strength to the President to prosecute the war. In that sense, he was a pragmatist; he was a nationalist and a patriot.

Also, as the President of the Board of Control for Cricket in Sri Lanka, he was able to administer the affairs of the Board in a very upright manner. As the Hon Ranil Wickremasinghe stated, he never succumb to money. As you know, after 1996, there were so many issues in the Cricket Board. But, during the tenure of the late Hon. Tyronne Fernando there were no scandals; there were no corruption issues. So, he was able to carry on the affairs of the Cricket Board in a very honest and upright manner honouring the great names of the Presidents of Cricket Board like His Excellency J.R. Jayewardene, my father the late Hon. Gamini Dissanayake and Mr. F.R. Senanayake.

So, I would say that for me as a young politician, the Hon. Tyronne Fernando embodies a certain calibre of politician: a gentleman politician; an honest politician; a politician who spoke the truth from his heart. These are qualities that we, as young politicians must try to emulate.

Therefore, it is an honour and a privilege for me to associate myself with this Vote of Condolence. The Hon. Tyronne Fernando will always be in our hearts as a person who did a lot of service to the Moratuwa Electorate and also to the Colombo District. Therefore, I would like to pay homage to him and as a Buddhist, may he attain Nibbana!

Thank you very much.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Thank you. I wish to associate myself with the sentiments expressed by both sides of the House on the death of the Hon. Tyronne Fernando.

I may also add a few words. I too had the opportunity of having a very close association, affinity with the late Hon. Tyronne Fernando. When he was the Minister of Foreign Affairs, he nominated me to represent this House at the Golden Jubilee Celebration of Coronation of Her Majesty Queen Elizabeth at Buckingham Palace. I also remember attending his first meeting when he took to politics at *modera* in Moratuwa and had the opportunity of integrating with the former Attorney-General A.C.M.Ameer, QC.

The Hon. Tyronne Fernando had always been very keen in informing me of cricket matches whether it be Test or ODs in Sri Lanka and elsewhere and he would always invite me to the box to sit along with him. So much so, he even nominated me to distribute prizes to the winners at cricket matches at the Moratuwa Tyronne Fernando Stadium and also at Rangiri Dambulla Stadium.

I shall direct the Secretary-General of Parliament to make a Minute of today's Proceedings and send a copy thereof to the members of the bereaved family.

ඊ ළඟ ශෝක ප්‍රකාශ යෝජනාව හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ඇල්බට් ද සිල්වා මහතාගේ අභාවය පිළිබඳවයි.

## ශෝක ප්‍රකාශය: ගරු ඇල්බට් ද සිල්වා මහතා
## அனுதாபத் தீர்மானம்: மாண்புமிகு அல்பட் த சில்வா
## VOTE OF CONDOLENCE : HON. ALBERT DE SILVA

[අ. භා. 2.49 ]

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා )**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா - நீர்ப்பாசன, நீர்வள முகாமைத்துவ அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Nimal Siripala de Silva - Minister of Irrigation and Water Resources Management and Leader of the House of Parliament)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගාල්ල දිස්ත්‍රික්කයේ ගාල්ල හා කඹුරුපිටිය මැතිවරණ කොට්ඨාසවල පොදු මහ ජනතාව නියෝජනය කරමින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වශයෙන් මෙම උත්තරීතර සභාව හොබවන ලද ප්‍රවීණ දේශපාලනඥයකු වූ ඩී.ජී. ඇල්බට් ද සිල්වා මැතිතුමාගේ අභාවය පිළිබඳ ශෝකය පළ කිරීමේ යෝජනාව මම මේ අවස්ථාවේදී ගරු සභාවට ඉදිරිපත් කරන්නෙමි.

අහංගම, ගොවියාපාන විසූ දන්ගෙදර ගමගේ ආතර් ද සිල්වා මහතාගේත්, දෝන ප්‍රැන්සිනා ගුණසේකර මහත්මියගේත් අට දෙනකුගෙන් යුත් දරු පවුලේ සාමාජිකයකු වශයෙන් 1915 ජූනි මස 15වැනි දින මෙලොව එළිය දුටු ඩී.ජී. ඇල්බට් ද සිල්වා මහතා ගාල්ල මහින්ද විද්‍යාලයෙන් තම අධ්‍යාපනය හා දැනුම ලබා ගත්තේය. රත්නා කෝට්ටේගොඩ මෙනවිය සමඟ යුග දිවි ගමන් ඇරඹූ ද සිල්වා මහතා දරුවන් තිදෙනෙක් මෙලොවට දායාද කළේය.

එක්සත් ජාතික පක්ෂය හා සම්බන්ධ වෙමින් ක්‍රියාකාරී දේශපාලනයේ නියැලුණු එතුමා, 1977 වසරේ පැවැති මහා මැතිවරණයේදී ගාල්ල මැතිවරණ කොට්ඨාසයට තරග කර, හිටපු අග්‍රාමාත්‍යවරයකු වන දිවංගත විජයානන්ද දහනායක මහතා පරාජයට පත් කරමින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වශයෙන් තේරී පත්ව මෙම උත්තරීතර සභාවේ පළමු වරට අසුන් ගත්තේය.

ගාල්ල පොලීසිය, තැපැල් කාර්යාලය හා ගාල්ල බස් නැවතුම් පළ වැනි නිර්මාණයන් එම කාල වකවානුව තුළ එතුමා විසින් තම ඡන්දදායකයන් වෙත ලබා දුන් ජනතා සේවාවන් අතර කැපී පෙනෙයි. එතුමා ප්‍රදේශයේ නොදියුණු මං මාවත් පිළිසකර කරවමින්, විදුලිබල පහසුකම් ජනතාව වෙත ලබා දෙමින්, අධ්‍යාපන හා සෞඛ්‍ය ක්ෂේත්‍රවල දියුණුව සලසමින් ප්‍රදේශයේ උන්නතිය සඳහා විශාල වැඩ කොටසක් ඉටු කළේය. 1978 දී ජර්මනියේ පැවැති පොදු රාජ්‍ය මණ්ඩල පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ සැසි වාරයටද ශ්‍රී ලංකාව නියෝජනය කරමින් සහභාගි වීමට එතුමාට අවස්ථාව ලැබිණි.

මැතිවරණ පෙත්සමක් හේතුවෙන් ඇල්බට් ද සිල්වා මහතාගේ අසුන 1979 සැප්තැම්බර් මස 10වැනි දින අහිමි වුවත්, එවකට ජනාධිපති ධුරය හෙබවූ ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා විසින් 1980 වර්ෂයේදී ඇල්බට් ද සිල්වා මහතා කඹුරුපිටිය මැතිවරණ කොට්ඨාසයේ මහජන මන්ත්‍රීවරයා වශයෙන් යළිත් පත් කරනු ලැබිණි. එහෙත් 1983 දී එතුමා සිය මන්ත්‍රී ධුරයෙන් ඉල්ලා අස් විණි.

ප්‍රදේශයේ ආගමික හා සමාජයීය සේවාවන් රැසක මූලිකත්වය ගෙන කටයුතු කළ එතුමා, එම ආයතනවල යහපත වෙනුවෙන් උපරිම දායකත්වයක් සැපයුවේය. මල්වත්ත පුෂ්පාරාම විහාරස්ථ දායක සභාවේ සභාපතිවරයා වශයෙනුත්, ගාල්ල සමුපකාර ආරෝග්‍යශාලා සමුපකාර සමිතියේ යාවජීව සාමාජිකයකු වශයෙනුත්, ගාල්ල එක්සත් වෙළෙඳ සංගමයේ ලේකම්වරයා වශයෙනුත්, ගාල්ල සමුපකාර අවමංගල්‍යාධාර සමිතියේ යාවජීව සාමාජිකයකු වශයෙනුත් දක්වන ලද සහයෝගය ඒ අතර වඩාත්ම කැපී පෙනෙයි.

දකුණු පළාතේ, ගාලු ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් විවිධ ක්ෂේත්‍රයන් ඔස්සේ සුවිශේෂී මෙහෙවරක් ඉටු කරන ලද විශිෂ්ට ජනතා පුත්‍රයකු වූ දන්ගෙදර ගමගේ ඇල්බට් ද සිල්වා මැතිතුමා වසර 93ක් ආයු වළඳා මරණය පරාජය කිරීමට කිසිවකුටත් නොහැකිය යන බුදු දහමේ හරය පසක් කරමින් 2009 අප්‍රේල් මස 10වැනි දින අප අතරින් සදහටම සමු ගත්තේය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පොදු මහ ජනතාව අතර ජීවත් වෙමින් ඔවුනගේ හිත සුව පිණිස ඉමහත් මෙහෙවරක් ඉටු කළ ගාල්ල සහ කඹුරුපිටිය හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී ඩී.ජී. ඇල්බට් ද සිල්වා මැතිතුමන්ට නිවන් සුව ප්‍රාර්ථනය කරන අතර, මෙම පාර්ලිමේන්තුවේ ශෝකය එතුමාණන්ගේ දයාබර බිරිඳටත්, දූ දරුවන් ඇතුළු පවුලේ ඥාතීන් වෙතටත් දන්වා යවන ලෙස යෝජනා කර සිටිමි.

[අ. භා. 2.53]

**ගරු කරු ජයසූරිය මහතා**
(மாண்புமிகு கரு ஜயசூரிய)
(The Hon. Karu Jayasuriya)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දිවංගත ඇල්බට් ද සිල්වා හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීතුමාගේ විශිෂ්ට ජීවන චරිතාපදානය සම්බන්ධයෙන් ආණ්ඩු පක්ෂයේ සභානායකතුමා විසින් දීර්ඝ විස්තරයක් කරනු ලැබුවා.

කාලය සීමා වී ඇති බැවින් ඒ කරුණු අපි අනුමත කරන ගමන්ම විශේෂයෙන්ම මේ අවස්ථාවේදී එතුමා සිහි කිරීමට බලාපොරොත්තු වනවා.

ගාලු පුරවරයේ ප්‍රධාන පෙළේ බෞද්ධ විද්‍යාලයක් වන මහින්ද විද්‍යාලයේ අධ්‍යාපනය ලබා බෞද්ධ පරිසරයක හැදී වැඩුණු හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ඩී.ජී. ඇල්බට් ද සිල්වා මැතිතුමා පාර්ලිමේන්තුවට පළමුවෙන්ම තේරී පත් වූයේ 1977 වර්ෂයේදීයි.

දකුණේ ප්‍රබල දේශපාලනඥයකුව සිටි, හිටපු අග්‍රාමාත්‍යවරයකු වූ විජයානන්ද දහනායක මහතා පරාජය කරමින් එදා ගාල්ල ආසනය ජයග්‍රහණය කරන විට ඇල්බට් ද සිල්වා මැතිතුමා ප්‍රවාහන ක්ෂේත්‍රය තුළ ඉතා ඉහළින්ම ජනප්‍රියතාවක් දිනා ගෙන සිටි මහජන නියෝජිතයෙක්.

ගාල්ල පුරවරයට නව ආලෝකයක් උදා කර දෙමින් එතුමාගේ ව්‍යාපාරික බුද්ධිය දේශපාලන කටයුතුවලදීද ඉහළින්ම ආයෝජනය කරමින් ගාලු පොලීසිය, තැපැල් කාර්යාලය සහ බස් නැවතුම් පොළ ආදී විශාල ව්‍යාපෘති රැසක් ගාලු නගරයට ලබා දෙමින් අතිමහත් වූ සේවයක් එතුමා විසින් ගාල්ලේ ජනතාවට ඉටු කරනු ලැබුවා.

දකුණු පළාතටම ආඩම්බරයක් වූ ඇල්බට් ද සිල්වා මැතිතුමා තමන් දුක් මහන්සියෙන්, දහඩිය මහන්සියෙන් උපයා ගත් මුදල් නැති බැරි අහිංසක දුප්පත් මිනිසුන් වෙනුවෙන් වියදම් කරමින්, ඔවුන්ගේ ශුභසාධන කටයුතු සඳහා දැඩි කැප වීමකින් කටයුතු කළ අවංක, නිහතමානී දේශපාලනඥයකු බව මේ ගරු සභාවේදී සඳහන් කරන්න කැමැතියි. එපමණක් නොවෙයි. එතුමා ප්‍රවාහන ක්ෂේත්‍රයේදී දක්වන ලද විශිෂ්ට සේවාව අපට කිසිම අවස්ථාවක අමතක කළ නොහැකියි.

හොඳ දරු පරපුරක් රටට දායාද කළ එතුමා මිය යන විට අනූතුන්වන වියේ පසු වුවත්, මිය යන තෙක්ම හොඳ ශරීර සෞඛ්‍ය තත්ත්වයෙන් පසු වීමට තරම් වාසනාවන්ත වූ පින්වතෙක්. ඒ වාගේම ඇල්බට් ද සිල්වා මැතිතුමා ජනතාව සමඟ ජීවත් වූ, ජනතාවට ලෙන්ගතුකමක් දැක්වූ, ජනතාවට ආදරය කළ, ජනතාව වෙනුවෙන් තම දේශපාලනය කැප කළ වැදගත් දේශපාලනඥයකු බව මා මේ අවස්ථාවේදී සඳහන් කරන්නට කැමැතියි.

අක්මීමන කුරුඳුවත්ත ආදාහනාගාරයේදී එතුමා අපෙන් සමු ගෙන ගියත්, එතුමාගේ අභාවය සම්බන්ධයෙන් පෞද්ගලිකව මාගේත්, එක්සත් ජාතික පක්ෂයේ නායකතුමා ප්‍රමුඛ අපේ කෘත්‍යාධිකාරි මණ්ඩලයේ සියලුම සාමාජිකයන්ගේත් බලවත් ශෝකය මේ අවස්ථාවේදී පවුලේ සියලුම සාමාජිකවරුන්ට පුද කරන අතර, එතුමාට අමා මහ නිවන් සුව ලැබේවායි කියා අපි ප්‍රාර්ථනා කරනවා.

[අ. භා. 2.57 ]

**ගරු නිශාන්ත මුතුහෙට්ටිගමගේ මහතා**
(மாண்புமிகு நிஷாந்த முதுஹெட்டிகமகே)
(The Hon. Nishantha Muthuhettigamage)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගාල්ල දිස්ත්‍රික්කයේ, ගාල්ල ආසනය නියෝජනය කරපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වන දිවංගත ඇල්බට් ද සිල්වා මැතිතුමාගේ ශෝක යෝජනාව සම්බන්ධයෙන් වචන කිහිපයක් ප්‍රකාශ කරන්නට ලැබීමත් භාග්‍යයක් කොට මා සලකනවා. එතුමා පාර්ලිමේන්තුවට යන කොට මගේ වයස අවුරුදු හයයි. එතකොට මා පාසල් වියේ සිටියේ. ගාල්ල මහින්ද විද්‍යාලයේ ආදි ශිෂ්‍යයකු හැටියට මා ඉතා ආඩම්බරයෙන් ප්‍රකාශ කරන්න ඕනෑ, එතුමාගේ දේශපාලන පක්ෂය මොකක් වුණත් ගාල්ල නගරය ගොඩ නඟන්න, ගාල්ල ආසනයේ එවකට පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකුගෙන් ඉටු නොවුණු

[ගරු නිශාන්ත මුතුහෙට්ටිගමගේ මහතා]

සුවිශේෂී කාර්ය භාරයක් එතුමා ඉටු කළාය කියලා. එතුමා සමඟ සමකාලීනව දේශපාලනය කරන්න බැරි වුණත්, එතුමා දේශපාලනයෙන් විශ්‍රාම ගෙන තිබියදී විශේෂයෙන් එතුමාගේ අවමංගල්‍ය උත්සවයට එවකට මා පළාත් සභා මන්ත්‍රීවරයකු හැටියට සහභාගි වෙලා සංවේගය පළ කරන්න මට අවස්ථාව ලැබුණා.

ගාල්ලේ ජනතාවට අදත් එතුමාව අමතක වන්නේ නැහැ. එතුමා කිව්වේ, "ලංකාවේ දිගම එක මගේ"ය කියලායි. "දිගම එක මගේ"ය කිව්වාම කට්ටිය බලන්නේ ආශ්චර්යයකින්. එහෙම කිව්වේ ලංකාවේ දිගම බස් නැවතුම් පොළටයි. එතුමා කිව්වේ, "ළමයින් හම්බ වන තැන ලොකු කරනවා"ය කියලායි. මහමෝදර රෝහලේ ප්‍රසූතිකාගාරය විශාල කරලා සකස් කරන එක පිළිබඳව, රෝහල් වැඩිදියුණු කරන එක පිළිබඳව එතුමා ප්‍රකාශ කළේ එහෙමයි. ඒවා අදත් ගාල්ලේ ජනතාව අතර කියවෙන කාරණායි.

Curfew ගැන කථා කළාම කිව්වේ, අපිට කර්ෆිව් ඕනෑ නැහැ පරිප්පු දෙන්න කියලායි. එතුමා curfewවලට තමයි කර්ෆිව් කිව්වේ. ඒ විධියට ගාල්ලේ දේශපාලනය රසවත් කරපු, ගාල්ලේ දේශපාලනය අර්ථවත් කරපු, ගාල්ලේ හිටපු ප්‍රායෝගික දේශපාලන නායකයෙක් එතුමා. මට එකඟ වෙන්න බැරි දේශපාලන පක්ෂයක එතුමා හිටියත්, එතුමා ක්‍රියාවෙන් ඔප්පු කරපු කාරණා පිළිබඳව මගේ ගෞරවය හා ස්තුතිය කෘතවේදීව මේ අවස්ථාවේ පුද කරමින්, ගාල්ලේ බිහි වුණු ශ්‍රේෂ්ඨම දේශපාලනඥයන් අතර එක් කෙනෙක් හැටියට සලකමින් ගරු ඇල්බට් ද සිල්වා මැතිතුමාට අප අදහන ආගමානුකූලව නිවන් සුව ප්‍රාර්ථනා කරමින් මම සමු ගන්නවා. ස්තුතියි.

[අ. භා. 3.00]

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு தினேஷ் குணவர்தன - நீர்வழங்கல், வடிகால மைப்பு அமைச்சரும் அரசாங்கத் தரப்பின் முதற்கோலாசானும்)
(The Hon. Dinesh Gunawardena - Minister of Water Supply and Drainage and Chief Government Whip)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගාල්ල දිස්ත්‍රික්කයේ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ඇල්බට් ද සිල්වා මැතිතුමාගේ වියෝවය පිළිබඳ ශෝක යෝජනාවටයි අපි මේ එක් වන්නේ.

අපේ රටේ දේශපාලනයේ ඉතාම අභියෝගාත්මක දේශපාලන කඳවුරක් වූ ගාලු පුරවරය නියෝජනය කළ ඇල්බට් ද සිල්වා මහතා ඉතාම වාම් දේශපාලනඥයෙක්. දීර්ඝ කාලයක් ඒ ආසනය නියෝජනය කළ හිටපු අග්‍රාමාත්‍ය විජයානන්ද දහනායක මැතිතුමාගේ ඒ දේශපාලන වාතාවරණය, ඒ දේශපාලන බලකොටුව වෙනස් කරන්නට එතුමාට පුළුවන්කම ලැබුණා. මේ නිසා ඇල්බට් ද සිල්වා නාමය ගාල්ල දිස්ත්‍රික්කයේත්, මා හිතන්නේ රටේත් ප්‍රසිද්ධියට පත් වුණා. එපමණක් නොවෙයි. ඇල්බට් ද සිල්වා මැතිතුමා ව්‍යාපාරික ප්‍රජාවගෙන් මතු වුණු දේශපාලනඥයෙක්. මේ රටේ උරුමයට දැඩි ලෙස ආදරය කළ, එය ආරක්ෂා කළ, ආගමික කටයුතුවලට දැඩි බැඳියාවකින් කටයුතු කළ එතුමා උතුම් ගාලු පුරවැසියෙක්ය කියන එකත් මා මේ අවස්ථාවේදී එතුමාට ගෞරවය පිණිස සඳහන් කරන්න කැමැතියි. පසු කාලයක කඹුරුපිටිය මැතිවරණ කොට්ඨාසයටද එතුමාව නම් කරනු ලැබුවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට අද වාගේ මතකයි එක පැත්තකින් ඇල්බට් ද සිල්වා මැතිතුමා ශ්‍රේෂ්ඨාධිකරණයේ තමන්ගේ නීතිඥයන්ගේ පිටු පසින් ඉඳගෙන, අනෙක් පැත්තෙන් අපේ රටේ හිටපු අග්‍රාමාත්‍යවරයකු වන ඩබ්ලිව්. දහනායක මැතිතුමා නීතිඥයන් තමන්ගේ පිටු පසින් තබා ගෙන ඡන්ද පෙත්සම තර්ක කළ අවස්ථාව. එය ශ්‍රේෂ්ඨාධිකරණයේ දුර්ලභ අවස්ථාවක්. එදා ඒ ඡන්ද පෙත්සමේදී මේ රටේ පුරවැසියෙක් හැටියට ඩබ්ලිව්. දහනායක මැතිතුමා නීතිමය තර්ක විතර්ක ඉදිරිපත් කළා. ඒ ඡන්ද පෙත්සම ජයග්‍රහණය කිරීම නිසා ඇල්බට් ද සිල්වා මැතිතුමාට තම මන්ත්‍රී ආසනය අහිමි වුණා. නමුත් එක්සත් ජාතික පක්ෂයේ නායකයන් ඇල්බට් ද සිල්වා මැතිතුමාගේ තිබෙන හොඳ ගුණාංග පිළිගනිමින් එතුමාව මන්ත්‍රීවරයෙක් හැටියට පත් කළා. මම මෙය සඳහන් කරන්නේ එවැනි දේශපාලන අරගලයක යෙදුණු එතුමාට ගෞරවය පිණිසයි.

ඇල්බට් ද සිල්වා මැතිතුමා ඉගෙන ගත්තේ ගාල්ල මහින්ද විද්‍යාලයේයි. අපි දන්නවා ලංකාවේ දකුණු පළාතේ ව්‍යාපාරික ප්‍රජාව තමයි රට පුරාම ව්‍යාපාරික ප්‍රජාවගේ ජයග්‍රහණ ස්ථාපිත කළේ කියලා. ඒ යුගයට සම්බන්ධයි ඇල්බට් ද සිල්වා මැතිතුමා. ඇල්බට් ද සිල්වා මැතිතුමාගේ ප්‍රභූ ඥාතීන් බොහෝ ප්‍රදේශවලට සම්බන්ධයි. කන්ද උඩරටට, ඒ වාගේම අනෙකුත් ප්‍රදේශවලට සම්බන්ධයි. ඒ ව්‍යාපාරික ප්‍රජාව ගාලු පුරවරයෙන් විහිදී ගොස් අපේ රටේ වෙනත් නගරවල අලුතින් ආයෝජනය කරමින් ඒ නගර දියුණු කළාය කියන ටික නිරන්තරයෙන් ඇල්බට් ද සිල්වා මැතිතුමා ආඩම්බරයෙන් කියනවා අපට මතකයි.

දේශපාලන කරළියෙන් ඉවත්ව හිටපු කාලයේ එවැනි අදහස්, එවැනි අවවාද අනුශාසනා බොහොම ආඩම්බරයෙන් ප්‍රකාශ කරන්නට එතුමාට පුළුවන්කම තිබුණා. ජනතාවගේ මනාපයට පමණක් දේශපාලනය කිරීමේ හැඩ රුව නොතිබුණාට, තමන් ප්‍රකාශ කළ යුතු දේ අවංකව, නිහතමානීව, ඍජුව ප්‍රකාශ කරන්නට එතුමාට පුළුවන්කම තිබුණා. එතුමා ඒ ආදර්ශය ලබා දුන්නා. මා එතුමාට නිවන් සුව ප්‍රාර්ථනා කරනවා.

[අ. භා. 3.04 ]

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ප්‍රදේශයේ, විශේෂයෙන්ම ගාල්ල මැතිවරණ කොට්ඨාසයේ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වන ඇල්බට් ද සිල්වා මැතිතුමා පිළිබඳව ශෝකය ප්‍රකාශ කරන අවස්ථාවේ වචන ස්වල්පයක් කථා කිරීම මගේ යුතුකමක් හැටියට මා සලකනවා.

ගරු ඇල්බට් ද සිල්වා මැතිතුමා ගාල්ල ජනතාවගේ සුවිශේෂ ගෞරවාදරයට පාත්‍ර වෙච්ච දේශපාලනඥයෙක්. 1977 මැතිවරණයෙන් විජයානන්ද දහනායක මැතිතුමා වැනි ගාලු පුත්‍රයෙක් පරාජයට පත් කරලා පාර්ලිමේන්තුවට ප්‍රවිෂ්ට වීමේ භාග්‍ය එතුමා උරුම කර ගත්තා. විශේෂයෙන්ම ගාල්ලේ ජනතාව අදටත් ගරු ඇල්බට් ද සිල්වා මැතිතුමාව ඉතාම ගෞරවයෙන් සිහිපත් කරන්නේ ඉතා කෙටි කාලයක් ඇතුළත ගාල්ල මැතිවරණ කොට්ඨාසයට පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් හැටියට එතුමාගෙන් වුණු විශිෂ්ට සේවය නිසායි. ගාල්ල නගරයේ මෑතකදී අලුතෙන් ඉදි වුණු බස් නැවතුම් පොළ තිබෙන ස්ථානයේ මීට පෙර තිබුණු බස් නැවතුම් පොළ ඉදි කිරීමට ගරු ඇල්බට් ද සිල්වා මැතිතුමාට හැකියාව ලැබුණා. ඒ වාගේම අදටත් ගාල්ල නගර මධ්‍යයේ තිබෙන පොලිස් ස්ථානය අලුතෙන් ඉදි කරලා ඒ සුවිශේෂ සේවය ගාල්ලට ලබා දීම සඳහා එතුමා දීර්ඝ කාලයකට ඉස්සෙල්ලා කල්පනා කරලා ඒ වැඩ කටයුතු ආරම්භ කළා. ඒ වාගේම ගාල්ලේ

තැපැල් කන්තෝරුව ඒ නගරයට අවශ්‍ය කරන පරිදි අංග සම්පූර්ණ විධියට ඉදි කරලා ඒ සියලුම පහසුකම් ගාලු ජනතාවට ලබා දීමට ගරු ඇල්බට් ද සිල්වා මැතිතුමා සමත් වුණා.

ඒ වාගේම නිවාස යෝජනා ක්‍රම, සෞඛ්‍ය පහසුකම් ගාල්ල ආසනය පුරාවටම ලබා දීම සඳහා ගරු ඇල්බට් ද සිල්වා මැතිතුමාගෙන් වුණු සේවය අපට කවදාවත් අමතක කරන්න පුළුවන්කමක් නැහැ.

එක්සත් ජාතික පක්ෂය 1977 විජයග්‍රහණය ලැබූ අවස්ථාවේ ගාල්ල ආසනයෙන් එතුමා විශිෂ්ට විධියට ජයග්‍රහණය කරලා, ඉතා කෙටි කාලයක් ඇතුළතයි මේ සේවය ගාල්ල ආසනයට ලබා දුන්නේ. ඒ වාගේම එතුමා දිවංගත ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාගේ විශේෂ ගෞරවය දිනා ගෙන හිටපු, විශ්වාසය දිනා ගෙන හිටපු දේශපාලනඥයෙක්. ගාල්ල ආසනයේ මන්ත්‍රීකම අහිමි වුණායින් පස්සේ කඹුරුපිටිය ආසනයේ මන්ත්‍රීවරයා හැටියට ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාගේ තෝරා ගැනීම වුණේ ගරු ඇල්බට් ද සිල්වා මැතිතුමායි. එයින් පෙනෙනවා එතුමා ජන නායකයින්ගේ ගෞරවය දිනා ගෙන, විශ්වාසය දිනා ගෙන, ආදරය දිනා ගෙන මොන තරම් අවංක සේවයක් මන්ත්‍රීවරයෙක් හැටියට ඉටු කළාද කියන එක.

ගාල්ල මහින්ද විද්‍යාලයේ කීර්තිමත් ආදි ශිෂ්‍යයකු හැටියටත්, ගාල්ල පොදු ජනතාවගේ ආදරය දිනා ගත් ජනතා නායකයකු හැටියටත්, කෙටි කාලයක් ඇතුළත ගාල්ලට පවතින දේවල් රාශියක් ලබා දුන් මන්ත්‍රීවරයකු හැටියටත් ගරු ඇල්බට් ද සිල්වා මැතිතුමාගේ නම ගාලු ජනතාවගේ හදවත් තුළ අනිවාර්යයෙන්ම රැඳී තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා මීට වඩා දීර්ඝ කථාවක් කරන්නේ නැහැ. එතුමා එදා 1977 දී ගාලු දිස්ත්‍රික්කයෙන් පාර්ලිමේන්තුවට ආපු වෙලාවේ එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරු රාශියක් එතුමා එක්ක හිටියා. නමුත් අද එතුමාගේ අභාවය වෙනුවෙන් ශෝකය ප්‍රකාශ කරන මේ වේලාවේ එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරමින් ගාල්ලේ ඉන්න එකම නියෝජිතයා හැටියට මට අපේ දිස්ත්‍රික්කයේ ජනතාවගේ සාතිශය සංවේගයත්, එතුමා නියෝජනය කරපු එක්සත් ජාතික පාක්ෂිකයින්ගේ සංවේගයත් එතුමා අභාවප්‍රාප්ත වෙලා සෑහෙන කලකට පසුව හරි මේ උත්තරීතර සභාවේ ඉදිරිපත් කරන්න ඉඩ ලැබිලා තිබෙන මේ අවස්ථාවේ එතුමා වෙනුවෙන් ඒ ශෝකය අපි පළ කරන බව ඒ පවුලේ උදවියට දන්වා යවන හැටියට ඉල්ලා සිටිමින් එතුමාට නිවන් සුව ලැබේවායි මා ප්‍රාර්ථනා කරනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Order, please! හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ඇල්බට් ද සිල්වා මැතිතුමාගේ අභාවය පිළිබඳව පාර්ලිමේන්තුවේ දෙපාර්ශ්වයෙන්ම කරන ලද ශෝක යෝජනාවන් අනුමත කරමින් මමද ඒ සමඟ එකතු වීමට කැමැත්තෙමි. අද දින රැස්වීමට අදාළ නිල වාර්තාවේ පිටපත් ශෝකයට පත් පවුලේ අය වෙත යවන මෙන් පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයාට මා නියෝග කරමි.

Now, we will take up the Vote of Condolence on the former Member of Parliament, the late Hon. E.L.B. Hurulle.

## ශෝක ප්‍රකාශය: ගරු ඊ.එල්.බී. හුරුල්ලේ මහතා
## அனுதாபத் தீர்மானம்: மாண்புமிகு ஈ.எல்.பி. ஹுருல்லே
## VOTE OF CONDOLENCE: HON. E.L.B. HURULLE

[අ. භා. 3.09 ]

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා )**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா - நீர்ப்பாசன, நீர்வள முகாமைத்துவ அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Nimal Siripala de Silva - Minister of Irrigation and Water Resources Management and Leader of the House of Parliament)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අනුරාධපුර දිස්ත්‍රික්කයේ හොරොව්පතාන මැතිවරණ කොට්ඨාසයේ ජනතාව නියෝජනය කරමින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හා අමාත්‍යවරයකු වශයෙන් මෙම උත්තරීතර සභාව ශෝභාවත් කරන ලද ප්‍රවීණ දේශපාලනඥයකු වූ හිටපු පළාත් ආණ්ඩුකාර දේශමාන්‍ය ගරු ඊ.එල්.බී. හුරුල්ලේ මැතිතුමාගේ අභාවය පිළිබඳව ශෝකය පළ කිරීමේ යෝජනාව මම මේ අවස්ථාවේදී ගරු සභාවට ඉදිරිපත් කරන්නෙමි.

හොරොව්පතානේ, මොරකැවේ විසූ ටිකිරි බණ්ඩා හුරුල්ලේ රටේ මහත්මයාගේත්, ඇලිස් බුලන්කුලම මැතිනියගේත් පුත්‍ර රත්නයක් ලෙස 1919 ජනවාරි මස 19වැනි දින උපත ලද එඩ්වින් ලොකු බණ්ඩාර හුරුල්ලේ මහතා යාපනය ශාන්ත පැට්‍රික් විද්‍යාලයෙන් මූලික අධ්‍යාපනය ලැබීය. අනතුරුව මහනුවර ත්‍රිත්ව විද්‍යාලයෙන් හා කොළඹ ශාන්ත ජෝශප් විද්‍යාලයෙන් උසස් අධ්‍යාපනය ලැබූ එතුමා 1938 දී රජයේ ලිපිකාර සේවයට සම්බන්ධ විය.

මහනුවර නාථ දේවාලයේ බස්නායක නිලමේ වශයෙන් කටයුතු කළ එම්.බී. ගලගොඩ මහතාගේ දියණියක වූ මාලනී ගලගොඩ මෙනෙවිය සමඟින් යුග දිවිය ඇරඹූ එතුමා අනුරාධපුර දිස්ත්‍රික් මන්ත්‍රීවරයකු වශයෙන් හා ව්‍යාපෘති ඇමතිවරයකු වශයෙන් මෙම පාර්ලිමේන්තුව නියෝජනය කළ තේමිය හුරුල්ලේ මැතිතුමා ඇතුළු සෙනෙහෙබර දරුවන් පස් දෙනෙකු මෙලොවට දායාද කළේය.

දෙවැනි මහා ලෝක සංග්‍රාමය සමයේ නුවරගම් පළාතේ අතිරේක රටේ මහත්මයා වශයෙන් සේවයේ නියැලුණු හුරුල්ලේ මහතා 1943 වසරේදී ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරියෙකු වශයෙන් තුම්පනේ, දකුණු වවුනියාව, උතුරු මාතලේ සහ හුරුලු පළාතේ රාජකාරි කටයුතුවල යෙදෙමින් එම ප්‍රදේශවාසීන්ගේ අවශ්‍යතාවන් ඉටු කර ලීම සඳහා ඉමහත් වෙහෙසක් දැරුවේය. විශේෂයෙන්ම ග්‍රාම සංවර්ධන හා සමුපකාර කටයුතු සම්බන්ධව අවධානය යොමු කළ එතුමා ජපන් ක්‍රමයට උතුරුමැද පළාතේ වී ගොවිතැන ඇරඹූ පළමුවැනියා වූ අතර කෘෂිකර්ම ප්‍රදර්ශනයන්හිදී උතුරුමැද පළාත වෙනුවෙන් 1953-54 සහ 1954-55 යන දෙවර්ෂයේම ප්‍රථම ස්ථානය දිනා ගැනීමට සමත් විය.

හොරොව්පතාන මන්ත්‍රී පෝලියැද්ද මහ දිසාවේගේ හදිසි අභාවයෙන් පසු 1956 මහ මැතිවරණයට එක්සත් ජාතික පක්ෂය යටතේ තරග කිරීමට සුදුස්සකු තෝරා ගැනීමේදී කාගේත් අවධානය මෙතුමා වෙත යොමු වුණි. රජයේ සේවයෙන් ඉවත් වූ හුරුල්ලේ මහතා එම මැතිවරණයට ඉදිරිපත්ව එක්සත් ජාතික

[ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා]

පක්ෂය ආසන අට දක්වා පහත බසිද්දී අභිමානවත් ලෙස ජයග්‍රහණය කරන ලද එක් අයකු වශයෙන් මෙම පාර්ලිමේන්තුවේ පළමු වරට අසුන් ගත්තේය. එතුමන් තුළ පැවැති ජනතා හිතෛෂීභාවයත්, ඩී.ඇස්. සේනානායක රජයේ ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය ධුරය හෙබවූ පී.බී. බුලන්කුලම වැනි මාමා කෙනෙකුගෙන් ලද දේශපාලන පන්නරයත් එයට තදින්ම බලපෑවේය. 1960 මාර්තු සහ ජූලි මාසවල පැවැති පාර්ලිමේන්තු මහ මැතිවරණ දෙකේදීම ජයග්‍රහණය ලද හුරුල්ලේ මහතාට රජරට ජනතාව වෙනුවෙන් සේවය කිරීමේ භාග්‍යය තවදුරටත් හිමි විණි.

1965 වසරේ පැවැති මහ මැතිවරණයේදී සිව්වැනි වරටත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වශයෙන් තේරී පත් වූ එතුමා එවකට පැවති රජයේ ප්‍රවාහන ඇමතිවරයා වශයෙන් ලංගමය හා දුම්රිය සේවය නඟා සිටුවීමට ප්‍රබල උත්සාහයක යෙදුණේය. මෙරට දුම්රිය සේවාව ආරම්භයේ සිට පැවැති වාෂ්ප බල දුම්රිය වෙනුවට ඩීසල් දුම්රිය එන්ජින් භාවිතයට ගැනීම මෙතුමාගේ කැප වීමේ එක් ප්‍රතිඵලයකි. අද අනුරාධපුරයේ සිට මාතර දක්වා ධාවනය වුවත්, එදා අනුරාධපුරයේ සිට කොළඹ දක්වා දහස් ගණන් ජනතාවකට සේවාවක් සලසාලමින් ධාවනය වූ "රජරට රැජින" දුම්රිය ගමනේ ආරම්භයද හුරුල්ලේ මැතිතුමාගේ තවත් සංකල්පයක් විය.

එයාර් සිලෝන් ගුවන් සේවාව ආරම්භ කිරීමත්, ශ්‍රී ලංකාව සතුව පැවති කල් පැන ගිය ගුවන් යානා වෙනුවට නවීන ජෙට් ගුවන් යානා එක් වීමත් එම කාල වකවානුව තුළ සිදු වූ තවත් කාර්යයන් වේ. සාමාන්‍ය මහජනතාව වෙනුවෙන් ශ්‍රී ලංකාවේ පළමු වතාවට ටැක්සි රථ සේවාවක් ආරම්භ කරමින් ප්‍රවාහන ක්ෂේත්‍රයේ නව පිටුවක් පෙරළීමටද එතුමාට මෙම කාලය තුළදී හැකියාව ලැබිණි.

1970 පැවති මහ මැතිවරණයේදී ජය ගත නොහැකි වුවත් යළි 1977 දී ජයග්‍රහණය අත් පත් කර ගත් හුරුල්ලේ මහතා බලයට පැමිණි එක්සත් ජාතික පක්ෂ රජයේ සංස්කෘතික අමාත්‍යවරයා වශයෙන් පත් වී පුරා විද්‍යා ක්ෂේත්‍රයේ පුනරුදයක් ඇති කිරීමට ඉමහත් වෙහෙසක් දැරිය. සංස්කෘතික ත්‍රිකෝණ වැඩසටහන යටතේ ගරා වැටෙමින් පැවැති මහ දාගැබ් පිළිසකර කරවමින් හා පුරා විද්‍යා ගවේෂණ සිදු කරවමින් ඉමහත් කාර්ය භාරයක් ඉටු කළා පමණක් නොව යුනෙස්කෝ වැඩ පිළිවෙළ යටතේ අපේ සංස්කෘතික දායාද රැසක් ලෝක උරුමයන් බවට පත් කරවීමටද එතුමා දැක්වූ දායකත්වය සදානුස්මරණීයය.

කපිලවස්තු ශ්‍රී සර්වඥ ධාතූන් වහන්සේලා ඉන්දියාවේ සිට ශ්‍රී ලංකාවට වැඩමවා ස්ථාන 90කදී ප්‍රදර්ශනය කරවීම, ත්‍රිපිටකය මුද්‍රණද්වාරයෙන් පිට කිරීම, ශුද්ධ වූ කුරාණය පරිවර්තනය කරවීම, මහාවංශය ලේඛනගත කරවීම, රට පුරා සංස්කෘතික මධ්‍යස්ථාන පිහිටුවීම, ආධුනික ලේඛකයන්ගේ පොත් ප්‍රකාශයට පත් කරවීමට විශේෂ වැඩ පිළිවෙළක් යෙදීම එතුමා සංස්කෘතික අමාත්‍යවරයා වශයෙන් කටයුතු කළ කාලය තුළ කරන ලද තවත් කාර්යයන් කිහිපයකි. ලෝක බෞද්ධ සම්මේලනයේ සභාපති තනතුර හොබවමින් රටවල් ගණනාවක සංචාරය කොට නිර්මල බුදු දහම ප්‍රචලිත කරවීමේ ශාසනික මෙහෙවරද ඉටු කළ හුරුල්ලේ මහතා අනුරාධපුර කෞතුකාගාරයේ තැන්පත් කර තිබූ දුටුගැමුණු මහ රජතුමාගේ භෂ්මාවශේෂ රට පුරා ප්‍රදර්ශනය කරවමින් ජනතා සිත් සතන් තුළ ජාතික හැඟීම් උද්දීපනය කරවීමටද පියවර ගත්තේය.

පළාත් සභා ක්‍රමය ශ්‍රී ලංකාව තුළ ස්ථාපිත කිරීමෙන් අනතුරුව මධ්‍යම පළාතේ ප්‍රථම ආණ්ඩුකාර ධුරය 1988 දී භාර ගත් හුරුල්ලේ මැතිතුමා එම ප්‍රදේශයේ අභිවෘද්ධිය වෙනුවෙන් තවත් විශාල කාර්ය භාරයක් ඉටු කළේය. එතුමාගෙන් සිදු වුණු උදාර සමාජ මෙහෙවරට ගරු කිරීමක් වශයෙන් රණසිංහ ප්‍රේමදාස ජනාධිපතිතුමා විසින් එතුමාට "දේශමාන්‍ය" නමැති ගෞරව සම්මානයෙන්ද පුදනු ලැබිණි. 1991 දී ඕස්ට්‍රේලියාවේ මහ කොමසාරිස්වරයා වශයෙන් පත්ව ගිය එතුමා එම දේශය තුළ බෞද්ධ විහාරස්ථාන කීපයක් ආරම්භ කිරීමටද කටයුතු කළේය. යළි 1993 දී සිය රටට පැමිණ උතුරුමැද පළාතේ ආණ්ඩුකාරවරයා වශයෙන් කටයුතු භාර ගත් මෙම මානව හිතවාදී දේශපාලනඥයා එතැන් සිට තමන්ගේ පොදු ජන මෙහෙවර සුපුරුදු අයුරින්ම ඉදිරියටත් පවත්වා ගෙන ගියේය.

රජ රට ගොවි ජනතාවගේ හදවත් දිනා ගනිමින් එම ප්‍රදේශය වෙනුවෙන් ජනපද අරඹමින්, වැව් ප්‍රතිසංස්කරණය කරමින්, රෝහල් හා මංමාවත් ඉදි කරමින් විවිධ ක්ෂේත්‍රයන් ඔස්සේ නිහඬව අව්‍යාජ ජනතා මෙහෙවරක යෙදුණු එතුමා රජයේ සේවයද සියලු දේපළද සමාජ සේවය වෙනුවෙන් කැප කර ගෞරවාන්විත දේශපාලනයකින් සමු ගත් උත්කෘෂ්ට පුද්ගලයෙකි. ජීවිතයේ සැඳෑ සමය ගෙවමින් සිටි ඊ.එල්.බී. හුරුල්ලේ නම් වූ යුග පුරුෂයා මඳ කලක් අසනීපව සිට වසර 90ක් ආයු වළඳා 2009 අප්‍රේල් මස 06වන දින වැව් බැඳි රාජ්‍යයට පමණක් නොව සමස්ත ශ්‍රී ලංකාවටම වේදනාවක් ගෙන දෙමින් සදහටම දෙනෙත් පියා ගත්තේය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පොදු මහජනතාවගේ හිත සුව සලසමින් ගමනාගමනය නංවාලීම සඳහාත් සංස්කෘතිය රැක ගැනීම සඳහාත් සුවිශේෂ මෙහෙවරක් ඉටු කළ හොරොව්පතාන හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී හිටපු අමාත්‍ය සහ පළාත් ආණ්ඩුකාර දේශමාන්‍ය එඩ්වින් ලොකුබණ්ඩාර හුරුල්ලේ මැතිතුමන්ට නිවන් සුව ප්‍රාර්ථනා කරන අතර, මෙම පාර්ලිමේන්තුවේ ශෝකය එතුමාගේ දයාබර බිරිඳ මාලනී ගලගොඩ මැතිනියටත්, තේමිය හුරුල්ලේ හිටපු මන්ත්‍රීතුමා ඇතුළු දූ දරුවන් වෙතටත්, පවුලේ ඥාතීන් වෙතටත් දන්වා යවන ලෙස යෝජනා කර සිටිමි.

[අ. භා. 3.18 ]

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**

(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க - எதிர்க்கட்சி முதல்வர்)

(The Hon. Ranil Wickremasinghe - Leader of the Opposition)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊ.එල්.බී. හුරුල්ලේ මැතිතුමා එක අතකින් අපේ පක්ෂයේ වාර්තාවක් ඇති කරපු පුද්ගලයෙක්. 1956 නායකයෝ පැරදෙන අවස්ථාවේදී, මන්ත්‍රීවරු පැරදෙන අවස්ථාවේදී අපේ ආසන සංඛ්‍යාව අටට බැස්සා. ඒ කාලයේදී හුරුල්ලේ මැතිතුමා පමණක් අලුතින් ඉදිරිපත් වෙලා, තරග කරලා ආසනයක් දිනා ගෙන මේ පාර්ලිමේන්තුවට ආවා. ඒ විතරක් නොවෙයි. එතැන ඉඳන් 1956 දී ඇති වුණු පරාජයෙන් පස්සේ එක්සත් ජාතික පක්ෂය ප්‍රතිසංවිධානය කරලා නැවත බලයට ගේන්න එතුමා කරපු සේවය මම මෙතැනදී යළිත් මතක් කරන්න කැමැතියි. ඒ නිසා ඊ.එල්.බී. හුරුල්ලේ මැතිතුමා අපේ පක්ෂයේ යෝධයෙක් හැටියට අපට සලකන්න පුළුවන්. අද අනුරාධපුර දිස්ත්‍රික්කයේ, විශේෂයෙන්ම එක්සත් ජාතික පක්ෂයේ නම සඳහන් කරන අවස්ථාවේදී හුරුල්ලේ මැතිතුමාගේ නම අපට මතක් වෙනවා. මම හිතන්නේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය පැත්තෙන් මෛත්‍රීපාල සේනානායක මැතිතුමාගේ නම වාගේම, එක්සත් ජාතික පක්ෂය පැත්තෙන් එඩ්වින් ලොකුබණ්ඩාර හුරුල්ලේ මැතිතුමාගේ නම තමයි අපට මතක් වන්නේ.

එතුමා ජීවිතය ගත කළ ආකාරය ගැන සභානායකතුමා සඳහන් කළා. ඇත්ත වශයෙන්ම හුරුල්ලේ මැතිතුමා ලංකාවේ වාර්තාගත වෙලා තිබෙන පැරණිම පවුලකින් පැවත ආ පුද්ගලයෙක්.

එතුමා රජරට ප්‍රදේශයෙන් ආවේ. එතුමා හැම දාම රජරට හිටියා. මේ රටේ බොහෝ දෙනකු රජරට අත හැරලා තෙත් කලාපයට ආපු කාලයේත්, නුවර කලාවියේ ඉඳන් වැඩ කටයුතු කරපු පවුලකින් පැවත එන එතුමාට මේ රට ගැන, අපේ සංස්කෘතිය ගැන විශාල හැඟීමක් තිබුණා. එතුමාගේ දේශපාලනය වුණේ ඒ හැඟීම් පෙන්නලා කරන දේශපාලනය නොවෙයි, තමන්ගේ පක්ෂයේ ප්‍රතිපත්ති අනුව වැඩ කටයුතු කරන එකයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට එතුමා හම්බ වුණේ 1973 දී. ඒ, මා දේශපාලන කටයුතු කරන අවස්ථාවේදී. එතුමා ජීවිතයේ පළමුවැනි වතාවට පරාජය වෙලා තිබුණා. පරාජය වෙලා සිරිකොතට ආපු අවස්ථාවලදී තමයි මට එතුමා මුණ ගැසුණේ. එතුමාත්, මාත් ඇතුළු අප සියලු දෙනාම ආපසු දේශපාලනය කරලා දෙවැනි ජාතික රාජ්‍ය සභාවේ මන්ත්‍රීවරුන් හැටියට පැමිණියා. එතුමා සංස්කෘතික ඇමතිතුමා හැටියට පත් කළා. සමහරු ඇහුවා ගරු ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාගෙන්, "ඇයි එතුමා සංස්කෘතික ඇමති හැටියට පත් කළේ?" කියලා. එතුමා කිව්වා, "සංස්කෘතික ඇමතිතුමාට විශාල වැඩ කොටසක් තිබෙනවා." කියලා. මම ඒක අහ ගෙන හිටියා. ඒත් මම ඒ ගැන අහන්න, ප්‍රශ්න කරන්න ගියේ නැහැ. හේතුව මොකක්ද කියලා මට පස්සේ තේරුණා. මොකද, ගරු ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාට වුවමනා වුණේ මේ රටේ සංස්කෘතිය ඉදිරියට ගෙනෙන්නයි. ඒ වැඩ කටයුතු කළේ සංස්කෘතික අමාත්‍යාංශය මාර්ගයෙන්. අපි හිතුවේ නැති විධියට ගරු හුරුල්ලේ ඇමතිතුමා ඒ වැඩ කටයුතු ක්‍රියාත්මක කළා. ගරු හුරුල්ලේ ඇමතිතුමා සංස්කෘතික ඇමති වූ කාලය මෑත ඉතිහාසයේ අපේ සංස්කෘතියේ, කලාවේ ස්වර්ණමය යුගයක් කියා මා කියන්න කැමැතියි. කවුරුවත් ඒ ගැන බෙර ගහලා කියන්නේ නැහැ. අපේ අතීතය අපට මතක් කර දෙන විධියට, අපේ පැරැණි පොත් ආපසු මුද්‍රණය කරන්න පටන් ගත්තේ එතුමා යටතේයි. එදා ගරු ජනාධිපතිතුමා ඒ පිළිබඳව දැනුම් දුන්නාම මහා වංශය පමණක් නොවෙයි, ත්‍රිපිටකය පවා පළමුවැනි වතාවට සම්පූර්ණයෙන්ම මුද්‍රණය කරලා දුන්නේ ගරු හුරුල්ලේ මැතිතුමාගේ කාලයේදීයි.

අපි එතුමා විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ සංස්කෘතික ත්‍රිකෝණය ගැන කථා කරද්දී. UNESCOවලින් ආධාර අර ගෙන, එදා හිටපු UNESCO මහ ලේකම් එම්බෝ මැතිතුමාගේ ආධාර ලබා ගෙන ලංකාවේ පුරා විද්‍යා ස්ථාන ලෝක සිතියමට ඇතුළු කළේ ගරු එඩ්වින් හුරුල්ලේ මැතිතුමායි කියලා අපි කියන්න කැමැතියි.

සංස්කෘතික ත්‍රිකෝණය කියන්නේ අද අප හැම කෙනාම දන්නා එකක්. ලෝකයත් දන්නවා. 1977 දී ගරු හුරුල්ලේ මැතිතුමා ඇමති වෙන කොට ඒක දැන ගෙන හිටියේ නැහැ. එතුමා කළ ඒ මූලික වැඩ කටයුතු නිසා තමයි අද එවැනි පිළිගැනීමක් ඇති වෙලා තිබෙන්නේ. එතුමා සීගිරිය ලෝක උරුමයක් බවට පත් කළා. මා හිතන හැටියට මෙහෙම වාර්තාවක් එච්.සී.පී. බෙල් මැතිතුමාගෙන් පස්සේ ලංකාවේ නැහැ. ගරු හුරුල්ලේ මැතිතුමා සංස්කෘතික ත්‍රිකෝණ අරමුදල ඇති කරලා එහි වැඩ කටයුතු කර ගෙන ගිහිල්ලා විශාල ප්‍රසිද්ධියක් ලබා දුන්නා. ඒකම ඇති කථා කරන්න එතුමාගේ ජීවිත කාලය ගැන. එතුමා තම කටයුතු එතැනින් අවසන් කළේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බෞද්ධ කටයුතු කොමසාරිස් දෙපාර්තමේන්තුව එතුමා යටතේයි ආරම්භ කළේ. බෞද්ධ කටයුතු කොමසාරිස් දෙපාර්තමේන්තුව ආරම්භ කරලා බෞද්ධාගමට වැඩ කටයුතු කරන්න ඒ අවශ්‍ය වාර්තා, අදාළ නීති අපි ඉදිරිපත් කළේ එතුමාගේ කාලයේදී තමයි. අද තිබෙන බුද්ධ ශාසන අමාත්‍යාංශය ඇති කරන්න පුළුවන් වුණේ එතුමා එදා ගත් ඒ මූලික පියවර නිසායි. එතුමා කිසි විටෙක ඒ කටයුතු අමතක කළේ නැහැ. බෞද්ධ කටයුතුවලට වාගේම ක්‍රිස්තියානි, මුස්ලිම්, හින්දු කටයුතුවලටත් එතුමා ආධාර කළා. මූලාසනයේ සිටින ගරු අස්වර් මන්ත්‍රීතුමාත් දන්නවා සිංහලයෙන් කුරානය සකස් කරන්න කටයුතු කළේ ගරු හුරුල්ලේ මැතිතුමා හිටපු කාලයේ බව. ඒ වාගේම එවකට හිටපු මුස්ලිම් සංස්කෘතික ඇමතිතුමා වූ ගරු මොහොමඩ් මැතිතුමා කරපු සේවයත් අප මෙතැනදී මතක් කරන්න ඕනෑ.

අපේ කලාව දියුණු කරන්න, අපේ නාට්‍ය දියුණු කරන්න ගරු හුරුල්ලේ මැතිතුමාගේ කාලයේ විශාල වශයෙන් ආධාර උපකාර ලැබුණා. කලා මණ්ඩලයෙන් ආපසු නාට්‍ය තරග පැවැත්වීම ආදි සියල්ලම ඇති කළේ ගරු හුරුල්ලේ මැතිතුමාගේ කාලයේ.

1971 කැරැල්ලෙන් පස්සේ මේ රටේ කලාව නැති වෙලා තිබුණේ. එතුමා ඒ කලාවට නව පණක් දුන්නා. සමස්තයක් හැටියට බලපුවාම අපේ හුරුල්ලේ ඇමතිතුමා ප්‍රවාහන ඇමතිතුමා හැටියට හිටපු කාලයට වඩා සංස්කෘතික ඇමතිතුමා හැටියට හිටපු කාලයේ විශාල වැඩ කටයුතු ප්‍රමාණයක් කළා. එතුමාගේ ඒ වැඩ කටයුතු නිසා තමයි අද මේ රටේ සංස්කෘතිය ආරක්ෂා වෙලා තිබෙන්නේ. මට පස්සේ කථා කරන අනෙක් කථිකයන් එතුමා කරපු වැඩ කටයුතු සඳහන් කරයි. එතුමා ඒ හැදුව පදනම නිසා අපේ අතීතයත් ආරක්ෂා වෙලා, ඒ අතීතය ගැන අපි දැනුවත් වෙලා තිබෙනවා. සාහිත්‍ය වෙන්න පුළුවන්, ආගම වෙන්න පුළුවන් ඒ පිළිබඳව දැනුවත් කරන්න වාගේම වර්තමාන කලාව ඉදිරියට ගෙන යන්නත් එතුමා ක්‍රියා කළා. අපේ හිටපු සංස්කෘතික ඇමතිතුමන්ලා එක්ක බලන කොට මම හිතන හැටියට හුරුල්ලේ මැතිතුමා තියපු වාර්තාව වෙන කාටවත් තියන්න බැහැ. අනාගතයේත් ඒක කරන්න පුළුවන්ද කියන්න මම දන්නේ නැහැ. එහෙත් එතුමා මේ කටයුතු ගැන කෑ ගැහුවේ නැහැ. එතුමා මේ කටයුතු ගැන බෙර ගහන්න ගියේ නැහැ. "මම දේශ ප්‍රේමියා" කියලා කියන්න ගියේ නැහැ. තමන්ට කරන්න තිබෙන වැඩ කටයුතු කළා.

ආණ්ඩුකාරවරයකු හැටියට, ආණ්ඩුකාරවරයකු හැසිරෙන්න ඕනෑ ක්‍රමයට තමයි එතුමා හැසිරුණේ. එහිදී එතුමා දේශපාලනය කරන්න ගියේ නැහැ. එතුමා පැත්තකට වෙලා ආණ්ඩුකාරවරයා හැටියට වැඩ කරලා ඒ පළාතේ හැම කෙනාගේම ගරුත්වය දිනා ගත්තා. එහෙම නම් එතුමා ගත කළේ ආදර්ශවත් ජීවිතයක්.

අද වාගේ නොවෙයි. එතුමා දේශපාලන කටයුතු ආරම්භ කරලා අවසන් කරන කොට දේශපාලන කටයුතු ආරම්භ කළ දාට වඩා දුප්පත්. මොකද එදා දේශපාලනය කියන්නේ දේශපාලනයට ඇතුළු වෙලා වියදම් කරන එක විතරයි, හම්බ කරන එක නොවෙයි. දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමා ඒක හොඳට දන්නවා. අද ඊට වඩා වෙනස් තත්ත්වයක් තිබෙන්නේ. කෙසේ හෝ හොඳ දේශපාලන චරිතයක් හැටියටත්, රටට සේවයක් කරපු කෙනකු හැටියටත් එඩ්වින් හුරුල්ලේ මැතිතුමා අපි මතක් කරනවා. එතුමා නැති වීම ගැන අපේ කනගාටුව දැනටම එතුමාගේ භාර්යාවටත්, පවුලේ සියලු දෙනාටත් ප්‍රකාශ කරලා තිබෙනවා. එඩ්වින් හුරුල්ලේ මැතිතුමාට නිවන් සැප ලැබේවා කියා යළිත් ප්‍රාර්ථනා කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
දැන් ගරු එස්.ඊ. මුතුකුමාරණ මන්ත්‍රීතුමා.

ඊට ප්‍රථම කවුරු හෝ ගරු මන්ත්‍රීවරයෙක් ගරු චන්ද්‍රානි බණ්ඩාර ජයසිංහ මහත්මියගේ නම මූලාසනය සඳහා යෝජනා කරන්න.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

"ගරු චන්ද්‍රානි බණ්ඩාර ජයසිංහ මහත්මිය මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු චන්ද්‍රානි බණ්ඩාර ජයසිංහ මහත්මිය මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (திருமதி) சந்திராணி பண்டார ஜயசிங்க அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. ALHAJ A.H.M. AZWER *left the Chair, and* THE HON. (MRS.) CHANDRANI BANDARA JAYASINGHE *took the Chair.*

[අ. භා. 3.28]

**ගරු එස්. සී. මුතුකුමාරණ මහතා**
(மாண்புமிகு எஸ்.சீ. முத்துகுமாரன)
(The Hon. S.C. Mutukumarana)

මම සන්තෝෂ වනවා, අනුරාධපුර දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීතුමියක් මූලාසනයේ ඉන්න වෙලාවේ, අනුරාධපුර දිස්ත්‍රික්කයම නියෝජනය කරලා අපේ ප්‍රදේශයට ඉමහත් සේවාවක් කරලා අපෙන් වියෝ වුණු ඊ.එල්.බී. හුරුල්ලේ මැතිතුමා පිළිබඳව ශෝකය ප්‍රකාශ කිරීමට අවස්ථාවක් ලැබීම ගැන.

1919 ජනවාරි මස 19 වැනි දින ටී.බී. හුරුල්ලේ රටේ මහත්මයාටත්, ඇලිස් හුලන්කුලම මහත්මියටත් දාව හුරුල්ලේදී උපත ලැබූ මෙතුමා මූලික අධ්‍යාපනය ලැබුවේ යාපනයේ ශාන්ත පැට්‍රික් විද්‍යාලයෙන්. ඊට අනතුරුව මහනුවර ත්‍රිත්ව විද්‍යාලයේත්, කොළඹ ශාන්ත ජෝශප් විද්‍යාලයේත් උසස් අධ්‍යාපනයක් ලබපු මෙතුමා හුරුල්ලේ ප්‍රදේශයේ රටේ මහත්මයා බවට පත් වුණා. මෙතුමා 1943 වසරේදී සිවිල් සේවයට බැඳිලා ආදායම් පාලක නිලධාරි වශයෙන් දකුණු වවුනියාව, නාඋල, කහටගස්දිගිලිය වැනි ප්‍රදේශවල කටයුතු කරන කාලයේ, හොරොව්පතාන ආසනයේ එවකට හිටපු මන්ත්‍රී පෝලියැද්ද මහ දිසාවේගේ හදිසි අභාවයෙන් පස්සේ, එක්සත් ජාතික පක්ෂයේ හොරොව්පතාන ආසනයේ සංවිධායකවරයා වශයෙන් සර් ජෝන් කොතලාවල මැතිතුමා මෙතුමා තෝරා පත් කර ගත්තා.

මෙතුමාගේ දේශපාලනය ජීවිතයෙන් අපිත් යම් කිසි ආදර්ශයක් ගත්තා. හොරොව්පතාන ප්‍රදේශයේ අපේ දේශපාලන ගමනේදී අපි සැරිසරන විට අදත් ඒ ගැමියන් කියන කථාවක් තමයි හුරුල්ලේ මහත්මයාගේ දේශපාලන ගමන. හුරුල්ලේ මහත්මයා තමන්ගේ දේශපාලන එදිරිවාදින්ට හතුරුකම් කළේ නැහැ. ඒ පිළිබඳ කථාවක් මට මතක් වනවා. මෙතුමා එක්තරා ගමකට ඡන්දය ඉල්ලන්න යන කොට ඒ ගමේ හිටපු නායකයා වෙනත් පක්ෂයක -අපේ පක්ෂයේ- පුද්ගලයෙක්. මෙතුමා ගිහිල්ලා එතුමාගෙන් ඡන්දය ඉල්ලන කොට ඒ පවුලේ වැඩිහිටියන් කිව්වේ, "කොච්චර හිතවත්කම් තිබුණත් අපට ඔබතුමාට ඡන්දය දෙන්න බැහැ.

අපට අපේ පක්ෂය අතහැර යන්නට බැහැ" කියායි. එතකොට එතුමා ඒ පවුලේ අයට කියා තිබෙනවා "මට ඡන්දය එපා. මා දැන් ඇවිදලා එනවා. මා එනකොට දවල් කෑමට මඤ්ඤොක්කා ටිකක් තම්බා තියන්න" කියා. එතුමා ඇවිදලා ආපසු ඒ ගෙදරටයි කෑමට ආවේ. ඒ ගෙදර අය එතුමාට ඒ කිව්ව ආකාරයටම කෑම ටික හදා දුන්නා. එතුමා ඒ ගෙදරින් දවල් කෑම කාලා අවසානයේ යනකොට ඒ අපේ පක්ෂයේ හිටිය පුද්ගලයාත් එතුමාගේ පැත්තට ඉබේම ගිහින්.

මානව හිතවාදියෙක් වූ එතුමා ජනතාව සමඟ ඉතා කිට්ටු සමීප සම්බන්ධතාවක් ඇති කර ගෙනයි දේශපාලනය කළේ. එම නිසායි 1956 වර්ෂයේදී එක්සත් ජාතික පක්ෂයේ එවකට දේශපාලන ප්‍රබලයකුව සිටි ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා පවා කැලණිය ආසනය පරදින කොට අලුතෙන් ඇවිත් ඉතා කෙටි කාලයකදී හොරොව්පතාන වාගේ ආසනයක වැඩි ඡන්ද දෙදහස් ගණනකින් ජයග්‍රහණය කර ඒ පතාක යෝධයින් රළට -එක්සත් ජාතික පක්ෂයට- එතුමාට පිවිසෙන්නට ලැබුණේ. එතුමා රාජකාරි කරන කාලය තුළ ගැමියන් එක්ක ආශ්‍රය කිරීම නිසා ජනතා හදවත් තුළ ඒ හුරුල්ලේ නාමය කිඳා බැස තිබෙනවා. එම නිසා තමයි එතුමාට හැකියාව ලැබුණේ, දේශපාලන ක්ෂේත්‍රයේ ඉදිරියට යන්න. එතුමා 1956 මැතිවරණයෙන් ජයග්‍රහණය කළා. ඩී.එස්. සේනානායක මැතිතුමාගේ කාලයේ ඉඩම් හා ඉඩම් සංවර්ධන ඇමතිවරයාව සිටි එතුමාගේ මාමා කෙනෙකු වූ සී.බී. බුලන්කුලම මැතිතුමාගේ ආභාෂය එතුමා ලබන්නට ඇති. ඒ ආභාෂය තුළ එතුමා ඒ දක්ෂතාව පෙන්නුවා. 1965 - 1970 ඩඩ්ලි සේනානායක අගමැතිතුමාගේ කාලයේ ප්‍රවාහන ඇමති ධුරය හෙබවුයේ මෙතුමා විසින්. මේ කාලයේදී ලංකාවේ දුම්රිය සේවය දියුණු කිරීම සඳහා පැරණි වාෂ්ප දුම්රිය එන්ජින් අයින් කර ඒ වෙනුවට ඩීසල් එන්ජින් එකතු කොට දුම්රිය සේවයේ අලුත් කාල පරිච්ඡේදයක් ඇති කළා; ඉදිරි පිම්මක් පැන්නා. ඒ වාගේම ලංකා ගුවන් සේවයට අයත් එයාර් ලංකා ගුවන් සේවයේ තිබුණු පැරණි, අබලන් වූ ගුවන් යානා වෙනුවට අලුත් ගුවන් යානා ගෙනැවිත් මුල් වරට නවීන ජෙට් ගුවන් යානා කිහිපයක් ගුවන් සේවයට එකතු කරන ලද්දේත් මෙතුමාගේ කාලයේදීයි.

පසුව 1977 වර්ෂයේ ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාගේ සමයේ පිහිටුවනු ලැබූ රජයේ සංස්කෘතික ඇමතිවරයා වශයෙන් එතුමා පුරා විද්‍යා ක්ෂේත්‍රයේ නව ප්‍රබෝධයක් ඇති කිරීමට සමත් වුණා. සංස්කෘතික ත්‍රිකෝණ වැඩ පිළිවෙළ ආරම්භ කළා පමණක් නොව යුනෙස්කෝ වැඩ පිළිවෙළ යටතේ අපේ රටේ සංස්කෘතික දායාද රැසක් ලෝක උරුමයන් බවට පත් කිරීමට එතුමාට හැකියාවක් ලැබුණා. ඒ වාගේම දේශපාලන ගමනේදී, 1970 වර්ෂයේදී එතුමා පැරදිලා කෝච්චියේ ගමට යන කොට සූට්කේස් එක පමණයි අරගෙන ගිහින් අනුරාධපුරයෙන් බැහැලා තියෙන්නේ. එතුමා නිහතමානීව තමන්ගේ දේශපාලන ගමන හරියාකාරව යමින් අපේ දිස්ත්‍රික්කය තුළ ජනතාව වෙනුවෙන් විශාල සේවයක් කළ, කැප කිරීමක් කළ ජන නායකයෙක්.

එතුමා දේශපාලනයෙන් සමු ගත්තාට පස්සේ මහජන සේවය අත් හැරියේ නැහැ. දිගටම සමාජ සේවා කටයුතුවල නිරතව සිටියා. ලෝක බෞද්ධ සම්මේලනයේ සභාපති තනතුර දැරූ එතුමා ලෝකය පුරා රටවල් රැසක සංචාරය කොට නිර්මල ථෙරවාදී බුද්ධ ධර්මය ඒ රටවල් පුරා ප්‍රචලිත කිරීමට සෑහෙන සේවාවක් කළා. දුටුගැමුණු රජතුමාගේ හස්මාවශේෂ සෙනරත් පරණවිතාන මැතිතුමා සොයා ගෙන ඒවා පැත්තක තියාලයි තිබුණේ. ඒක "ලංකාදීප" පුවත් පතෙන් පෙන්නුවාට පස්සේ එතුමා ඒක ලංකාව වටා ගෙන යමින් දුටුගැමුණු රජතුමාට ලැබෙන්නට ඕනෑ ගෞරවය ලබා දීමට කටයුතු කළා. ඒ සඳහා පෙරමුණ ගත්තා.

අපේ ප්‍රදේශයේ වැව් අමුණු, මංමාවත් දියුණුවට විශාල සේවාවක් කළ එතුමා අදත් පක්ෂ විපක්ෂ භේදයෙන් තොරව හොරොව්පතාන ජනතාවගේ හදවත් තුළ ජීවත් වෙනවා. එම නිසා ඊ.එල්.බී. හුරුල්ලේ මැතිතුමාගේ අභාවය හොරොව්පතාන ජනතාවට පමණක් නොව සමස්ත ලංකාවේම ජනතාවට වූ විශාල පාඩුවක්. එතුමා වෙනුවෙන් ශෝකය පළ කරන මේ අවස්ථාවේදී, අප අදහන ආගම අනුව එතුමාට අමා මහ නිවන් සුව ලැබේවායි පතමින් මා නිහඬ වෙනවා.

[අ. භා. 3.35 ]

**ගරු කරු ජයසූරිය මහතා**
(மாண்புமிகு கரு ஜயசூரிய)
(The Hon. Karu Jayasuriya)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ලංකා දේශපාලන ක්ෂේත්‍රයේ විසූ කීර්තිමත් පුද්ගලයකු වශයෙන් හඳුන්වන්න පුළුවන් ගරු ඊ.එල්.බී. හුරුල්ලේ හිටපු අමාත්‍යතුමාගේ විශිෂ්ට චරිතාපදානය සම්බන්ධයෙන් මීට ඉහත කථා කළ ආණ්ඩු පක්ෂයේ සභානායකතුමාත්, විපක්ෂ නායකතුමාත්, ඒ වාගේම හුරුල්ලේ මැතිතුමා නියෝජනය කරන දිස්ත්‍රික්කයෙන් පැමිණි එස්.සී. මුතුකුමාරණ මන්ත්‍රීතුමාත් සඳහන් කළ නිසා සහ අපේ පක්ෂයේ තවත් කීප දෙනෙක් එතුමා ගැන ගුණ කථන කරන්න සූදානම්ව සිටින නිසාත්, වෙලාව සීමිත නිසාත් මම දීර්ඝ ගුණ කථනයක් නොකළත් එතුමා වෙනුවෙන් සඳහන් කළ ඒ කරුණු අපිත් මේ අවස්ථාවේදී අනුමත කරන බව මම පළමුවෙන්ම කියන්න කැමැතියි.

ඒ වාගේම මේ රටේ කීර්තිමත්, වැදගත් පවුලක දෙමවුපියන්ට දාව මෙරටට බිහි වූ ගරු ඊ.එල්.බී. හුරුල්ලේ මැතිතුමා දේශපාලන වශයෙන් අපි ආපහු හැරිලා බලන කොට 1956 සිට 1970 දක්වා කාලය තුළ දේශපාලන ක්ෂේත්‍රයේ නමක් රැන්දූ කීර්තිමත් දේශපාලනඥයෙකු බව අපට සඳහන් කරන්න පුළුවන්. ඒ වාගේම ඒ මහතා රජ රට ගොවි ජනතාවගේ හදවත් දිනා සිටි විශේෂ පුද්ගලයෙක්. මෙරට සිටි ප්‍රවීණ දේශපාලනඥයෙක්, ප්‍රජාතන්ත්‍රවාදියෙක් ඒ වාගේම නිහතමානී චරිතයක් ලෙසද වූ ඒ ගෞරවය එතුමා මිය යන තෙක්ම ලබා සිටියා.

එතුමා දේශපාලනයට අවතීර්ණ වුයේ ආදායම් පාලක නිලධාරියෙකු වශයෙන් සේවයේ යෙදී සිටියදියි. එදා ඩඩ්ලි සේනානායක මැතිතුමාගේ ගෞරවය දිනා සිටි එතුමා සියලුම එක්සත් ජාතික පක්ෂ නායකයින්ගේ විශ්වාසය දිනා ගෙන පළමුවෙන්ම හොරොව්පතාන ආසනයට තරග වැදිලා වැඩි ඡන්ද 13,982ක් ලබා ගනිමින් ජයග්‍රහණය කිරීමට සමත් වුණා. ඊට පස්සේ 1970 දී යළිත් පත් වීමට බැරි වුවත්, 1977 දී පාර්ලිමේන්තුවට තේරී පත් වීමට එතුමා වාසනාවන්ත වුණා. ඒ වාගේම අපට මතකයි, 1977 මැතිවරණයේදී එතුමා ලත් ඒ විශිෂ්ට ජයග්‍රහණය එදා එක්සත් ජාතික පක්ෂයට ශක්තියක් වුණු බව. මුලින්ම ජේ.ආර්. ජයවර්ධන නායකතුමාගේ ප්‍රධානත්වයෙන් එතුමා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍ය පදවියට පත් වුණා. සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යවරයා වශයෙන් එතුමා කළ සේවාව ගැන මීට ඉහත කථාවලදී දීර්ඝ ලෙස සඳහන් වුණා. විශේෂයෙන්ම අපේ සංස්කෘතිය නැවතත් ගොඩ නැංවීමට, ඒ වාගේම සංස්කෘතියේ උන්නතිය තකා එතුමාණන් ගත් විවිධ පියවර ගැන මෙහිදී සඳහන් වුණා.

එතුමා 1988 දී පාර්ලිමේන්තුවෙන් ඉවත් වුණාට පසු මධ්‍යම පළාතේ ආණ්ඩුකාරවරයා වශයෙන් කලක් සේවය කළා. ඊට පස්සේ උතුරුමැද පළාතේ ආණ්ඩුකාරවරයා වශයෙන්ද, ඒ වාගේම එතුමා කලක් ඕස්ට්‍රේලියාවේ ශ්‍රී ලංකා මහ කොමසාරිස්වරයා වශයෙන්ද විශිෂ්ට සේවාවක් කළා. මේ පදවි දැරූ සෑම අවස්ථාවකදීම ඒ පදවියේ ගෞරවය එතුමා ආරක්ෂා කළා. එයත් අපි සඳහන් කරන්න ඕනෑ. අමාත්‍යවරයෙක් වශයෙන් බලය ඇති විටත්, බලය නැති විටත් එතුමා සම ජීවිකාවක් ගත කළා. එතුමාට දේශපාලන හතුරෝ සිටියේ නැහැ. ඒ නිසා තමයි එතුමාට ජනතාව ආදරය කළේ. පක්ෂ භේදයෙන් තොරව එතුමාට ජනතාව ආදරය කළා. ඕස්ට්‍රේලියාවේ මහ කොමසාරිස් වශයෙන් කටයුතු කරන කාලයේදී ශ්‍රී ලංකාවත් ඕස්ට්‍රේලියාවත් අතර තිබූ සම්බන්ධතාව ශක්තිමත් කිරීමට එතුමාට හැකි වුණා.

ඒ වාගේම තවත් කාරණයක් මම විශේෂයෙන් සඳහන් කරන්න ඕනෑ, විපක්ෂ නායකතුමාත් මේ ගැන සඳහන් කළා. එනම් ආණ්ඩුකාර පදවිය දරන කාලයේ එම පදවියේ ගෞරවය ආරක්ෂා කරමින් කටයුතු කළා මිසක්, එතුමා එම පදවිය හොබවමින් කිසිම අවස්ථාවක දේශපාලනය කළේ නැහැ. ඒ පදවියේ සමබරභාවය, මධ්‍යස්ථභාවය රැක ගනිමින්, එතුමා ඒ ආණ්ඩුකාර පදවියේ බලතල හා වගකීම් බොහොම ගෞරවාන්විතව ඉෂ්ට කළා.

මහනුවර ත්‍රිත්ව විද්‍යාලයේ හා කොළඹ ශාන්ත ජෝෂප් විද්‍යාලයේ අධ්‍යාපනය ලැබූ එතුමා සිවිල් සේවයට බැඳී වවුනියාව, කහටගස්දිගිලිය හා නාඋල ආදායම් පාලක නිලධාරි වශයෙන් කටයුතු කළා. ඒ වාගේම 1965-1970 අතර පැවති, ඩඩ්ලි සේනානායක රජයේ ප්‍රවාහන ඇමති වශයෙන් එතුමා මෙරට ප්‍රවාහන සේවය දියුණු කිරීමට කටයුතු කළ ආකාරයත් අපට මේ අවස්ථාවේදී මතක් වෙනවා. විශේෂයෙන්ම ඒ සේවාව කාර්යක්ෂම කිරීමට, එය ලාභ ලබන සේවයක් වශයෙන් ඇති කිරීමට වාගේම ප්‍රවාහන සේවාවේ සේවක සේවිකාවන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කර දීමට එතුමා විශාල මෙහෙවරක් ඉෂ්ට කළා. 1994 දී දේශපාලන කටයුතුවලින් සමු ගත් හුරුල්ලේ මැතිතුමා වාසනාවන්ත, වැදගත් දරුවන් පස් දෙනකුගේ සෙනෙහබර පියෙක්. ඒ දරුවෝ එතුමාගේ නම ආරක්ෂා කරමින්, එතුමාට ගෞරවය ලබා දෙමින් කටයුතු කරන බවත් මේ අවස්ථාවේ සඳහන් කරන්න ඕනෑ. එතුමාගේ පුත්‍ර තේමිය හුරුල්ලේ මැතිතුමා දේශපාලනඥයෙක් වශයෙන් තම පියාගේ අඩි පාරේ යමින් විශාල සේවාවක් දේශපාලන ක්ෂේත්‍රයට, විශේෂයෙන්ම උතුරුමැද පළාතට කරපු බවත් මේ අවස්ථාවේදී මම සඳහන් කරන්න කැමැතියි.

විද්‍යා හා තාක්ෂණ කටයුතු භාර අමාත්‍යවරයා වශයෙන් තේමිය හුරුල්ලේ මැතිතුමා කටයුතු කරපු ආකාරය මට මතකයි. එක්සත් ජාතික පක්ෂ රජය පැවතුණු සෑම අවස්ථාවකදීම එතුමා තිරය පිටුපස ඉඳලා අපේ පක්ෂයට විශාල ශක්තියක්, විශාල සහයෝගයක් ලබා දුන්නා. ඒ වාගේම මට මතකයි, විදුලි සන්දේශ නියාමන කොමිෂන් සභාවේ සභාපති පදවිය දරද්දී තාත්තාගේ ගෞරවය ආරක්ෂා කරමින් බොහොම කාර්යක්ෂමව එතුමා කටයුතු කළ ආකාරය.

ලෝක බෞද්ධ සම්මේලනයේ සභාපති වශයෙන් දිවංගත අපේ හුරුල්ලේ මැතිතුමා බුද්ධ ශාසනයේ චිරස්ථිතිය සඳහා විශාල සේවාවක් කළා. ලොව පුරා රටවල් රාශියක සංචාරය කරමින් නිර්මල ථෙරවාදී බුදුදහම ප්‍රචලිත කිරීමට එතුමා කරපු සේවාව මේ අවස්ථාවේදී අප සිහිපත් කරනවා. කවදත් දේශ හිතෛෂී පුද්ගලයකු වූ මෙතුමා මෙරට බුදුදහම වෙනුවෙන් කරපු මහඟු කාර්යය අනන්තයි; අප්‍රමාණයි.

අනුරාධපුර කෞතුකාගාරයේ කිසිවකුගේ අවධානයට ලක් නොවන අයුරින් අඳුරු මුල්ලක තිබූ දුටුගැමුණු රජතුමාගේ භස්මාවශේෂ පිළිබඳව එදා "ලංකාදීප" පත්‍රයේ රත්නපාල විතානයන් විසින් හෙළිදරව් කිරීමෙන් පසු එතුමා අමාත්‍යාංශයට ගෙන්නලා ඒ ගැන අදහස්, විස්තර ලබා ගෙන දුටුගැමුණු රජතුමාගේ භස්මාවශේෂ මහජන ගෞරවය දැක්වීමට රට පුරා ප්‍රදර්ශනය කිරීමටත් එතුමා කටයුතු කළා. දේශපාලනඥයෙක් වශයෙන් මහත්මා දේශපාලනයක් කළා; වැදගත් දේශපාලනයක් කළා. ඒ වාගේම දේශපාලනයේදී තමන්ගේ මිල මුදල් වියදම් කළා. තමන්ගේ වස්තුව දේශපාලනයෙන් නැති කර ගත්ත අවංක දේශපාලනඥයකු වශයෙනුත් මම මේ අවස්ථාවේ එතුමා ගැන විශේෂයෙන්ම සඳහන් කරන්න ඕනෑ. දේශ හිතෛෂී, ජාති මාමක, ශාසන හිතකාමී, ගෞරවනීය පුද්ගලයන් රටට, දැයට අවශ්‍ය වී ඇති කාල පරිච්ඡේදයක එතුමා අපෙන් සමු ගත්තත් එතුමාගේ නාමය මේ රටේ ජනතාවත්; උතුරුමැද පළාතේ ජනතාවත්, එක්සත් ජාතික පක්ෂයේ අපිත් සෑම විටම සිහි කරන බව කියමින් එම මැතිනිය, දරුවන් ඇතුළු පවුලේ සියලු දෙනාටත්, අනික් ඥාතීන්ටත් අපගේ ශෝකය පුද කරමින් එතුමාට නිවන් සුව ලැබේවා කියා අපි ප්‍රාර්ථනා කරනවා.

[අ. භා. 3.45]

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

*Bismillahir Rahmanir Raheem.*

Madam Chairperson, a genial, gentle and gentleman politician, that is how I would describe the late Hon. E.L.B. Hurulle.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Order, please! ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව ගරු චන්ද්‍රානි බණ්ඩාර ජයසිංහ මහත්මිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, மாண்புமிகு (திருமதி) சந்திராணி பண்டார ஜயசிங்க அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. (MRS.) CHANDRANI BANDARA JAYASINGHE *left the Chair and* MR. DEPUTY SPEAKER *took the Chair.*

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

Hon. Deputy Speaker, I was just beginning my eulogy on the late Hon. E.L.B. Hurulle. He was soft-spoken. He walked without hurting even an ant on land. His association and affinity with his fellow beings were highly elated. Anybody who knew and came across the late Hon. E.L.B. Hurulle never believed that he was a politician, never believed that he was a Minister and never believed that he was a great man. He was so simple and so humble. If a politician of this era wants to learn a lesson of simplicity, geniality, gentlemanship, he can very well follow the footsteps of the late Hon. E.L.B. Hurulle.

When we were young doing politics, we heard about Hon. E.L.B. Hurulle. After the 1956 Election we thought he was a great revolutionary. We wanted to see in the House, a fire-eating politician and a great orator. But, when we came to the Gallery and watched his performances, we went home satisfied that even out of the eight Members in the Opposition at that time -විපක්ෂයේ මන්ත්‍රීන් අටක් හිටිය කාලයේ, බණ්ඩාරනායක යුගයේ- he was a man with a simple demeanour and a serene personality but could meet giants in the legislature at that equal level. He had deep in him that much of courage, boldness and foresight. He was far-sighted, all right.

Then, Sir, in the 1956 Election, together with the late Hon. M.D. Banda from Maturata, he played an important role that Erskine May would like one to perform in a Parliament. He was so simple but he was robust. He brought before Parliament all the problems of the country by way of Oral Questions. Here we have to learn this lesson from the Hon. E.L.B. Hurulle. I watched him very closely from the Gallery those days. My habit and hobby was sitting in the Gallery and listening to great politicians of that period with my cousin Dr. Harris Z. Dean. He asked Supplementary Questions precisely according to the Standing Orders. He never deviated from them - you can ask three Supplementary Questions basing on the reply given to the original Question. He did not deviate from it, nor did he beat about the bush. That is a lesson that we, the present Parliamentarians must learn, as I always point out to some of my Colleagues in the Opposition. What was the end result? The Hon. E.L.B. Hurulle won the hearts of the people by spotlighting their grievances in a lucid form.

He won the confidence of the fellow parliamentarians. The Speaker liked him; everyone else liked him and we liked him. That was Hon. Hurulle par excellence. When he was appointed as the Minister of Communications, we used to have several meetings with him. At that time the Minister of Labour, Employment and Housing was the Hon. M.H.Mohamed. Together with him we used to visit him and talk to him. He was invited for every Muslim function because everybody liked him. It is when he was Minister of Communications, he had a large area to cover, not only in the field of transport, but also in aviation.

There was a time when the late Hon. Dudley Senanayake started the agricultural revolution to grow more food. The late Hon. Hurulle as minister at that time was instrumental in importing mini Mokes to this Island. They were distributed among the farmers for agricultural pursuits. Then, I happened to be an officer at Air Ceylon at that time and he was the minister. Later I came to join Hon. Mohamed seconded for service. Air Ceylon in itself was a large aviation establishment. It was during his time, I remember very well at that time, the Nord and the Trident Aircraft carried all passengers from Colombo to right across the country; to KKS, to Batticoloa, to Ampara, to Galoya, to Trincomalee and at one point of time to Weerawila also.

I think today, Sir, we have to take a leaf out of this and start domestic flights. That will be very helpful for the people who are coming from abroad, tourists, Parliamentarians and others. Those days parliamentarians used to come to Air Ceylon. They bought air tickets to KKS from Colombo. That helped them a great lot.

Hon. Hurulle also introduced a novel system what was called the Japanese system of paddy growing, yielding a big harvest. He was called the "රජරට ගොවි ජනතාවගේ හදවත දිනා සිටි මානව හිතවාදියා". He went to the village. He rehabilitated tanks. He had a very good knowledge about the country's irrigation system. He was well aware of the grievances and the hardship of the farmers as well. Then, Sir, the momentous period came in his life and our lives, when he was appointed the Minister of Cultural Affairs. Mention was made about the Cultural Triangle which he initiated and got it declared a world

heritage - ලෝක උරුමය. He went to several countries and was instrumental in the revival of cultural activities not only concerning the Buddhist and Sinhalese, even the Hindus, Christians and the Muslims.

The most significant event as far as we the Muslims are concerned took place, when late Hon. Edwin Hurulle was the Minister of Cultural Affairs. The stupendous task of translating the Holy Quran into Sinhala for the fist time in Sri Lanka was completed during this period. Help and assistance readily came from the then Prime Minister, Hon. Sirimavo Bandaranaike. I remember, Sir, Razik Fareed, the Life President of the Moors Islamic Cultural Home and his three joint secretaries, Mr. A.H. Macan Markar who was also an MP in this House earlier, Mr. A.I.L Marikar and Mr. M.H.M. Kamil.

They also created record at that time for being joint secretaries for 42 long years of a movement in our country This is the first time in Sri Lanka such a thing had happened.

There was a great English scholar, Mr. A.I.L. Marikar, who helped the group of translators approved by the late Hon. Hurulle - Alhaj Moulavi M.I. Abdul Hameed (Noori), Moulavi A.C.M. Lafir Alim Sahib, Alhaj Moulavi Shahul Hameed and also Mr. Pinoris Wickramasinghe - who helped to release the Holy Quran in Sinhala and made arrangements to have it launched at Temple Trees. That was one of the most significant features in the late Hon. E.L.B. Hurulle's life. The Muslim community will never forget that. He was also given the greatest honour of "Deshamanya" for all his splendid services. He then became a diplomat and was sent to Australia. He did his job very well as was said here. Then, Sir, even as the Minister of Cultural Affairs, දේශමාමක, ජාතිමාමක, විශ්වාසවන්ත කියලා ප්‍රකාශ නොකර එතුමා වැඩ කළා කියලා මෙතැනදී විරුද්ධ පක්ෂයේ නායකතුමා කිව්වා. ඒක ඇත්ත. එතුමා ජාතියෙන් පට්ටමක් ලබා ගැනීම පිණිස සේවය කළේ නැහැ. හුරුල්ලේ මහත්මයා උපන් බිමට ආදරය කළ නායකයෙක්. ඒක අපි අවධාරණයෙන් කිව යුතුයි මේ අවස්ථාවේදී. බොරු ශෝභාවන් එතුමා ළඟ තිබුණේ නැහැ. ඒක නිසා ඒ අනගි චරිතය අපි කවදත් අගය කළ යුතුයි. අපට මේවා අමතක කරන්න බැහැ.

He was also appointed the Governor of the North-Central Province. That land he knew like the lines of the palms of his hands. He helped those farmers and other people to uplift their standards of living.

His beloved son, Mr. Themiya L.B. Hurulle, is a very good and close friend of ours. I established a close friendship with him during his late father's time. Themiya himself was a fine character as was his beloved father.

He is genial, friendly and truthful. We had a Science Exhibition in the railway station which was a novel thing to Puttalam. Mr. Themiya Hurulle initiated and inaugurated that in the Puttalam Railway Station when I was a Member of Parliament for Puttalam. Sir, that friendship is still continuing.

Sir, at this moment, we remember the late Hon. E.L.B. Hurulle for all what he had done for this country and for all the communities - the Sinhalese, the Tamils, the Muslims, the Hindus and the Christians. Today, we feel sad that we lack people of that calibre who are patriotic and loyal to his own country. When I met him in his later life he agreed with me saying, "You did the correct thing by joining President Mahinda Rajapaksa" and he also appreciated the work that had been done.

Hon. E.L.B. Hurulle was a distinguished Member of this House for 24 years and 18 days. May he attain නිවන් සුව!

Thank you.

[අ. භා. 3.59]

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එක්තරා වකවානුවක ඊ.එල්.බී. හුරුල්ලේ මැතිතුමා අපේ රටේ දේශපාලනයේ දැවැන්තයෙක් හැටියට කටයුතු කළා. මම හිතන්නේ හුරුල්ලේ පරම්පරාව අපේ රටේ තිබෙන පරපුරවල්වලින් ඉපැරණි පරපුරක්. ශ්‍රී මහා බෝධීන් වහන්සේ ලංකාවට වැඩමවන කොට හුරුල්ලේ පරපුරේ අය ලංකාවට ආවා කියලා ඉතිහාස පොත්වල සඳහන් වනවා. අදත් ශ්‍රී මහා බෝධීන් වහන්සේ බලා ගන්නේ එතුමාගේ පරපුරේ අයයි. එම නිසා හුරුල්ලේ මැතිතුමාට සිංහලකමට, බෞද්ධකමට පරම්පරාවෙන්ම, ආභාෂයෙන්ම ලැදියාවක් තිබුණා.

එතුමා 1956 දී මැතිවරණයකට ඉදිරිපත් වුණු පළමුවෙනි අවස්ථාවේදීම පාර්ලිමේන්තුවට තේරී පත් වුණා. ඒ මැතිවරණයේදී එක්සත් ජාතික පක්ෂයේ දැවැන්තයන් අන්ත පරාජයට පත් වන කොට එතුමාට ජයග්‍රහණය කරන්න අවස්ථාවක් ලැබුණා. මට මතකයි 1977 මැතිවරණයෙන් පසුව එතුමා බුද්ධ ශාසන හා සංස්කෘතික ඇමතිවරයා හැටියට කපිලවස්තු ධාතූන් වහන්සේලා ලංකාවට වැඩමවලා එතුමාට උපතින්ම තිබුණ බෞද්ධ උරුමය තුළින් තවදුරටත් මේ රටේ ජනතාවට සේවාවක් ලබා දීමට කටයුතු කළා.

අපේ සභානායකතුමාත්, විපක්ෂ නායකතුමාත් ඒ වාගේම තවත් මන්ත්‍රීවරුන් ගණනාවකුත් අද එතුමා පිළිබඳව අදහස් ප්‍රකාශ කළා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමා දේශපාලනයට එන්න කලින් ආදායම් පාලක නිලධාරියෙක් හැටියට -DRO මහත්මයෙක් හැටියට- කටයුතු කළා. ප්‍රාදේශීය ලේකම්වරුන්ට කලින් හිටියේ උප දිසාපතිවරු. උප දිසාපතිවරුන්ට කලින් හිටියේ DRO මහත්වරු. ඒ කාලයේ ආදායම් පාලක නිලධාරින්ට විශාල දැනුමක් තිබුණා. ඔවුන්ට ඉංග්‍රීසි සහ සිංහල භාෂා පිළිබඳව විශේෂ දැනුමක් තිබුණා. ඒ වාගේම හුරුල්ලේ මැතිතුමාට ද්‍රවිඩ භාෂාව පිළිබඳ දැනුමකුත් තිබුණා. එතුමා එක්තරා වකවානුවක යාපනයේ අධ්‍යාපනය ලැබූ කෙනෙක්. ඒ කාලයේ උතුරු මැද පළාතේ බොහෝ පවුල්වල අය ඉගෙන ගත්තේ යාපනයේ. එතුමාට ද්‍රවිඩ භාෂාව ගැන මනා අවබෝධයක් තිබුණා. ඒ කාලයේ, එක්දහස් නවසිය තිස් ගණන්වල උඩරට පළාත්වල හිටපු තරුණයින්ට ආදායම් පාලක නිලධාරි තනතුර සඳහා වෙනම විභාගයක් තිබුණා. They were called the Kandyan DROs. වෙනම විභාගයක් තියලා ඒ ඒ පළාත්වලින්ම මේ තනතුර සඳහා කට්ටිය තෝර ගත්තා. මම හිතන්නේ ඊ.එල්.බී. හුරුල්ලේ මැතිතුමා පළමුවෙනි කණ්ඩායමට අයත් වුණා. උඩරට පළාත්වල ඒ පළාත් පාලන

[ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා]

කටයුතු කරන්න එතුමා තේරුණා. රජ කාලයේ ඉඳලා මේ පළාත් පාලනය කළේ රටේ මහත්වරු සහ දිසාපතිවරු. හුරුල්ලේ මැතිතුමාගේ පියාත් රටේ මහත්තයෙක් හැටියට කටයුතු කරලා තිබුණා. ඒ ක්‍රමය අහෝසි කළාට පසුව එතුමා තරග විභාගයකට ඉදිරිපත් වෙලා ආදායම් පාලක නිලධාරියෙක් හැටියට කටයුතු කළා. ඒ කාලයේ ආදායම් පාලක නිලධාරි මහත්වරු තමන් සේවය කළ ජනතාවට විශාල ආදරයක් දැක්වූවා. විශාල ළෙන්ගතුකමක් දැක්වූවා. ඒ ළෙන්ගතුකමයි, ආදරයයි නිසා තමයි එතුමාට මැතිවරණයට ඉදිරිපත් වුණු පළමුවෙනි අවස්ථාවේදීම ජයග්‍රහණය කරන්න පුළුවන් වුණේ. එතුමා අවුරුදු 24ක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් හැටියට සහ අමාත්‍යවරයෙක් හැටියට මේ සභාව නියෝජනය කළා. ඒ වාගේම ඉන් පසුව ආණ්ඩුකාරයෙක් හැටියට සහ තානාපතිවරයෙක් හැටියට කටයුතු කළා. මම හිතන්නේ එතුමාගේ මුළු ජීවිත කාලයම රට වෙනුවෙන්, සිංහල ජනතාව වෙනුවෙන්, බෞද්ධ ජනතාව වෙනුවෙන් සහ සියලු ලක්වාසී ජනතාව වෙනුවෙන් කැප කළා. එම නිසා බෞද්ධයන් හැටියට අපි බලාපොරොත්තු වන නිර්වාණ සම්පත්තිය එතුමාට ලැබේවා කියා ප්‍රාර්ථනා කරමින් මාගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

Order, please! Will an Hon. Member propose the Hon. Alhaj A.H.M. Azwer to take the Chair?

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

I propose that the Hon. Alhaj A.H.M. Azwer do now take the Chair?

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා මූලාසනාරූඪ විය.***
*அதன் பிறகு, பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத் தினின்று அகலவே, மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர் அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* MR. DEPUTY SPEAKER *left the Chair, and* THE HON. ALHAJ A.H.M. AZWER *took the Chair.*

[අ. භා. 4.02 ]

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு தினேஷ் குணவர்தன - நீர்வழங்கல், வடிகாலமைப்பு அமைச்சரும் அரசாங்கத் தரப்பின் முதற்கோலாசானும்)
(The Hon. Dinesh Gunawardena - Minister of Water Supply and Drainage and Chief Government Whip)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට අමතක කළ නොහැකි ජනතා සේවකයකු වූ ඊ.එල්.බී. හුරුල්ලේ මැතිතුමාගේ වියෝව පිළිබඳ ශෝක යෝජනාවට අද දිනයේ අප එක් වන්නේ එතුමා ජනතා සේවයට කැප වුණු ආකාරය සිහිපත් කරමිනුයි. පළමු කොට එතුමාගේ බිරිඳ, දියණියන්, පුතණුවන් ඇතුළු පවුලේ සියලු දෙනා සමඟ එතුමාගේ වියෝවේ ශෝකය අප බෙදා ගන්නවා.

වැවයි දා ගැබයි කෙතයි කියන මහා ශිෂ්ටාචාරය ගොඩ නැඟූ දේශයේ, වැවයි දා ගැබයි කෙතයි යන දර්ශනය අවබෝධ කොට ගත් රජරට උපන් ඊ.එල්.බී. හුරුල්ලේ මැතිතුමා අපේ පාර්ලිමේන්තුවටත්, අපේ රාජ්‍ය පාලනයටත්, ජනතාවටත් ඉටු කළ හැකි සේවාව ඉටු කළා. ආරක්ෂා කළ හැකි දේ ආරක්ෂා කළා. අනාගත පරම්පරාව වෙනුවෙන් අපේ උරුමය ආරක්ෂා කරන්න ඔහු දැරූ සෑම තනතුරක්ම ඉවහල් වුණා කියන එක ගෞරවයෙන් සිහිපත් කරන්න ඕනෑ.

1956 වර්ෂය ලංකා දේශපාලනයේ ඓතිහාසික අවස්ථාවක්. 1956 ඇති වූ මහා පෙරළියේදී විරුද්ධ පක්ෂයේ අට දෙනා ඉතුරු වුණු මන්ත්‍රී කණ්ඩායමට එතුමා ජයග්‍රාහීව ආවා. මම 1983 පාර්ලිමේන්තුවට එන විට ඊ.එල්.බී. හුරුල්ලේ මැතිතුමා බොහොම ජ්‍යෙෂ්ඨ දේශපාලනඥයෙක්. එතුමා නිතර දෙවේලේ අප සමඟ තේ පැන් භුක්ති විඳින අතර විශේෂයෙන් රජරට ගැන පැරණි තොරතුරු කථා කළා. වරක් මට කිව්වා, "ඔබ වාගේම මමත් බොහෝ කාලයක් විපක්ෂයේ අට දෙනාගේ කණ්ඩායමේ ඉඳ ගෙන හිටියා. දැන් ඔබත් විපක්ෂයේ අට දෙනාගේ කණ්ඩායමේ ඉඳගෙන ඉන්නවා" කියා. පසු කාලයේ එතුමා දේශපාලනයෙන් විශ්‍රාම ගියාමත් කිව්වා, "එදා මා සඳහන් කළ දේ ඔබට මතක ඇති" කියා. ඕනෑම ප්‍රශ්නයකට මුහුණ දිය හැකි, බොහොම වාම් ගතිගුණවලින් හෙබි එතුමා, පරිපාලනය හා අපේ උරුමය ගැන ගැඹුරු අවබෝධයක් තිබුණු රජරටින් බිහි වූ නායකයෙක් කියන එක යළිත් මා සඳහන් කරන්න ඕනෑ. ජය ශ්‍රී මහා බෝ සමිඳුන්ට ඉටු කළ හැකි උතුම්ම සේවාව සඳහා එතුමාත් එතුමාගේ ඥාති පරම්පරාවත් කැප වුණා. අපේ රටේ සෑම ක්ෂේත්‍රයකටම එතුමා දායක වෙලා තිබෙනවා. බුලන්කුලම පවුල මේ රටේ ගෘහ නිර්මාණ සැලසුම් ක්ෂේත්‍රය අනභිභවනීය ස්ථානයකට පත් කර තිබෙනවා. එය ඉතාමත් ඕනෑකමින් සිහිපත් කරන්න ඕනෑ.

ඒ වාගේම ජය ශ්‍රී මහා බෝ සමිඳුන්ට රන් වැට හදපු කාලය සූරියප්පෙරුම මන්ත්‍රීතුමාට මතක ඇති. එයට මූලික වුණු පුද්ගලයන් කිහිප දෙනා අතුරින් ඊ.එල්.බී. හුරුල්ලේ මැතිඳා ඉදිරියෙන්ම හිටියා. අප කුඩා දරුවෝ හැටියට සිටි කාලයේදී - අපට මතක තිබෙන වයසේදී- රන් වැට බිහි වන මූලික කටයුතු සඳහා ඊ.එල්.බී. හුරුල්ලේ මැතිතුමා මැදිහත් වුණු ආකාරය අපට අදටත් හොඳින් මතකයි. ජය ශ්‍රී මහා බෝ සමිඳුන්ට රන් වැට හැදීමට ආරම්භ කළ ක්‍රියාවලිය අපේ කලාවේ සංස්කෘතියේ හා අපේ වන්දනාවේ කොටසක් බවට පත් වෙලා තිබෙනවා. සංස්කෘතික ත්‍රිකෝණය තුළ ඉටු කළ කාර්ය භාරයන්, අපේ උදාර ඉතිහාසය ලක් මවටද, හැදෙන වැඩෙන නව පරම්පරාවටද ඒ වාගේම ලෝ වැසියන්ටද දැක බලා ගන්නට හැකි ලෙස ආරක්ෂා කර ගැනීමේ සැලසුම් සියල්ලට සංස්කෘතික අමාත්‍යවරයා හැටියට ඊ.එල්.බී. හුරුල්ලේ මැතිතුමා එතුමාගේ ශක්තිය, දායාදය හා දැනුම එකතු කළා.

එය සදාකාලිකයි. මේ අවස්ථාවේ දී විශේෂයෙන්ම කියන්ට ඕනෑ, ඊ.එල්.බී. හුරුල්ලේ මැතිතුමා මේ පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂය පැත්තේ ඉඳ ගෙන හිටපු කාල පරිච්ඡේදය තුළ, විරුද්ධ පක්ෂය පැත්තේ ඉඳ ගෙන හිටපු මන්ත්‍රීවරයකු හැටියට මට මතකයි, එදා මේ සභා ගර්භයේ අපි කරපු කථාවලට එතුමා සවන් දී ගෙන ඉඳලා, අපේ ඒ කථාවලින් පසුව කිහිප වතාවක්ම ආලින්දයේ දී ඒ ගැන අපි සමඟ සාකච්ඡා කළ ආකාරය. බොහොම සරල, නිහතමානී, හැඟීම්බර, පොහොසත් ගුණාංගවලින් පිරුණු පුද්ගලයකු හැටියට එතුමා අප කාටත් දුන් ඒ ආදර්ශයන් අදත් අපි සිහිපත් කරනවා.

කටුනායක ඉදි වූ තනි තට්ටුවේ කුඩා ගුවන් තොටුපොළට ජාත්‍යන්තරව ගමන් කළ පළමුවැනි ජෙට් යානාව ගෙන ඒමේ කීර්තිය එදා හිටපු ඊ.එල්.බී. හුරුල්ලේ ප්‍රවාහන ඇමතිතුමාට හිමි

වනවා. BOAC ගුවන් සේවාවේ VC 10 යානය පළමුවෙන් එම ගුවන් පථයට ඇතුළු වූ අවස්ථාවේ එතුමාත් එතැන සිටියා. ඒ අවස්ථාව අද අපි සිහිපත් කරනවා. අපේ රටේ ජාත්‍යන්තර ගුවන් සේවාවට නව ගමන් මඟක් ඇති කර දීමට බලාපොරොත්තු වූ ඔහුගේ ක්‍රියාදාමය අද බොහෝ දුරක් ඇවිල්ලා, කටුනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළක් බවටත්, ඉතාම දියුණු ගුවන් තොටුපොළක් බවටත් පත්ව තිබෙනවා.

අපට ආශ්‍රය කරන්නට ලැබුණා, ඊ.එල්.බී. හුරුල්ලේ මැතිතුමාගේ ආදරණීය පුත්‍ර තේමිය හුරුල්ලේ මැතිතුමාව. එතුමා පාර්ලිමේන්තුවේ සිටින කාලයේත්, ඒ වාගේම පාර්ලිමේන්තුවෙන් ඉවත්ව එළියේ සිටින කාලයේත් ඉතාම හොඳ ගුණාංගවලින් පිරුණු පුද්ගලයෙක්. ඒ ආදර්ශවත් ගතිගුණ තුළින් අපට මේ අවස්ථාවේ දී ඔහුගේ ඒ ආදරණීය පියාව සිහිපත් වනවා.

අපේ රටට විශාල වැඩ කොටසක් ඉටු කළ, අපේ ජාතික උරුමයට සදාකාලික සිහිවටනයන් එක් කළ, ඊ.එල්.බී හුරුල්ලේ මැතිතුමාගේ වියෝව පිළිබඳ ශෝක යෝජනාවට මේ අවස්ථාවේ දී එක් වෙමින් එතුමාට නිවන් සුව පතනවා.

[අ. භා. 4.10]

**ගරු චන්ද්‍රානි බණ්ඩාර ජයසිංහ මහත්මිය**
(மாண்புமிகு (திருமதி)சந்திராணி பண்டார ஜயசிங்க)
(The Hon. (Mrs.) Chandrani Bandara Jayasinghe)

හිටපු අමාත්‍ය ඊ.එල්.බී. හුරුල්ලේ මැතිතුමා පිළිබඳ ශෝක යෝජනාව මෙම ගරු සභාවට ඉදිරිපත් වී ඇති මොහොතේ එයට එක් වීම මාගේ යුතුකමක් හැටියට මා සලකනවා. විශේෂයෙන්ම මාගේ පියාත් සමඟ දේශපාලනය කළ අමාත්‍යවරයකු හැටියටත්, මා කුඩා කාලයේ සිටම දන්නා හඳුනන පුද්ගලයකු හැටියටත්, එතුමා ගැන වචන ස්වල්පයක් කථා කිරීමට මා බලාපොරොත්තු වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දේශමාන්‍ය එඩ්වින් ලොකු බණ්ඩාර හුරුල්ලේ මැතිතුමා රජරටින් බිහි වූ ශ්‍රේෂ්ඨ නායකයෙක්. අවංක, නොකැලැල් දේශපාලනඥයකු වූ හුරුල්ලේ මැතිතුමා සිය කාලයත්, ධනයත් ජීවිතය පුරා කැප කළේ රජරට ජනතාවගේ යහපත උදෙසායි. වර්තමාන දේශපාලනයේ යෙදෙන බොහෝ දෙනෙකුට ආදර්ශයට ගත හැකි මහඟු දේශපාලන චරිතයක් ලෙස මෙතුමාව අපට හඳුන්වන්නට පුළුවන්. වර්ෂ 1947 දී මෙතුමා එම්.බී. ගලගොඩ, මහනුවර නාථ දේවාලයේ හිටපු බස්නායක නිලමේතුමන්ගේ දියණිය වූ මාලනී ගලගොඩ මැතිනිය සමඟ තෙල්දෙනිය උඩිස්පත්තුවේ දී විවාහ වුණා. අප රටේ එක්සත් ජාතික පක්ෂ රජයන් කිහිපයකම කැබිනට් අමාත්‍ය ධුරයන් ඉසිලූ හුරුල්ලේ මැතිතුමා උතුරුමැද සහ මධ්‍යම පළාත්වල ආණ්ඩුකාරවරයකු ලෙසත්, ඕස්ට්‍රේලියාවේ ශ්‍රී ලංකා තානාපතිවරයා ලෙසත් සේවය කළා.

ඊ.එල්.බී. හුරුල්ලේ මැතිතුමා ඓතිහාසික පරපුරක එක් යුග පුරුෂයකු වුණා. සංඝමිත්තා මෙහෙණින් වහන්සේ ශ්‍රී ලංකාවට ශ්‍රී මහා බෝධීන් වහන්සේ රැගෙන ආ අවස්ථාවේ ගිහි භාරකරු හැටියට පැමිණියේ සුමිත්ත නම් රාජ කුමාරයෙක්. එම රාජකීය පරම්පරාවට ලේ ඥාති සබඳකමක් ද හුරුල්ලේ මහතාට තිබුණා. වර්තමානයේ දී පවා ශ්‍රී මහා බෝධි භාරකාර මණ්ඩලයේ සාමාජිකත්වය උසුලන්නේ ඒ නිසායි.

ඊට අමතරව හුරුලු පළාතේ පිහිටි හුරුලුවැව කතරගම මහ දේවාලයේ භාරකාරත්වයද හුරුල්ලේ මැතිතුමාගේ පරපුරට අයත් වෙනවා. එතුමා හුරුලු දේවාල භූමිය පූජා බිමක් බවට පත් කොට අද පවතින දියුණු තත්ත්වයට සංවර්ධනය කළා.

එක්දහස් නවසිය පනස් ගණන්වලදී සිවිල් සේවයට බැඳුණු හුරුල්ලේ මැතිතුමා හුරුලු පළාතේ ආදායම් පාලන නිලධාරි වශයෙන් 1956 තෙක් විශිෂ්ට සේවාවක් සිදු කළා.

එතුමා වඩාත් ජනප්‍රිය වූයේ කෘෂිකර්මය නඟා සිටුවීමට ක්‍රියා කිරීම නිසායි. ප්‍රථම වරට ජපන් ක්‍රමයට ගොයම් පැළ සිටුවීමේ ක්‍රමය ගොවි ජනතාවට හඳුන්වා දුන්නේ හුරුල්ලේ මැතිතුමායි. ඒ නිසා එදා පැවති වගා තරගයෙන් හුරුල්ලේ මැතිතුමා රන් පදක්කමක්ද දිනා ගත්තා. හුරුල්ලේ මැතිතුමා ජනතාව අතර කොතරම් ජනප්‍රිය වූවාද කියතොත් 1956 දී ගරු ටී.බී.පෝලියැද්ද දිසාව හිටපු මන්ත්‍රීතුමාගේ හදිසි අභාවය හේතුවෙන් එවකට අග්‍රාමාත්‍ය වූ සර් ජෝන් කොතලාවල මැතිතුමා, ජනතාවගෙන් ඉදිරිපත් වූ බලවත් ඉල්ලීම මුල් කර ගෙන මහ මැතිවරණයේදී එක්සත් ජාතික පක්ෂයෙන් හොරොව්පතාන ආසනයට තරඟ කරන ලෙසට එතුමාට ආරාධනා කළා. එම ඉල්ලීමට ගරු කළ හුරුල්ලේ මැතිතුමා තමා එතෙක් දැරූ සිවිල් සේවා තනතුරට සමු දී දේශපාලනයට පිවිස 1956 පැවති මහ මැතිවරණයට ඉදිරිපත් වී හොරොව්පතාන ආසනය ජය ගෙන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ලෙස තේරී පත් වුණා. 1956 පැවති මහ මැතිවරණයෙන් එක්සත් ජාතික පක්ෂය ආසන අටකට සීමා වුවත් එම ආසන අට අතරට රජරටින් හිමි වූ එකම මන්ත්‍රී අසුන වූයේ හුරුල්ලේ මැතිතුමා ජය ගත් හොරොව්පතාන ආසනයයි.

හුරුල්ලේ මැතිතුමා කෘෂිකර්මාන්තයට බෙහෙවින් ප්‍රිය කළා. ඒ නිසා විවේක ලද සෑම විටකම මොරකැව නිවසට පැමිණියා. එතුමා මොරකැව නිවසට පැමිණි සෑම විටකදීම දවසේ වැඩි කාලයක් ගත කළේ සිය ගොවි පොළේයි. එතුමා ජනතාව හමු වී ප්‍රශ්න විසඳුවේද ගොවි පොළේ සිටයි. එපමණක් නොව පාරම්පරිකව තම පරපුරට හිමිව තිබූ ගම් බිම් රැසක්ම දුප්පත් අහිංසක හොරොව්පතාන ජනතාවට පරිත්‍යාග කළා.

වාරිමාර්ග දියුණුවට ක්‍රියා කළ එතුමා ලොකු කුඩා වැව්, ඇළ මාර්ග රාශියක්ම ප්‍රතිසංස්කරණය කළ අතර ඉලුක්වැවදී යාන් ඔය හරස් කොට මහපොතාන, හොරොව්පතාන ප්‍රදේශවල ජල හිඟය විසඳීමටද ක්‍රියා කළා. ඒ අතර පළාතේ නගර, ගම් දියුණු කිරීමට යටිතල පහසුකම් ඇති කළා. එමෙන්ම බොහෝ දෙනෙකුට පක්ෂ භේදයකින් තොරව රජයේ රැකීරක්ෂා රාශියක්ම ලබා දුන්නා.

1965 දී ඩඩ්ලි සේනානායක අග්‍රාමාත්‍යතුමාගේ රජයේ ප්‍රවාහන ඇමති ධුරය ඉසිලූ හුරුල්ලේ මැතිතුමා රජරට ජනතාවගේ ගමනා ගමන පහසුකම් නැංවීමට දුම්රිය සහ බස් ඒකාබද්ධ සේවයක් අනුරාධපුරයේදී ඇරඹුවා. ඒ අනුව අනුරාධපුර සිට කොළඹ කොටුව දක්වා "රජරට රැජින" නමින් ශීඝ්‍රගාමී දුම්රියක් ආරම්භ කළ අතර අද දක්වාම එම දුම්රිය ධාවනය වනවා.

1977 දී බලයට පත් ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමාගේ රජයේ සංස්කෘතික අමාත්‍යවරයා වූයේද හුරුල්ලේ මැතිතුමායි. අනුරාධපුරය හෙළ සංස්කෘතියේ කේන්ද්‍රස්ථානයයි. ඒ නිසාම එම ජාතික උරුමයන් රැක ගැනීමට ක්‍රියා කළ සංස්කෘතික අමාත්‍ය හුරුල්ලේ මැතිතුමා අනුරාධපුර, පොළොන්නරුව, සීගිරිය, දඹුල්ල සහ මහනුවර යන ඓතිහාසික නගර ඒකාබද්ධ කොට සංස්කෘතික ත්‍රිකෝණය ආරම්භ කළා. එසේම ඊට සම්බන්ධව යුනෙස්කෝ ආයතනයේ ආධාර සහිතව මධ්‍යම සංස්කෘතික අරමුදල ද පිහිටුවූවා.

විශේෂයෙන්ම අනුරාධපුර පුරාවිද්‍යා පුනරුදය බිහි කිරීමේ පුරෝගාමියා වූයේද හුරුල්ලේ මැතිතුමායි. ජේතවන දා ගැබ, අභයගිරි දා ගැබ, මිරිසවැටි දා ගැබ සංරක්ෂණය හුරුල්ලේ මැතිතුමා ආරම්භ කළ ශ්‍රේෂ්ඨ ව්‍යාපෘතියක්. එසේ වුවත් එසේ සංරක්ෂණය කරන ලද ජාතික වස්තූන් පිළිබඳව පැවැත්වෙන ඕනෑම උත්සවයකදී වර්තමාන පාලකයන් හුරුල්ලේ මැතිතුමාගේ ජාතික මෙහෙවර අගය නොකිරීම බලවත් සේ අපගේ සිත් කනගාටුවට පත් කරනවා. ජේතවන දා ගැබ ප්‍රතිසංස්කරණය

[ගරු චන්ද්‍රානි බණ්ඩාර ජයසිංහ මහත්මිය]

අවසන් කොට විවෘත කිරීමේදී හුරුල්ලේ මැතිතුමා කළ උදාර සේවය කිසිවෙකුත් ප්‍රකාශ කරනු ලැබුවේ නැහැ.

1956 සිට අනුරාධපුර දිස්ත්‍රික්කයේ එක්සත් ජාතික පක්ෂයේ නායකයකු ලෙස ක්‍රියා කළ හුරුල්ලේ මැතිතුමා තම පක්ෂයේ අය අතර පවා ඇති වන ගැටුම් සහ ප්‍රශ්නවලදී මැදිහත් වී, සිතාමතා, එම ප්‍රශ්න සාධාරණව විසඳා දීමට සමත් වුණා.

එසේම එතුමා රජරට දේශපාලනයේ පතාක යෝධයන් වූ මාගේ පියාණන් වූ චන්ද්‍රා බණ්ඩාර මැතිතුමා සමඟ සහ ඒ.එම්.එස්. අධිකාරී, ජී.ඩී. මහින්දසෝම, ඩී.එම්.ආරියදාස, වැනි ඇමතිවරුන් සමඟ නිවැරදිව, දේශපාලන නායකත්වය දෙමින් එක්සත් ජාතික පක්ෂය ජයග්‍රාහී මාවතකට ගෙන ඒමට ක්‍රියා කළ අන්දම අදත් එක්සත් ජාතික පාක්ෂිකයන් සිහි කරන්නේ ඉමහත් ගෞරවයෙනි.

ඊ.එල්.බී. හුරුල්ලේ මහතාගේ තිබූ විශේෂ ලක්ෂණයක් නම් තම දේශපාලන ප්‍රතිවාදීන්ට පහර දීම, හෙළා දැකීම, පළිගැනීම වැනි අකටයුතුකම් කිසිවක් නොකිරීමයි; තම ප්‍රතිවාදීන්ට පවා කළ යුතු උපකාර ඇත්නම් ඒ සියල්ල නොපිරිහෙළා ඉටු කිරීමයි.

හුරුල්ලේ මැතිතුමා තුළ පක්ෂ, ආගම්, ජාති, කුල භේදයක් නොවීය. සියල්ලන්ටම සමානව සැලකීම එතුමාගේ චරිතයේ කැපී පෙනුණ ලක්ෂණයක් විය. මේ නිසා හුරුල්ලේ මැතිතුමාට දේශපාලන ප්‍රතිවාදීන්ගෙන් දෝෂාරෝපණ එල්ල නොවූ අතර, ලැබුණේ ප්‍රශංසාත්මක ගෞරවයකි.

රජ රටින් බිහි වූ මේ ශ්‍රේෂ්ඨ නායකතුමන් නාමය පමණක් අපට ඉතිරි කර 2009 අප්‍රේල් 06 දින සදහටම අප අතරින් සමු ගත්තේය. අවසාන වශයෙන්, එතුමාට ආදරය කළ රජරට ජනතාවගේත්, පෞද්ගලිකව මාගේත් ශෝකය එතුමාගේ ආදරණීය භාර්යාව වන මාලනී හුරුල්ලේ මැතිනියටත්, දූ දරුවන්ටත්, පවුලේ සියලුම ඥාතීන්ටත් දැනුම් දෙන ලෙස ඔබතුමාගෙන් ඉල්ලා සිටිමින් ගරු ඊ.එල්.බී. හුරුල්ලේ හිටපු අමාත්‍යතුමන්ට අජරාමර නිවන් සුව ප්‍රාර්ථනා කරමි. ස්තුතියි.

[අ. භා. 4.20]

**ගරු ගාමිණී ලොකුගේ මහතා (කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு காமினி லொக்குகே - தொழில், தொழில் உறவுகள் அமைச்சர்)
(The Hon. Gamini Lokuge - Minister of Labour and Labour Relations)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ මොහොත, පාර්ලිමේන්තුව නියෝජනය කරපු, මේ රට වෙනුවෙන් විශාල සේවාවක් කරපු ප්‍රතාපවත් ඇමතිවරයකුගේ ගුණ සමරන මොහොත. අපි එතුමා දැන හැඳින ගත්තේ 1983 දී. 1983 දී මා පාර්ලිමේන්තුවට තේරී පත් වෙලා එන කොට හුරුල්ලේ මැතිතුමා ජ්‍යෙෂ්ඨ ඇමතිවරයකු හැටියට මේ ගරු සභාවේ කටයුතු කළා. 1956 සිට එතුමා මේ පාර්ලිමේන්තුව නියෝජනය කළා පමණක් නොවෙයි, එතුමා දරපු හැම තනතුරකින්ම රටට විශිෂ්ට සේවාවක් කළා. ප්‍රවාහන ඇමතිවරයා හැටියට එතුමා මේ රට වෙනුවෙන්, ගමනාගමනය වෙනුවෙන්, ගුවන් සේවය වෙනුවෙන් විශිෂ්ට සේවාවක් කළා. ඒ සේවාව කරනකොට එතුමා සාමාන්‍ය ජනතාව ගැන ඉතාම ගැඹුරින්, ලෙන්ගතුව කල්පනා කළා. මට මතකයි, එදා අපි පාසල් යන යුගයේදී මේ රටේ ටැක්සි ව්‍යාපාරිකයන් ඉතාම අසරණ තත්ත්වයට පත් වෙලා සිටි බව. ඒ ටැක්සි ව්‍යාපාරයේ යෙදී සිටි අයට රේගු බද්දෙන් තොරව වාහන ගෙන්වලා දුන්න රටේ හිටපු එකම ප්‍රවාහන ඇමතිවරයා එතුමා තමයි. එදා මේ රටේ හැම පළාතකම හිටපු, පරණ වාහන තිබුණු ටැක්සි හිමියන්ට රේගු බද්දෙන් තොරව වාහන ලබා දුන්නා. එතුමා ඒ තුළින් ටැක්සි සේවයට පුනර්ජීවයක් ලබා දුන්නා. එතුමා තමන් වැඩ කරපු හැම අමාත්‍යාංශයකම හැම අංශයක් කෙරෙහිම ගැඹුරින් බලලා අවශ්‍ය කටයුතු කර තිබෙනවා. එදා එයාර් සිලෝන් සමාගම හා ප්‍රංශයේ යූටීඒ සමාගමත් එක්ක ඒකාබද්ධ ගිවිසුමක් ඇති කරලා එයාර් සිලෝන් ආයතනය ජාත්‍යන්තරයට ගෙන ගියා. ඒ වාගේම රේල්වේ දෙපාර්තමේන්තුවට නවෝදයක් ඇති කළා. මේ විධියට හැම අංශයකින්ම රට වෙනුවෙන්, සාමාන්‍ය ජනතාව වෙනුවෙන් දයාවක්, කරුණාවක් ඇතිව කටයුතු කළ නායකයෙක්.

ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමාගේ ආණ්ඩුවේ සංස්කෘතික ඇමතිතුමා හැටියට එතුමා සංස්කෘතික ත්‍රිකෝණය හැදුවා විතරක් නොවෙයි, ඒ සංස්කෘතික ත්‍රිකෝණය සංචාරක ව්‍යාපාරයට රුකුලක් දෙන ආයතනයක් බවට පරිවර්තනය කළා. ඒකට අලුත් අරමුදලක් නිර්මාණය කළා. සංස්කෘතික ත්‍රිකෝණයේ පැවැත්මට අදත් ඒ අරමුදල පවත්වා ගෙන යනවා.

ඒ වාගේම එතුමා ආදායම් පාලක නිලධාරිවරයකු හැටියට, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හැටියට, ඇමතිවරයකු හැටියට, ආණ්ඩුකාරවරයකු හැටියට, තානාපතිවරයකු හැටියට මේ රටට විශිෂ්ට සේවාවක් කළා.

අද මේ සභාවේ සියලුම මන්ත්‍රීවරුන් කියපු කථා මමත් අනුමත කරන අතර, එතුමා මේ පාර්ලිමේන්තුවේ නම නොමැකෙන රජ රට නායකයකු හැටියට ක්‍රියා කළා. එතුමාගේ කටයුතු අපි අගය කරනවා. එදා අපි එතුමාත් එක්ක ළඟින් ආශ්‍රය කළා. එතුමා මේ පාර්ලිමේන්තුවෙන් විශ්‍රාම ගියාට පසුවත් නිතරම අපිත් එක්ක දුරකථනයෙන් කථා කළා. ඒ වාගේම එතුමාට පුත්‍ර රත්නයක් හිටියා, තේමිය හුරුල්ලේ කියලා. පියාගෙන් පස්සේ එතුමාත් මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා අපිත් එක්ක සම්බන්ධ වෙලා මිත්‍රශීලීව ඉතාම හොඳින් කටයුතු කළා පමණක් නොවෙයි, පියාගේ ගෞරවය ආරක්ෂා කරමින් ක්‍රියා කළා. හුරුල්ලේ මැතිතුමා කවදාවත් කලබල වෙච්ච දේශපාලනඥයෙක් නොවෙයි. ඒ වාගේම තමයි තේමිය හුරුල්ලේ මැතිතුමාත්. ඒ නිසා අද අපි මේ පාර්ලිමේන්තුවේ ශෝකය ප්‍රකාශ කරන මොහොතේ අපිත් එක්ක හිටපු ප්‍රතාපවත් මන්ත්‍රීවරයකුට, ඇමතිවරයකුට අපේ ගෞරවයත්, ස්තුතියත් පුද කරන්න අපට යුතුකමක් තිබෙනවා. හුරුල්ලේ මැතිනියටත්, ඒ වාගේම තේමිය හුරුල්ලේ මැතිතුමා ඇතුළු ඒ පවුලේ දරුවන් සියලු දෙනාටමත් අපේ ගෞරවයත් ස්තුතියත් පුද කරන අතර, අප අතරින් වියෝ වූ ඊ.එල්.බී හුරුල්ලේ මැතිතුමාට නිවන් සුව ලැබේවායි කියා ප්‍රාර්ථනා කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම ටිරෝන් ප්‍රනාන්දු මැතිතුමා පිළිබඳ ගුණ කථනය කරන අවස්ථාවේ මම මිනිත්තුවක් පරක්කු වුණා. ඒ නිසා එතුමා පිළිබඳව වචන කිහිපයක් කථා කරන්නත් මම අවසර ඉල්ලා සිටිනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
හොඳයි.

**ගරු ගාමිණී ලොකුගේ මහතා**
(மாண்புமிகு காமினி லொக்குகே)
(The Hon. Gamini Lokuge)

ටිරෝන් ප්‍රනාන්දු මැතිතුමා 1977 දී මොරටුව ආසනයේ එක්සත් ජාතික පක්ෂයේ සංවිධායක වශයෙන් පත් වෙලා මොරටුව ආසනයට තරග කළා. මට මතකයි, එතුමා එදා ඡන්ද දහහතරදහස් ගණනකින් මොරටුව මන්ත්‍රීවරයා හැටියට පත් වුණා. එතුමා නියෝජ්‍ය ඇමතිවරයකු හැටියට, ඇමතිවරයකු හැටියට මේ පාර්ලිමේන්තුව තුළ දේශපාලන කටයුතු කළා

පමණක් නොවෙයි, මොරටු පළාත වෙනුවෙන් විශිෂ්ට සේවාවක් කළා. කල්‍යාණ මිත්‍රයෙක්, හිතවතෙක් හැටියට එතුමා අපිත් එක්ක කටයුතු කළා. මම දීර්ඝ කථාවක් කරන්නේ නැහැ. එතුමාගේ ආසනයට අල්ලපු ආසනයේ එතුමාත් එක්ක කටයුතු කළ මන්ත්‍රීවරයා හැටියට ටිරෝන් ප්‍රනාන්දු මැතිතුමාගේ අභාවය පිළිබඳව අපේ ගෞරවණීය කනගාටුවත්, ශෝකයත් පුද කරන අතර, එතුමාට නිවන් සුව ලැබේවායි කියා ප්‍රාර්ථනා කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[අ. භා. 4.25]

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ මේ ශ්‍රේෂ්ඨ උත්තමයා - ඊ.එල්.බී. හුරුල්ලේ මැතිතුමා- ගැන කඩදාසියක ලියලා කියන්න ඕනෑ නැහැ. ඊ.එල්.බී. හුරුල්ලේ කියන නම කියද්දී මම නම් මේ ගරු සභාවේ ප්‍රාර්ථනා කරන්නේ එවැනි උත්තමයෝ තව බිහි වේවා කියායි. මෙවැනි උත්තමයෝ තමයි වර්තමානයට අවශ්‍ය වෙලා තිබෙන්නේ. මා දේශපාලනයට බසිද්දී මේ රටට, දේශයට සේවය කළ හුරුල්ලේ මැතිතුමා තුළින් මා දැක්කේ දේශපාලනයේ නිහතමානිත්වය සහ ගාම්භීරත්වයයි. එය අහංකාර ගාම්භීරත්වයක් නොවෙයි. එතුමා දේශපාලනයේ නිහතමානී පුද්ගලයෙක්. එතුමා කැඩපතක මහා මූර්තියක් විධියට දේශපාලනයේ හරි කෙළින් කටයුතු කළ කෙනෙක්. ඒ කෙළින් කටයුතු කිරීම මම දැක්කේ, තමා සිතන දේ කියන, කියන දේ කරන, බැරි දේ බැහැ කියන, අවංකත්වයට මුල් තැන දුන් මහා ශ්‍රේෂ්ඨ දේශ සේවකයෙක් නිසායි. හුරුල්ලේ මැතිතුමා කටයුතු කළ විවිධ ක්ෂේත්‍ර ගැන, එතුමාට තිබුණු තනතුරු ගැන මීට ප්‍රථම කළ කථාවලින් ප්‍රකාශ වුණා. ඒ ගැන මා කථා කරන්නේ නැහැ. ඒ උත්තමයා හැම වෙලාවේම මම දැක්කේ දේශපාලනයේ ශාන්තුවරයකු විධියටයි. මම ප්‍රාර්ථනා කරනවා, මහත්මා ගාන්ධි වැනි ප්‍රතිපත්ති තිබිච්ච, මහත්මා ගති ගුණ තිබිච්ච ඒ මහා උත්තමයා වාගේ අය අනාගතයේදීත් මේ පාර්ලිමේන්තුවේ බිහි වෙන්න කියලා.

එතුමා නිහතමානීව නිවැරදි සේවයක් කළා. එතුමා හිටපු කාලය තුළ හෝ එතුමා පරාජය වෙලා හෝ විශ්‍රාම ගියා කියලා හෝ එතුමා අද ජීවතුන් අතර නැහැ කියලා හෝ ඊ.එල්.බී. හුරුල්ලේ කියන මේ ශ්‍රේෂ්ඨ උත්තමයා ගැන හොඳ මිසක් කාටවත් ඇඟිල්ලක් දික් කරලා නරකක් කියන්න පුළුවන්කමක් නැහැ. ඒ නම බැබළෙනවා. ඒ නම බැබළෙන්නේ එතුමා කළ සේවාවන් නිසායි. ඇමතිකම්, පටටම් කියන ඒවා තාවකාලිකයි. ඒවා කුණු බක්කියට වැටෙනවා. කුණු බක්කියට වැටෙන්නේ නැතුව ශුද්ධ වෙලා බේරෙන්නේ කරපු හොඳ ටිකයි. ලෝක නීති ධර්මය ඒකයි. ඒ ලෝක නීති ධර්මයට අනුව කටයුතු කළ එතුමාගේ ඒ පින්වන්ත මුහුණ දේශපාලන කැඩපත තුළින් මා දැක්කා. එතුමා රජ රටින් බිහි වෙලා, විදේශීය ආධිපත්‍යයට යටත්ව තිබුණු යුගයේ ආගමික වශයෙන් පිරිහී තිබුණු රජ රට නැවතත් බබළවමින් සම්බුද්ධ ශාසනයට විශාල සේවයක් කළා. ඒකයි මා එතුමාට හුහක් ගරු කරන්නේ. එතුමා කළ සේවය නිසා අපගේ ධර්මය අනුව එතුමා උසස් තැනක ඉන්නවා ඇති.

සමහර විට අනාගතයේදී මේ සභාවේ "දේශපාලනය" කියන වචනය තිත්ත වනවා. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා දෙස සමහරු වපර ඇසින් බලනවා. නමුත් ඊ.එල්.බී. හුරුල්ලේ නමැති ඒ උත්තම කැඩපත ආදර්ශයක් විධියට ගෙන පාර්ලිමේන්තුවේ ගරුත්වයත්, ගාම්භීරත්වයත් ආරක්ෂා වන පරිදි ඉදිරියේදී කටයුතු කිරීමට හැකි වේවා කියලා මා ප්‍රාර්ථනා කරනවා. නිහතමානී එතුමාට මා මගේ හදවතින්ම අමා මහ නිවන් සුව පතනවා.

ඊ.එල්.බී. හුරුල්ලේ මැතිතුමාගේ ආදරණීය බිරිඳ ඉතා නිහතමානී කෙනෙක්. ඒ දෙදෙනා ඉඳි කටුවයි, නූලයි වාගේයි මා දැක්කේ. ඒ දෙදෙනාගේ ඉතා හොඳ බැඳීමක් තිබුණා. ඒ තුළ තේමිය ඇතුළු දූ දරුවන් ඒ විධියටම හැදුණා. තේමිය හුරුල්ලේ මැතිතුමා මේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයකු වශයෙන් සිටියා. ඉතා නිහතමානී එතුමාගේ දේශපාලන ගමන වර්තමානයේ පවතින දේශපාලනයට සුදුසු නැති බව එතුමාට පෙනුණා. එම නිසා එතුමා දේශපාලනයෙන් ඈත් වුණා. ඒක ඇත්තක්. ඒක අසත්‍යයක් නොවෙයි. තේමිය හුරුල්ලේ මැතිතුමා ඇතුළු දූ දරුවන් සැම දෙනාටම අපගේ ශෝකය පළ කරනවා. ඒ දූ දරුවන්ට ආඩම්බර විය හැකි පියෙකුටයි අද අපි මේ ගරු සභාවේ උපහාර දක්වන්නේ. ඒ අනුව ඊ.එල්.බී. හුරුල්ලේ මැතිතුමාට අමා මහ නිවන් සුව අත් වේවායි මා ප්‍රාර්ථනා කරනවා.

[අ. භා. 4.30]

**ගරු ජේ.ආර්.පී. සූරියප්පෙරුම මහතා**
(மாண்புமிகு ஜே. ஆர். பீ. சூரியப்பெரும)
(The Hon. J.R.P. Sooriyapperuma)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මා කථා කරන්නේ වනගතව තිබුණු, වන ප්‍රවාහයේ ගිලී තිබුණු රජ රට ආපසු නව ශිෂ්ටාචාරයට ඇතුළු කරපු මහා උත්තම පුරුෂයකු පිළිබඳවයි. එතුමා ඉතිහාසයේ පහළ වන්නට පෙර සර්ව ජන ඡන්දය ඇති වුණු 1931 වර්ෂයේදී අනුරාධපුරය මන්ත්‍රීවරයා වශයෙන් නිතරගයෙන් පත් වුණේ "ෆ්‍රීමන්" කියන සුදු ජාතික ඒජන්ත මහත්මයායි. ඒ ඒජන්ත මහත්මයා අපේ ඓතිහාසික අනුරාධපුරයේ මන්ත්‍රීතුමා හැටියට දීර්ඝ කාලයක් මේ ගරු සභාවේ වාඩි වෙලා සිටියා. එතුමා යහපත්, සත් ගුණවත් පුරුෂයෙක්. එතුමා මිය ගියේ ලංකාවේ. "මා මිය ගියාම මගේ ආදාහනයෙන් පස්සේ මගේ අළු රජ රට කුඹුරකට විසි කර දමන්න; විසුරුවා දමන්න" කියා ඉල්ලීමක් කරලා තමයි එතුමා ඇස් දෙක පියා ගත්තේ. නමුත් හොඳින් වුවත් සුදු මහත්මයෙක් රජ රට ආණ්ඩු කරනවාට වඩා අපේම කෙනෙක්, අපේ ගමේ කෙනෙක්, අපේ ජාතියේ කෙනෙක් රජ රට ආණ්ඩු කිරීම තමයි රජ රට ජනතාවගේ හදවතේ තිබුණු සිහිනය. සුදු මහත්මයා හොඳට ඒ කටයුතු කරයි. නමුත් එතුමා අපේ කෙනෙක් නොවෙයි. රජ රට කියන්නේ අපේ ඔටුන්නයි. ඒ ප්‍රදේශයට රජ රට හැර තව නමක් තිබෙනවා. ඒ තමයි "පිහිටි රට". "පිහිටි රට" කියන්නේ ජය ශ්‍රී මහා බෝධිය පිහිටපු රට. මේ රටේ අනන්‍යතාව හා ආඩම්බරය ජය ශ්‍රී මහා බෝධිය පිහිටු වීමයි. අවුරුදු 2,200කට පමණ පෙර ඒ ජය ශ්‍රී මහා බෝධිය පිහිටු වන කොට, ලංකාවට මේ බෝධීන් වහන්සේ වැඩම කරපු අවස්ථාවේදී ඒ හා සමඟම පැමිණි ප්‍රභූ රදල රජ දරුවන් පිරිසක් සිටියා, බෝධීන් වහන්සේට සාත්තු සප්පායම් කිරීම සඳහා. ඒ පැවත ආපු මේ රටේ දීර්ඝ ඉතිහාසයක් ඇති ප්‍රභූ පන්තිය තමයි අනුරාධපුරයේ ජය ශ්‍රී මහා බෝධියට සේවය කරන්නේ. මේ පරම්පරාවේ ඉතිහාසය ගැන මම බොහොම දීර්ඝව හෙව්වා.

මහාචාර්ය විමලානන්ද තෙන්නකෝන් මහත්මයාගේ ඉතිහාසය ගැන පවුලෙන් පවුලට තොරතුරු ඇහුවා. දැනට ඉතුරු වෙලා ඉන්නේ කවුද කියලා මම හෙව්වා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඉතාම ගෞරවයෙන් ප්‍රකාශ කළ යුතුයි තේ, රබර් හා පොල් වතු නොතිබුණාට ගොවිතැන් බත් කරමින්, රජරට ගොවීන් ආරක්ෂා කරමින්, ඒ ගොවීන්ට පියවරු හැටියට සේවය කරපු පරම්පරා හත, අටක් තවම ඉන්නවා අනුරාධපුරය වටේ කියලා. මේ පවුල් පරම්පරා ගණනාවකින් එකිනෙකට සම්බන්ධයි. ඉන් එක පවුලක් තමයි අපි අද කථා කරන හිටපු අමාත්‍ය, හිටපු මන්ත්‍රී ඊ.එල්.බී. හුරුල්ලේ මැතිතුමා.

ඇත්ත වශයෙන්ම මෙතුමා ප්‍රාදේශික රජෙකුගේ තිබිය යුතු ගුණ ධර්ම ඇඟේ පිහිටලා තිබුණු උත්තමයෙක්. ඉතාම තැන්පත් පුද්ගලයෙක්. ඉතාම සන්සුන් පුද්ගලයෙක්. ඇවිදින කොට පවා මහත්මා ගති ප්‍රදර්ශනය වෙමින් ගැමියන්ගේ, මහ ජනතාවගේ ගෞරවය පිරිනැමෙන තත්ත්වයේ උතුම් පුද්ගලයෙක්. රජරට

[ගරු ජේ.ආර්.පී. සූරියප්පෙරුම මහතා]

සිරිත් හා විරිත් ලංකාවට උරුම කරන්න ඉතිරිව හිටපු විශිෂ්ට ගණයේ මහත්මයෙක් තමයි හුරුල්ලේ මැතිතුමා. මෙතුමා ගැන හුඟක් කථා කියැවිලා තිබෙනවා. නමුත් මෙතුමා කරපු ලොකුම රාජකාරිය තමයි, මහා වනාන්තරයේ හැංගිලා, අතැනින් මෙතැනින් විතරක් ඉතුරු වෙලා තිබුණු ගම්මාන ටිකක් ඉදිරියට ගෙන ඒමට උදව් කිරීම. ගරු ඩී.එස්. සේනානායක මහත්තයා ගොවි ජනපද ගොඩ නඟලා, නවීකරණය කරන වෙලාවේදී ඒ සඳහා මිනිස්සු ඕනෑ වුණා.

1947 ලංකාවට නිදහස ලැබුණාම මේ රටේ හිටපු සුදු සිවිල් නිලධාරින් ලංකාව අත් හැරලා ගියා. කච්චේරි පවා පාලනය කරන්න මිනිස්සු නැති වුණා. ගරු ඩී.එස්. සේනානායක මැතිතුමා ලංකාවේ පාසල්වලින් ඉල්ලීමක් කළා, "මට අවුරුදු දෙකකදී නිලධාරින් පිරිසක් හදලා දෙන්න. මට දොස්තරලා ඕනෑ; ඉන්ජිනේරුවෝ ඕනෑ; සිවිල් සේවකයෝ ඕනෑ; යුද්ධ හමුදාවක් ඕනෑ" කියලා. අන්න ඒ ඉල්ලීමට පිළිතුරු වශයෙන් ලංකාවේ ගම්බද සමාජයේ හිටපු ප්‍රභූ පවුල්වල උතුම්, වැදගත් හා දක්ෂ තරුණයන් ඉදිරිපත් වුණා. ඒ පත් වුණු උගත්, තරග විභාගයකින් ඉහළ ලකුණු ලබා ගත්තු මහත්මයෙක් තමයි අපේ එඩ්වින් හුරුල්ලේ මැතිතුමා. ඒ මහත්මයා DRO විභාගයෙන් -DRO කියන්නේ ඉස්සර රටේ මහත්තයාගේ තනතුර. ඒ විභාගයෙන්- සමත් වෙලා රජරටට නවෝදයක් ඇති කරපු පළමුවැනි පුරෝගාමී පුරුෂයන් අතර ප්‍රධානියා වුණා. ඉතාම ආදර්ශවත් සිවුරක් දැමූ කෙනකු සොයනවාට වඩා උතුම් පුද්ගලයෙක් තමයි අද අපි සිහිපත් කරන මෙතුමා. මම ඉතාම ගෞරව කරන, තැන්පත් පුද්ගලයෙක්. එතුමා ගැන කථා කරනකොට දඟකාර ලෙස කථා කරන්නත් හිතෙන්නේ නැහැ. ඒ තරම් නිවීහැනහිල්ලේ සිටින අති උතුම් පුද්ගලයෙක්. මේ අය ඒ උතුම් ගතිගුණ ලබා ගත්තේ අවුරුදු දහස් ගණනක් ජය ශ්‍රී මහා බෝධියට ඇප කැප වුණු ඒ සම්ප්‍රදායෙන්. ඒ සම්ප්‍රදායෙන් උරුම වුණු ලේ තවමත් අනුරාධපුරය වටේ ඉන්න මේ ප්‍රධාන පවුල්වල නහරවල දුවනවාය කියන එක මගේ විශ්වාසයයි. මම ඉතිහාස පොත් අනුව ඒක සිතා ගෙන තිබෙනවා.

එදා මෙතුමා කරපු සේවය තමයි වනයේ ගිලිලා තිබුණු රජරට නවීන රටක් කරන්න උදව් වීම. ගරු ඩී.එස්. සේනානායක මහත්තයා ජනපද පිහිටුවුවා. ජනපද පිහිටුවලා සර් ජෝන් කොතලාවල මහත්තයා දෙසට හැරිලා කිව්වා, "මම පිහිටු වන ජනපදවලට ඔයා පාරවල් හදන්න" කියලා. අන්න ඒ ඉතුරු වුණු කොටස තමයි මේ අද අපි සිහිපත් කරන හුරුල්ලේ මහත්තයා කළේ.

ඒ මහත්මයාගේ චරිතය මේ සභාව අලංකාර කරපු චරිතයක්. අපේ පරම්පරාවලට දකින්න නොලැබෙන වැදගත් චරිතයක්. ඒ කාලයේ වැදගත් DRO මහත්වරු තුන්හතරදෙනෙක් හිටියා, උඩ රට පළාත්වල අලුත් ප්‍රබෝධයක් ඇති කරපු. ඇම්.ඩී. බණ්ඩා මහත්මයා එක්කෙනෙක්. වෙලගෙදර මහත්මයා තව කෙනෙක්. විමලරත්න කුමාරගම මහත්මයා තවත් කෙනෙක්. අනෙක් කෙනා තමයි එඩ්වින් හුරුල්ලේ මහත්මයා. මේ හතරදෙනාම ඒ ප්‍රදේශයට පෞරුෂත්වයක්, නව ජීවනයක්, බලාපොරොත්තුවක් දුන්නු පින්වත් පුද්ගලයෝ. අද ඒ අය අපට නැහැ. මම ඒ ගැන හරියට ශෝක වෙනවා. අද අපි එතුමන්ලා සිහිපත් කරනවා.

අනෙක් මහත්වරු කථා කරමින් ගරු හුරුල්ලේ මැතිතුමා ඉතාම මෑතකදී ඇමතිවරයකු වශයෙන් කරපු විශාල රාජකාරි රාශියක් ගැන කිව්වා. ඒවා ඇත්ත.

බලන්න, එදා DRO මහත්මයාට දුන්නු අධ්‍යාපනය ගැන, එතුමා ලබපු පරිපාලන කෘත හස්තභාවය ගැන. ගිය ඕනෑම තැනක ඕනෑම අංශයක -එක්කෝ දුම්රිය, එක්කෝ මහා මාර්ග, එක්කෝ සංස්කෘතිය ආදි ඕනෑම අංශයක- ඕනෑම දෙයක් ඇමතිවරයකු හැටියට හෝ නිලධාරියකු හැටියට හෝ කරන්න පුළුවන් උත්තමයකු තමයි එදා ඒ අධ්‍යාපනය මඟින් බිහි වෙලා ආවේ. ඒ වාගේ අය තමයි එදා මේ රාජකාරිවලට බඳවා ගත්තේ. අද අපි ගරු හුරුල්ලේ මැතිතුමාට ගරු කළ යුතුයි. මා එතුමා ආශ්‍රය කරන්න පටන් ගත්තේ 1970 දී. එදා ඉඳලා මගේ ලොකුම ගෞරවයක් තිබුණා එතුමාට. එතුමා තුළ බොහොම තැන්පත්භාවයක් තිබුණා. මේ ශෝක ප්‍රකාශයෙන් නතර වෙන්න එපා. අප එතුමා කරපු සේවය ඉදිරියට ගෙන යන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මහා දුකක් දැනුණු කාරණයක් තිබෙනවා. මම කේ.බී. රත්නායක මහත්මයාගේ රැස්වීමකට ගියා අවුරුදු ගණනකට ඉස්සර වෙලා. ඒ යන ගමන් වාහනය නතර කළා හුරුල්ලේ වලව්ව ගාව. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ හදවත දාලා පිච්චිලා ගියා. පරම්පරා ගණනක් හිටපු, අද කෝටි ගණනකින්වත් හදන්න බැරි හුරුල්ලේ වලව්ව පුළුස්සලා දාලා ඒ කාලයේ හිටපු සිංහල ත්‍රස්තවාදීන්. බිත්තිවලින් බාගයයි ඉතිරි වෙලා තිබෙන්නේ. මම පැය භාගයක් එතැන හිටියා. ලෝවා මහා ප්‍රාසාදයේ දකින්න තිබෙන නටඹුන් තත්ත්වයේයි එය තිබුණේ. මේකද කළේ හුරුල්ලේ මහත්මයාගේ පරම්පරා රාශියක් බිහි කරපු ඒ උතුම් වලව්වට? ඒක මිනිසකුගේ වලව්වක් නොවෙයි. ඒක රාජධානියක අගනුවරක් වාගෙයි එතැනට ගියාම දකින්න තිබෙන්නේ. මට මෑතකදී එතැනට යන්න බැරි වුණා. ආයෙත් ඒ පැත්තේ ගියොත් මම නැවත යනවා මොකක්ද එහි තත්ත්වය කියලා බලන්න. ජාතියේ ඇස් දෙක විවෘත කරලා රට පුබුදු කරපු මිනිසකුගේ, ශ්‍රේෂ්ඨ පුද්ගලයකුගේ මුල් ගෙදරට -මහ ගෙදරට- යම්කිසි පුද්ගලයන් පිරිසක් දීපු තෑග්ග ඒකයි. ඒ වාගේ වේදනාසහගත දර්ශනයක් මගේ ජීවිතයේ අද දක්වා දැක නැහැ. අපි ඒවා අමතක කරමු.

ගඩොල්වලින් නොවෙයි මිනිසුන් හැදෙන්නේ. පරම්පරාවක් හැදෙන්නේ ගඩොල්වලින්, යකඩවලින් නොවෙයි. පුතුන්ගෙන් සහ දූවරුන්ගෙන්. ඒ නිසා අද මහා අභියෝගයක් තිබෙනවා. අපි ගරු හුරුල්ලේ මැතිතුමාට ගරු කරන අතරම හුරුල්ලේ පවුලේ ඉන්න දරුවන්ටත් අභියෝගයක් තිබෙන වග මතක් කරනවා. ඒ ළමයින් තම පියා නතර කරපු තැන ඉඳලා බඹ හතරක් පහක් ඉස්සරහට යන්න ලැස්තිද; නැද්ද? ඒ අය කාර්ය ශූරද; නැද්ද? බුද්ධිමත්ද; නැද්ද? ඒ අය රජ රට ඉතිහාසය ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ උරුමය හදවතේ රෝපණය කරලා තිබෙනවාද; නැද්ද? ආං ඒ ප්‍රශ්න තමයි ගරු හුරුල්ලේ මැතිතුමා සිහිපත් කරන වෙලාවේ මා හුරුල්ලේ පරම්පරාවේ නවක මහත්වරුන්ගෙන් සාමාජිකයන්ගෙන් අභියෝග කරලා අසා සිටින්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මීට වඩා කථා කරන්නේ නැහැ. ගරු ඊ.එල්.බී. හුරුල්ලේ මැතිතුමා ශ්‍රේෂ්ඨ පුද්ගලයෙක්. අපට කලාතුරකින් දකින්න හම්බ වෙන රජ රටට ආභරණයක් වූ පුද්ගලයෙක්. එතුමා අද නැහැ. එතුමාට නිවන් සැප ලැබේවායි මම මගේ හදවතින්ම ප්‍රාර්ථනා කරනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
**(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)**
(The Presiding Member)

Order, please! හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ඊ.එල්.බී. හුරුල්ලේ මහතාගේ අභාවය පිළිබඳව පාර්ලිමේන්තුවේ දෙපාර්ශ්වය විසින්ම කරන ලද ශෝක යෝජනා අනුමත කරමින් පළ කරන ලද එම ශෝක වදන් මාද අනුමත කිරීමට කැමැත්තෙමි. අද දින රැස්වීමට අදාළ නිල වාර්තාවේ පිටපත් ශෝකයට පත් පවුලේ අය වෙත යවන මෙන් පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයාට මම නියෝග කරමි.

# පාර්ලිමේන්තුවේ රැස්වීම්
## பாராளுமன்ற அமர்வு
## SITTINGS OF THE PARLIAMENT

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா - நீர்ப்பாசன, நீர்வள முகாமைத்துவ அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Nimal Siripala de Silva - Minister of Irrigation and Water Resources Management and Leader of the House of Parliament)

I move,

"That notwithstanding the provisions of Standing Order No. 7 and the motion agreed to by Parliament on 09.07.2010, the hours of sitting on 22.07.2011 shall be 1.30 p.m. to 7.00 p.m.. At 4.30 p.m. Standing Order 7(5) shall operate."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

# අනුරාධපුර ශ්‍රී පුෂ්පදාන සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත
## அநுராதபுரம் ஸ்ரீ புஷ்பதான அபிவிருத்தி மன்றம் (கூட்டிணைத்தல்) சட்டமூலம்
## ANURADHAPURA SRI PUSHPADANA DEVELOPMENT FOUNDATION (INCORPORATION) BILL

***පනත් කෙටුම්පත (ස්ථාවර කාරක සභාවේදී) සංශෝධනය කළ ආකාරයෙන් සලකා බැලීමේ නියෝගය කියවන ලදී.***
*[நிலைக் குழுவில்] திருத்தப்பட்டவாறு, சட்டமூலத்தைப் பரிசீலித்தற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*Order for consideration of Bill, as amended (in the Standing Committee), read.*

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
I move,

"That the Report of the Standing Committee 'A' on the Anuradhapura Sri Pushpadana Development Foundation (Incorporation) Bill be accepted".

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
I move,

"That the Bill, as amended, be now read the Third time."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව සංශෝධිතාකාරයෙන්, තුන්වන වර කියවා සම්මත කරන ලදී.***
*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் திருத்தப்பட்டவாறு மூன்றாம் முறையாக மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.*
*Question put, and agreed to.*
*Bill, as amended, accordingly read the Third time, and passed.*

# පහලගම ශ්‍රී සෝමරතන නාහිමි පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත
## பஹலகம சிறீ சோமரத்தன நாயக்க தேரர் மன்றம் (கூட்டிணைத்தல்) சட்டமூலம்
## PAHALAGAMA SRI SOMARATHANA NAYAKA THERO FOUNDATION (INCORPORATION) BILL

***පනත් කෙටුම්පත (ස්ථාවර කාරක සභාවේදී) සංශෝධනය කළ ආකාරයෙන් සලකා බැලීමේ නියෝගය කියවන ලදී.***
*[நிலைக் குழுவில்] திருத்தப்பட்டவாறு, சட்டமூலத்தைப் பரிசீலித்தற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*Order for consideration of Bill, as amended (in the Standing Committee), read.*

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
I move,

"That the Report of the Standing Committee 'A' on the Pahalagama Sri Somarathana Nayaka Thero Foundation (Incorporation) Bill be accepted".

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
I move,

"That the Bill, as amended, be now read the Third time."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව සංශෝධිතාකාරයෙන්, තුන්වන වර කියවා සම්මත කරන ලදී.***
*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் திருத்தப்பட்டவாறு மூன்றாம் முறையாக மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.*
*Question put, and agreed to.*
*Bill, as amended, accordingly read the Third time, and passed.*

## ලෙස්ටර් ජේම්ස් පීරිස් සහ සුමිත්‍රා පීරිස් පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත
## லெஸ்டர் ஜேம்ஸ் பீரிஸ் மற்றும் சுமித்ரா பீரிஸ் மன்றம் (கூட்டிணைத்தல்) சட்டமூலம்
## LESTER JAMES PERIES AND SUMITRA PERIES FOUNDATION (INCORPORATION) BILL

***පනත් කෙටුම්පත (ස්ථාවර කාරක සභාවෙහිදී) සංශෝධනය කළ ආකාරයෙන් සලකා බැලීමේ නියෝගය කියවන ලදී.***

*[நிலைக் குழுவில்] திருத்தப்பட்டவாறு, சட்டமூலத்தைப் பரிசீலித் தற்கான கட்டளை வாசிக்கப்பட்டது.*

*Order for consideration of Bill, as amended (in the Standing Committee), read.*

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
I move,

"That the Report of the Standing Committee 'A' on the Lester James Peries and Sumitra Peries Foundation (Incorporation) Bill be accepted."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
I move,

"That the Bill, as amended, be now read the Third time."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව සංශෝධිතාකාරයෙන්, තුන්වන වර කියවා සම්මත කරන ලදී.***
*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் திருத்தப்பட்டவாறு மூன்றாம்முறையாக மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.*
*Question put, and agreed to.*
*Bill, as amended, accordingly read the Third time, and passed.*

## ඔලගංගල මහා සුදර්ශන පරෝපකාරී පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත
## ஒலகங்கல மஹா சுதர்ஷன பரோபகாரி மன்றம் (கூட்டிணைத்தல்) சட்டமூலம்
## OLAGANGALA MAHA SUDARSHANA PAROPAKARI FOUNDATION (INCORPORATION) BILL

***පනත් කෙටුම්පත (ස්ථාවර කාරක සභාවෙහිදී) සංශෝධනය කළආකාරයෙන් සලකා බැලීමේ නියෝගය කියවන ලදී.***

*[நிலைக் குழுவில்] திருத்தப்பட்டவாறு, சட்டமூலத்தைப் பரிசீலித் தற்கான கட்டளை வாசிக்கப்பட்டது.*

*Order for consideration of Bill, as amended (in the Standing Committee), read.*

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
I move,

"That the Report of the Standing Committee "A" on the Olagangala Maha Sudarshana Paropakari Foundation (Incorporation) Bill be accepted."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
I move,

"That the Bill, as amended, be now read the Third time."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව සංශෝධිතාකාරයෙන්, තුන් වන වර කියවා සම්මත කරන ලදී.***
*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் திருத்தப்பட்டவாறு மூன்றாம் முறையாக மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.*
*Question put, and agreed to.*
*Bill, as amended, accordingly read the Third time, and passed.*

## රාමක්‍රිෂ්ණ සාරදා දූත මෙහෙවර (ලංකා ශාඛාව) (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත
## இராமகிருஷ்ண சாரதா மிஷன் (இலங்கைக்கிளை) (கூட்டிணைத்தல்) சட்டமூலம்
## RAMAKRISHNA SARADA MISSION (LANKA BRANCH) (INCORPORATION) BILL

***දෙවන වර කියවීමේ නියෝගය කියවන ලදී.***
*இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*Order for Second Reading read.*

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
I move,

"That the Bill be now read a Second time."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවන වර කියවන ලදින්, 48(3) වන ස්ථාවර නියෝගය යටතේ, මූලාසනාරූඪ මන්ත්‍රීතුමා විසින් එය "බී" ස්ථාවර කාරක සභාවට පවරන ලදී.***

*இதன்படி சட்டமூலம், இரண்டாம் முறை மதிப்பிடப்பட்டு நிலைக் கட்டளை 48 (3) இன்படி நிலைக்குழு "பி"க்கு தலைமைதாங்கும் உறுப்பினர் அவர்களால் சாட்டப்பட்டது.*

*Bill accordingly read a Second time, and allocated by MR.PRESIDING MEMBER to Standing Committee "B" under Standing Order 48(3).*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 4.45 ට, 2011 ජුලි 22 වන සිකුරාදා අ. භා. 1.30 වන තෙක් කල් ගියේය.***
*அதன்படி பி. ப. 4.45 மணிக்கு பாராளுமன்றம், 2011 யூலை 22, வெள்ளிக்கிழமை பி. ப. 1.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*
*Adjourned accordingly at 4.45 p.m. until 1.30 p.m. on Friday, 22nd July, 2011.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

குறிப்பு

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to be Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts**
**Received from Parliament :**

**Printed copies dispatched :**

දායක මුදල් : පාර්ලිමේන්තු විවාද වාර්තාවල වාර්ෂික දායක මිල රු. 2178කි. පිටපතක් ගෙන්වා ගැනීම අවශ්‍ය නම් ගාස්තුව රු. 18.15කි. තැපැල් ගාස්තුව රු. 2.50කි. කොළඹ 6, කිරුළපන, පාමංකඩ පාර, අංක 102, පියසිරි ගොඩනැගිල්ලේ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම නොවැම්බර් 30 දාට ප්‍රථම දායක මුදල් ගෙවා ඉදිරි වර්ෂයේ දායකත්වය ලබා ගෙන විවාද වාර්තා ලබාගත හැකිය. නියමිත දිනෙන් පසුව එවනු ලබන දායක ඉල්ලුම් පත් භාර ගනු නොලැබේ.

**சந்தா** ; ஹன்சாட் அதிகார அறிக்கையின் வருடாந்த சந்தா ரூபா 2,178. ஹன்சாட் தனிப்பிரதி ரூபா 18.15. தபாற் செலவு ரூபா 2.50. வருடாந்த சந்தா முற்பணமாக **அத்தியட்சகர், அரசாங்க வெளியீட்டலுவலகம், இல. 102, பியசிறி கட்டிடம், பாமன்கடை வீதி, கிருளப்பனை, கொழும்பு 6** என்ற விலாசத்திற்கு அனுப்பி பிரதிகளைப் பெற்றுக்கொள்ளலாம். ஒவ்வோராண்டும் நவம்பர் 30 ஆந் தேதிக்கு முன் சந்தாப்பணம் அனுப்பப்பட வேண்டும். பிந்திக் கிடைக்கும் சந்தா விண்ணப்பங்கள் ஏற்றுக்கொள்ளப்படமாட்டா.

**Subscriptions :** The annual subscription for Official Report of Hansard is Rs. 2,178. A single copy of Hansard is available for Rs. 18.15. (Postage Rs. 2.50) Copies can be obtained by remitting in advance an annual subscription fee to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, No. 102,Piyasiri Building, Pamankada Road, Kirulapone, Colombo 6. The fee should reach him on or before November 30 each year . Late applications for subscriptions will not be accepted.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.